123706

සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති ඒකකයන් හි ප්‍රගතිය හා බලපෑම පිළිබඳ අධ්‍යයනය

එම්.ඩී. සුසිලා ලූර්දු
එස්. ඇපාසිංහ
සාගරිකා හිටිහාමු

HARTI

23739

තැ.පෙ. 1522
කොළඹ,
ශ්‍රී ලංකාව.

දු.අ. 94112696981
94112696437
ෆැක්ස් 94112692423.

විද්‍යුත් තැපැල් :library@harti.lk
වෙබ් : www.harti.lk

ISBN 978-955-612-123-0
9 789556 121230

රු. 200/=

631.008.4:
004.7
(SL)
HEC

සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති ඒකකයන් හි ප්‍රගතිය හා බලපෑම පිළිබඳ අධ්‍යයනය

එම්.ඩී. සුසිලා ලූර්දු
එස්. ඇපාසිංහ
සාගරිකා හිටිහාමු

HARTI 11147

සිංහල පර්යේෂණ වාර්තා : අංක 46 2011 ඔක්තෝබර්

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත,
කොළඹ – 07.

23739
23739

ප්‍රථම මුද්‍රණය : 2011 ඔක්තෝබර්

© හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

සියලුම හිමිකම් ඇවිරිණි

ISBN : 978-955-612-123-0

පරිගණක ගතකිරීම : ඒ.පී. උදේනි කරුණාරත්න

පිටු සැකසුම හා කවර නිර්මාණය : ඒ.පී. උදේනි කරුණාරත්න

පෙරවදන

ග්‍රාමීය කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය කාර්යක්ෂම කරවීමේ කාර්යය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දුන් නව ප්‍රවේශයක් ලෙසින් සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති ඒකක හඳුනාගත හැකි ය.

නවීන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපාංග භාවිතා කරමින් ග්‍රාමීය ගොවීන් වෙත කෘෂිකාර්මික දැනුම හා තොරතුරු ලබාදීම මෙම ඒකකයන් ස්ථාපිත කිරීමේ අරමුණ වන අතර, මෙම ඒකකයන් හි ක්‍රියාකාරීත්වය හා වර්තමාන ප්‍රගතිය පිළිබඳව අධ්‍යයනය කර ගොවීන්ට එහි ඇති ප්‍රයෝජනවත්භාවය, ක්‍රියාකාරීත්වයේ දී පවතින ගැටළු සහ වඩාත් සාර්ථක ලෙස එම ඒකක සකස් විය යුත්තේ කෙසේ ද යන්න පිළිබඳ ගොවීන්ගේ අදහස් විමසා බැලීමක් මෙම පර්යේෂණය තුළින් සිදු කර ඇත.

අධ්‍යයන දත්ත තුළින් හෙළිදරව් වන පරිදි, ග්‍රාමීය ගොවීන්ට දැනුම හා තොරතුරු කඩිනමින් ලබා ගැනීමේ පහසුව ඇති කිරීම සඳහා සයිබර් ඒකක පිහිටුවීමේ සංකල්පය ඉතා සාර්ථක ප්‍රයත්නයක් වන නමුත් මෙම ඒකක ක්‍රියාත්මක කිරීමේ දී, ඒකකයන් පිළිබඳ ගොවීන්ට පැවති අඩු දැනුවත්භාවය සහ පරිපාලනමය වශයෙන් පවතින ගැටළුකාරී තත්ත්වයන් සයිබර් ඒකක සාර්ථකව ක්‍රියාත්මක කරගෙන යෑමට අපහසුකාරී වාතාවරණයක් උදා කර ඇත.

කෙසේ වුව ද, වර්තමානයේ සියලු ආර්ථික ක්‍රියාකාරකම් තොරතුරු හා දැනුම මත පදනම් ව සිදු කෙරෙන බැවින් සයිබර් ඒකක යනු, ග්‍රාමීය කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ කඩිනම් තොරතුරු හා දැනුම සැපයීමේ කාර්යභාරය පහසු කරගැනීම සඳහා ක්‍රමානුකූල පරිපාලනයක් සහිතව එහි ප්‍රයෝජනවත්භාවය පිළිබඳ ගොවීන් දැනුවත් කිරීම හරහා නව ආකාරයකින් සකස් විය යුතු ස්ථානයක් බව අධ්‍යයනය පැහැදිලි කරනු ලබයි. එසේ ම ගොවීන්ට වඩාත් පහසු හා හිතකර අයුරින් ඒකකය සකස් වීම සඳහා, ඒකකයන් පිළිබඳ ගොවීන් අතර පුළුල් දැනුවත් කිරීමක් සිදු කර අවශ්‍ය යටිතල පහසුකම් සැපයීමත් එහි නඩත්තු කටයුතු ක්‍රමානුකූලව සිදු කිරීමත් ඒකකයට වෙන් වූ නිලධාරියෙකු පත් කිරීමත් කළ යුතු බව අධ්‍යයනය විසින් නිර්දේශ කරනු ලබයි. දේශීය කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ප්‍රගමනය අරමුණු කරගත් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා මෙම අධ්‍යයන වාර්තාවේ හි අන්තර්ගතය මනා පිටුවහලක් සපයනු ඇතැයි මම උදක් ම අපේක්ෂා කරමි.

නීතිඥ ලලිත් කාන්ත ජයසේකර
අධ්‍යක්ෂ

ස්තුතිය

මෙවැනි අධ්‍යයනයක් සිදු කිරීමේ කාලීන අවශ්‍යතාව හඳුනාගෙන ඒ සඳහා අවැසි මූල්‍ය හා ආයතනික ප්‍රතිපාදනයන් සපයා දුන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ හිටපු අධ්‍යක්ෂ, මහාචාර්ය රංජිත් ප්‍රේමලාල් ද සිල්වා මහතාටත්, මෙම අධ්‍යයනයේ වටිනාකම හඳුනාගනිමින් එය ඉතා කඩිනම්ව නිම කිරීම සඳහා අප උනන්දු කළ වත්මන් අධ්‍යක්ෂ, නීතිඥ ලලිත් කාන්ත ජයසේකර මහතාටත් අපගේ හෘදයාංගම ස්තුතිය පුද කෙරේ. පර්යේෂණය ආරම්භයේ සිට එය ප්‍රකාශනයක් ලෙසින් එළිදැක්වීම දක්වා වූ කාලය තුළ ඊට අවැසි මාර්ගෝපදේශකත්වය මෙන් ම පරිපාලනමය පහසුකිරීම් සපයමින් අප දිරිමත් කළ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) ආචාර්ය එල්.පී. රූපසේන මහතාටත්, තම කාලය මිඩංගු කරමින් නිරන්තරව අවශ්‍ය උපදෙස් හා සහයෝගය ලබාදුන් කෘෂිකාර්මික ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයුම් අංශයේ අංශ ප්‍රධාන, අධි පර්යේෂක, ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මහතාටත් ස්තුතිය පිරිනැමීමට මෙය අවස්ථාවක් කොට ගැනේ.

සමීක්ෂණ කටයුතු සිදු කිරීමේදීත් වාර්තාව රචනය කෙරෙන අවස්ථාවන්හිදීත් විෂයානුබද්ධ දැනුම සපයමින් අප හට සහාය දැක් වූ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිණී පී.ආර්. වීරක්කොඩි මහත්මිය ද ස්තුති පූර්වකව සිහිපත් කෙරේ.

කොළඹ විශ්ව විද්‍යාලයේ, ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය ඩබ්. විමලරතන හිමියන් විසින් අධ්‍යයනයේ අවසන් කෙටුම්පත ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා අදහස් හා යෝජනා ලබා දෙමින් දැක් වූ සහායට අපගේ කෘතඥතාවය හිමි වේ.

ක්ෂේත්‍ර සමීක්ෂණය සිදු කිරීමේ දී තම උපරිම දායකත්වය සැපයූ සංඛ්‍යාන නිලධාරිණී සන්ධ්‍යා සේනානායක මහත්මියට විශේෂ ස්තුතියක් පුද කෙරෙන අතර සංඛ්‍යාන සහකාර එන්.ඒ.කේ. ශාන්ත අනුරසිරි මහතාටත් තොරතුරු රැස් කිරීමෙහි නියැළුණු පර්යේෂණ සහකාරවරුන් වන දත්ත සැලසුම් අංශයේ එච්.පී. යසරත්න, එස්.ජේ.එස්. රෝසා, එන්. සොයිසා සහ කේ. රොඩ්රිගු යන මහත්ම මහත්මීන්ට ද අපගේ ස්තුතිය පිරිනැමේ.

දත්ත විශ්ලේෂණ කටයුතු සිදු කිරීමේ දී සහාය ලබාදුන් ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාන හා දත්ත විශ්ලේෂක එම්.එල්.ඩී. සෙනරත් මහතාටත්, නිරෝෂා ප්‍රේමවර්ධන මහත්මියටත් අපගේ විශේෂ ස්තුතිය පිරිනැමේ.

වාර්තාවේ පරිගණක කටයුතු සඳහා සහාය වූ පී.එම්. චිජිතා පද්මිණී, තරංගා ද සිල්වා, මනෝජා තුෂාරි යන මහත්මීන්ට ද අපගේ ස්තුතිය පිරිනැමේ. වාර්තාව ප්‍රකාශයට පත් කිරීමේ කටයුතු සිදු කළ ප්‍රකාශන ඒකකයේ ඒකක ප්‍රධාන, පුජිත ද මැල් මහතාටත් කළමනාකරණ සංස්කරණ කටයුතු සිදු කළ ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරිණී වත්සලා ගමගේ මහත්මියටත් වාර්තාව මුද්‍රණය කිරීමේ කටයුතු මැනවින් ඉටු කර දුන් මුද්‍රණ ඒකකයේ කාර්ය මණ්ඩලයටත් අපගේ ස්තුතිය පිරිනැමේ.

එම්.ඩී. සුසිලා ලුර්දු
එස්. ඇපාසිංහ
සාගරිකා හිටිහාමු

සංක්ෂේපය

ග්‍රාමීය කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය කාර්යක්ෂම ව සිදු කිරීමේ අරමුණින් නවීන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කොට ග්‍රාමීය ගොවීන් වෙත කෘෂිකාර්මික දැනුම හා තොරතුරු ලබාදීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් 2004 වර්ෂයේ දී "සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති ඒකක" ස්ථාපිත කිරීම ආරම්භ කෙරිණි. ග්‍රාමීය ගොවි ප්‍රජාවගේ තොරතුරු හා දැනුම පිළිබඳ ඌනතාවය මගහැර ඉතා කඩිනමින් තොරතුරු ලබා ගත හැකි ක්‍රමවේදයක් ලෙසින් කෘෂිකාර්මික ව්‍යාප්ති අංශයට එක් වූ මෙම නව ප්‍රවේශය පිළිබඳ ගොවි සමාජය තුළ පවතින ප්‍රතිචාරයන් කෙබඳු ද එසේ ම මෙම ඒකකයන් හරහා යට කී අරමුණු ඉටු වන්නේ ද යන්න පිළිබඳ පැහැදිලි අදහසක් නොමැති අතර, මෙම ඒකකයන් හි ක්‍රියාකාරීත්වය හා වර්තමාන ප්‍රගතිය පිළිබඳ විද්‍යාත්මක ප්‍රවේශයන් ඔස්සේ අධ්‍යයනය කිරීමේ අවශ්‍යතාවය මත දැනට ස්ථාපිත කර ඇති සයිබර් ව්‍යාප්ති ඒකකවලින් කෙතරම් ප්‍රමාණයක් සාර්ථකව පවත්වාගෙන යන්නේ ද? ඒකක පිළිබඳ ගොවීන්ගේ දැනුවත්භාවය, හා ගොවීන් එම ඒකක භාවිතා කරන්නේ ද එයින් ලබා ගන්නා දැනුම කෙතරම් ප්‍රයෝජනවත් ද යන කාරණා මෙන් ම සේවය ලබා ගැනීමේ දී ගොවීන් මුහුණ දෙන ගැටලු හා මෙම ඒකක සාර්ථක ලෙස පවත්වා ගැනීම සඳහා ගොවීන්ගේ යෝජනා පිළිබඳව අධ්‍යයනය කිරීම අධ්‍යයනයේ අරමුණු විය.

මෙම අධ්‍යයනය ප්‍රධාන වශයෙන් සයිබර් කෘෂිකාර්මික ඒකකයන් හි වර්තමාන ක්‍රියාකාරීත්වය හා ප්‍රගතිය හා සම්බන්ධ වන බැවින් සයිබර් ඒකකයන් ස්ථාපිත කර ඇති දිස්ත්‍රික්ක පිළිබඳ සැලකිලිමත් වෙමින් කෘෂිකාර්මික කටයුතු සඳහා ප්‍රමුඛත්වයක් ගන්නා දිස්ත්‍රික්ක 03 ක් (මහනුවර, හම්බන්තොට සහ අනුරාධපුරය) ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා තෝරා ගන්නා ලදී. බහු පියවර නියැදි ක්‍රමය අනුව නියැදිය තෝරා ගත් අතර අදාළ දිස්ත්‍රික්කයන් හි ස්ථාපිත සයිබර් ඒකක සංඛ්‍යාවෙන් අහඹු ලෙස තෝරාගත් සයිබර් ඒකක 09කට අදාළ ව සේවය ලබාගත් ගොවීන් 90ක් ද සේවය ලබා නො ගත් ගොවීන් 91ක් ද වශයෙන් 181ක් සමන්විත වූ ගොවි නියැදියක් වෙත ඉදිරිපත් කරන ලද ව්‍යුහගත ප්‍රශ්නාවලියක් භාවිතයෙන් අධ්‍යයනයට අවශ්‍ය ප්‍රාථමික දත්ත සපයා ගැනිණි. ඊට අමතර ව තෝරාගනු ලැබූ ඒකක 09 ට අදාළ වූ ඒකක භාර නිලධාරීන්ගෙන් ද ප්‍රාථමික දත්ත සපයා ගන්නා ලදී.

ද්විතියික දත්ත සඳහා සාහිත්‍ය විමර්ශනය හා ක්ෂේත්‍රයට අදාළ නිලධාරීන්ගෙන් සපයා ගත් තොරතුරු භාවිතා කරන ලදී. මීට පරිබාහිරව නියැදියට ඇතුළත් නො වන අනෙකුත් සියලු ම ඒකක භාර නිලධාරීන් වෙත තැපැල් මාර්ගිකව ඉදිරිපත් කරන ලද ප්‍රශ්නාවලියක් ආශ්‍රයෙන් සමස්ත ඒකක පිළිබඳ තොරතුරු සපයාගත් අතර තැපැල් මාර්ගිකව පිළිතුරු නො ලැබුණු ඒකකයන් වෙතින් දුරකථන මාර්ගයෙන් තොරතුරු ලබා ගන්නා ලදී.

අධ්‍යයනයෙන් හෙළි වූ කරුණුවලට අනුව සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති ඒකක හරහා සේවය ලබා නො ගත් ගොවීන්ගෙන් 58%ක් ගොවිජන සේවා මධ්‍යස්ථානයේ කෘෂිකර්ම උපදේශක කාර්යාලය තුළ මෙවැනි ඒකකයක් ස්ථාපිත කර ඇති බව නො දනී.

සයිබර් ඒකක භාර කෘෂිකර්ම උපදේශකවරයා විසින් ඒකකය තුළත්, ක්ෂේත්‍රය තුළත් ඒකකයට අයත් උපකරණ භාවිතා කරමින්, ගොවීන් සඳහා පුහුණු වැඩසටහන් සිදු කර ඇති අතර, ඒකක හරහා සේවය ලබා ගත් ගොවි නියැදියෙන් 69%ක් මෙම පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වී ඇත. එසේ දැනුම ලබාගත් ගොවීන්ට තම ගොවිතැන් කටයුතුවල ක්‍රමානුකූලව නියැළීමේ හැකියාව ලැබුණු බව ඔවුහු සඳහන් කළහ. එසේ ලබාගත් දැනුම විවිධ ක්ෂේත්‍රයන්ට අයත් වන අතර ගොවීන්ට වඩාත් ප්‍රයෝජනවත් වී ඇත්තේ පලතුරු වගාව සම්බන්ධ වූ දැනුම බව සේවය ලැබූ ගොවීන්ගෙන් 33%ක් සඳහන් කළහ.

දැනුම ලබා ගැනීම සඳහා සයිබර් ඒකකයට පැමිණෙන විට ඒකක භාර කෘෂිකර්ම උපදේශක මහතුන් ක්ෂේත්‍ර රාජකාරිවල නියුක්ත වී සිටීම ගොවීන්ගෙන් 51%කට ගැටලුවක් වී ඇත. ඒකක භාර නිලධාරීන්ගෙන් 86%ක් සඳහන් කළේ, සේවය ලබාදීමේ දී ඒකකය සඳහා පූර්ණකාලීනව වෙන් වූ නිලධාරියෙකු නොමැති වීම ගැටලුවක් බවත් ඒකකයෙ හි ක්‍රියාකාරීත්වය අසාර්ථක වීමට එය සෘජුව ම බලපාන බවත් ය. එසේ ම ඒකකය වෙත ලබා දී ඇති උපකරණ වරින්වර ක්‍රියාවිරහිත වීමත්, අලුත් වැඩියා කිරීම් සඳහා පැහැදිලි නඩත්තු ක්‍රමවේදයක් නොමැති වීමත් ගැටලුවක් බව සඳහන් විය.

ඒකකයන් හි සාර්ථක/අසාර්ථකභාවය පිළිබඳ අදහස් දැක් වූ ඒකක භාර නිලධාරීන්ගෙන් 64.6%කගේ ම මතය වූයේ මේවායෙ හි වර්තමාන ක්‍රියාකාරීත්වය අසාර්ථක බව යි. ඒකකය පිළිබඳ ගොවීන් තුළ පවතින අඩු දැනුවත්භාවය නිසා ගොවීන්ගේ සහභාගීත්වය අඩුවීමත් පරිපාලනමය දුෂ්කරතාත් මෙම අසාර්ථකත්වයට බලපෑ ප්‍රධාන හේතූන් බව අසාර්ථක යැයි සඳහන් කළ ඒකක භාර නිලධාරීන්ගෙන් 96.7%ක් සඳහන් කළහ.

අධ්‍යයනයේ සොයා ගැනීම් අනුව පෙනී යන්නේ, කෘෂිකාර්මික දැනුම හා තොරතුරු සන්නිවේදනයේ දී සයිබර් ඒකක ස්ථාපිත කිරීමේ සංකල්පය වඩාත් කාලීන වුවත් එය සාර්ථක නො වීමට ඒකක ක්‍රියාකාරීත්වයේ දී පැවති ගැටළු හා දුර්වලතාවයන් හේතු පාදක වී ඇති බව යි. සයිබර් ඒකකයන් පිළිබඳ ගොවීන්ගේ දැනුවත්භාවය වැඩිකර පරිපාලනමය ගැටලු අවම කර ඒකක සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම හරහා සයිබර් ඒකක සාර්ථකව ක්‍රියාත්මක කළ හැකි බව නිගමනය කළ හැකි ය. මේ සඳහා අධ්‍යයනය විසින් යෝජනා කිහිපයක් ඉදිරිපත් කෙරේ. එනම් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින්, ව්‍යාප්ති නිලධාරීන් මගින්, දැන්වීම්, පත්‍රිකා හා පෝස්ටර් මගින් හා ග්‍රාමීය ස්වේච්ඡා සංවිධාන හරහා සයිබර් ඒකක ගොවීන් අතර වඩාත් ජනප්‍රිය කරවීම, සයිබර් ඒකකය සඳහා ම වෙන් වූ කෘෂිකාර්මික හා පරිගණක දැනුම සහිත පුද්ගලයෙකු පත් කිරීම, නඩත්තු කටයුතු ක්‍රමානුකූලව සිදු කෙරෙන ආකාරයේ විධිමත් යාන්ත්‍රණයක් සකස් කිරීම සහ අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම හරහා ගොවියාට පහසුවෙන් පරිහරණය කළ හැකි මෙන් ම සමීප සබඳතාවයක් ගොඩනගා ගත හැකි මට්ටමේ ස්ථානයක් බවට මෙම ඒකකයන් සකස් කිරීම යනාදිය යි.

පටුන

පිටු අංකය

පෙරවදන iii
ස්තුතිය iv
සංක්ෂේපය v
පටුන vii
වගු සටහන් x
ප්‍රස්තාර සටහන් xi

පළමු පරිච්ඡේදය
හැඳින්වීම
1.1 අධ්‍යයනයේ පසුබිම 01
1.2 පර්යේෂණ ගැටලුව හා එහි වැදගත්කම 02
1.3 අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ 03
1.4 පර්යේෂණ ක්‍රමවේදය 03
1.5 අධ්‍යයනයේ සීමා 06
1.6 වාර්තාවේ සැකැස්ම 06

දෙවැනි පරිච්ඡේදය
සාහිත්‍ය විමර්ශනය
2.1 හැඳින්වීම 07
2.2 ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය 07
2.2.1 පුහුණු හා හමුවීම් ක්‍රමය 08
2.2.2 දෙවන කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා ව්‍යාපෘතිය 09
2.3 කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයේ මෑතකාලීන වෙනස් වීම් සහ නව ප්‍රවණතා 10
2.3.1 කෘෂිකාර්මික ව්‍යාප්ති වැඩසටහන් හි ප්‍රධාන අරමුණු සහ අපේක්ෂිත කාර්යභාරය 11
2.3.2 ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය උපයෝගී කරගැනීමේ වැදගත්කම 11
2.4 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය පිළිබඳ අනෙකුත් රටවල අත්දැකීම් 14
2.4.1 ග්‍රාමීය කෘෂිකාර්මික ක්ෂේත්‍රය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය 16
2.4.1.1 ඊ-ශ්‍රී ලංකා වැඩසටහන 16
2.4.1.2 අන්තර්ජාලය පදනම් කරගත් කෘෂි අධ්‍යාපන ක්‍රම 17
2.4.1.3 ගොවි සහන සරණ සේවාව (1920) 17
2.4.1.4 කෘෂි තාක්ෂණික උද්‍යාන 18
2.4.1.5 නව ගොවියා වැඩසටහන 18
2.4.1.6 කෙටි පණිවිඩ භාවිතයෙන් භාණ්ඩ වෙළෙඳාම සිදු කිරීම 19

LIBRARY

තෙවැනි පරිච්ඡේදය

සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති ඒකක

3.1	හැඳින්වීම	20
3.2	සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව	20
3.3	සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති ඒකක ස්ථාපිත කිරීම	20
3.3.1	පළමු අදියර	22
3.3.2	දෙවන අදියර	23
3.4	ඒකකය වෙත ලබා දී ඇති උපකරණ සහ නිලධාරීන්ට ලබා දී ඇති පරිගණක පුහුණුවීම්	25
3.5	ඒකක වෙත ලබා දී ඇති අන්තර් ක්‍රියාකාරී බහු මාධ්‍ය සී. ඩී. තැටි	26
3.6	සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති ඒකක අධීක්ෂණ කටයුතු ක්‍රියාත්මක වන ආකාරය	28
3.6.1	අධීක්ෂණය හා ඇගයීම පිළිබඳ වර්තමාන තත්ත්වය	29
3.7	සයිබර් ව්‍යාප්ති ඒකක පිළිබඳ ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	29

සිව් වැනි පරිච්ඡේදය

ප්‍රතිඵල හා සාකච්ඡා

අධ්‍යයනයට ලක් කළ ගොවීන්ගේ සමාජ, ආර්ථික පසුබිම

4.1	හැඳින්වීම	31
4.2	නියැදියේ සමාජ-ආර්ථික තොරතුරු	31
4.2.1	ස්ත්‍රී / පුරුෂ භාවය	31
4.2.2	ගොවීන්ගේ වයස් කාණ්ඩ	32
4.2.3	අධ්‍යාපනික තත්ත්වය	33
4.2.4	කෘෂිකර්මාන්තයේ යෙදුණු කාල පරාසය	34
4.2.5	ප්‍රධාන රැකියා මාර්ගය	34
4.2.6	කෘෂිකර්මාන්තයේ යෙදීමේ දී මුහුණ දෙන පොදු ගැටලු	35
4.2.7	කෘෂිකාර්මික ගැටලු පිළිබඳ දැනුවත් වූ ආකාරය (සයිබර් ඒකක හරහා සේවය ලැබීමට පෙර)	36
4.2.8	කෘෂිකර්මාන්තය පිළිබඳ ලැබූ පුහුණු වීම්	38

පස් වන පරිච්ඡේදය

සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති ඒකක පිළිබඳ ගොවීන්ගේ ප්‍රතිචාර

5.1	හැඳින්වීම	39
5.2	සයිබර් ව්‍යාප්ති ඒකක පිළිබඳ ගොවීන්ගේ දැනුවත්භාවය	39
5.3	සයිබර් ව්‍යාප්ති ඒකක හරහා සේවය ලැබූ ගොවීන්ගේ ප්‍රතිශතය	41
5.3.1	ඒකකයට ගොස් දැනුම හා උපදෙස් ලබා ගැනීම	41
5.3.2	ක්ෂේත්‍රයේ පැවැත් වූ වැඩසටහන්වලට සහභාගී වී දැනුම හා තොරතුරු ලබා ගැනීම	42
5.3.3	ඉහත දෙයාකාරය ම භාවිතාකර සේවය ලබා ගැනීම	42
5.4	ගොවීන් ලබා ඇති දැනුමේ ස්වභාවය හා එහි ප්‍රයෝජනවත්භාවය	42
5.4.1	ඒකක හරහා ලබාගත් සේවයෙ හි ප්‍රයෝජනවත්භාවය	44
5.5	සයිබර් ව්‍යාප්ති ඒකකවලින් සේවය ලබා ගැනීමේ දී ගොවීන් මුහුණ දෙන ගැටළු	45
5.6	සයිබර් ව්‍යාප්ති ඒකක ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ගොවීන්ගේ යෝජනා	47

හය වැනි පරිච්ඡේදය

සයිබර් ව්‍යාප්ති ඒකකයන් හි සාර්ථක / අසාර්ථකභාවය

6.1 හැඳින්වීම 49

6.2 සයිබර් ව්‍යාප්ති ඒකකයන් හි සාර්ථක අසාර්ථකභාවය පිළිබඳ ඒකක භාර නිලධාරීන්ගේ සමස්ත අදහස 49

6.2.1 ඒකකයන් හි සාර්ථක අසාර්ථකභාවය පිළිබඳ එක් එක් ක්‍රමවේදයන් යටතේ ඒකක භාර නිලධාරීන් දැක්වූ අදහස් 50

6.2.2 නියැදි සමීක්ෂණය මඟින් දත්ත ලබා ගැනීම 50

6.2.3 තැපැල් මාර්ගිකව දත්ත ලබා ගැනීම 51

6.2.4 දුරකථන සාකච්ඡා මාර්ගයෙන් දත්ත ලබා ගැනීම 52

6.3 සයිබර් ඒකක සාර්ථක යැයි සඳහන් කිරීමට හේතු වූ කරුණු 52

6.4 සාර්ථකව ක්‍රියාත්මක කෙරෙන සයිබර් ඒකක කිහිපයක නිරීක්ෂණය කළ විශේෂිත ක්‍රියාකාරකම් 53

6.5 සයිබර් ඒකක අසාර්ථක ව ක්‍රියාත්මක වීමට හේතු වූ කරුණු 54

6.6 ඒකකයන් හි සාර්ථක / අසාර්ථකභාවයට ඒකක භාර නිලධාරීන්ගේ දායකත්වය 56

6.7 ඒකකයන් හි සාර්ථක / අසාර්ථකභාවයට ශ්‍රව්‍ය-දෘශ්‍ය ඒකකයේ දායකත්වය 58

6.7.1 ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථානය මඟින් ඒකක භාර නිලධාරීන්ට ලබා දුන් පුහුණු වීම් සහ වර්තමාන තත්ත්වය 59

6.7.2 ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථාන මඟින් ඒකක වෙත ලබා දුන් උපකරණවල ක්‍රියාකාරීත්වය හා වර්තමාන තත්ත්වය 60

6.8 ග්‍රාමීය කෘෂි ව්‍යාප්තිය සඳහා සයිබර් ව්‍යාප්ති ඒකකයන් හි දායකත්වය 62

හත් වැනි පරිච්ඡේදය

නිගමන හා යෝජනා 64

ආශ්‍රිත ග්‍රන්ථ 69

වගු සටහන්

		පිටු අංකය
1.1	තෝරාගත් දිස්ත්‍රික්ක, ස්ථාපිත ඒකක සංඛ්‍යාව සහ තෝරාගනු ලැබූ ගොවි නියැදිය	05
3.1	ස්ථාපිත සයිබර් ඒකක, වර්ෂය හා අනුග්‍රහය සැපයූ සංවිධාන	21
3.2	දුරකථන හා අන්තර්ජාල පහසුකම් ලබාදුන් සයිබර් ඒකක	23
3.3	පුහුණුව ලැබූ නිලධාරීන් සංඛ්‍යාව සහ පුහුණුවීම් සංඛ්‍යාව	26
3.4	ශ්‍රව්‍ය දෘෂ්‍ය මධ්‍යස්ථානය විසින් නිෂ්පාදනය කරන ලද අන්තර් ක්‍රියාකාරී බහු මාධ්‍ය සී.ඩී. තැටි	27
3.5	වාර්ෂිකව නිෂ්පාදිත සී.ඩී. තැටි ප්‍රමාණයන්	28
4.1	ස්ත්‍රී පුරුෂ භාවය අනුව නියැදියේ ව්‍යාප්තිය	31
4.2	සයිබර් ඒකක තුළින් සේවය ලැබූ සහ නො ලැබූ ගොවීන්ගේ වයස් කාණ්ඩ අනුව ව්‍යාප්තිය	32
4.3	සේවය ලැබූ සහ නො ලැබූ ගොවීන්ගේ අධ්‍යාපනික මට්ටම	33
4.4	සේවය ලැබූ සහ නො ලැබූ ගොවීන් කෘෂිකර්මාන්තයේ යෙදී සිටි කාලය	34
4.5	සේවය ලැබූ සහ නො ලැබූ ගොවීන්ගේ ප්‍රධාන රැකියාව	35
4.6	සයිබර් ඒකක හරහා සේවය ලැබූ සහ නො ලැබූ ගොවීන්හට කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන් පවතින ගැටළු පිළිබඳ දැක් වූ ප්‍රතිචාර	36
4.7	ගොවීන් කෘෂිකාර්මික ගැටළු පිළිබඳ දැනුම ලබා ගන්නා ආකාරය (සයිබර් ඒකක හරහා සේවය ලැබීමට පෙර)	37
5.1	සයිබර් ව්‍යාප්ති ඒකක පිළිබඳ ගොවීන්ගේ දැනුවත්භාවය	39
5.2	ඒකකය හරහා සිදු කෙරෙන වැඩසටහන් හා ලබාගත හැකි සේවාවන් පිළිබඳ ගොවීන්ගේ දැනුවත්භාවය	40
5.3	සයිබර් ඒකක හරහා සේවය ලබා ගන්නා ගොවීන්ගේ ප්‍රතිශතය	41
5.4	ගොවීන්ට වඩාත් ප්‍රයෝජනවත් වූ සහ වැඩි නැඹුරුවක් දක්වා ඇති පුහුණු ක්ෂේත්‍රයන්	43
5.5	සයිබර් ව්‍යාප්ති ඒකකවලින් සේවය ලබා ගැනීමේ දී පවතින ගැටළු	45
5.6	ගොවීන්ට සයිබර් ඒකකයට ඇති දුර ප්‍රමාණය	46
5.7	සයිබර් ඒකක ඵලදායී ලෙස ක්‍රියාත්මක වීමට ගොවීන්ගේ යෝජනා	47
6.1	සාර්ථක/අසාර්ථකභාවය පිළිබඳ ඒකක භාර නිලධාරීන්ගේ සමස්ත ප්‍රතිචාරය	50
6.2	සයිබර් ඒකකවල සාර්ථක/අසාර්ථකභාවය පිළිබඳ නියැදියට අයත් නිලධාරීන්ගේ මතය	51
6.3	සයිබර් ඒකක සාර්ථක යැයි සඳහන් කිරීමට හේතු	52
6.4	සයිබර් ඒකක අසාර්ථක ව ක්‍රියාත්මක වීමට හේතු වූ කරුණු	54
6.5	සයිබර් ඒකක භාර නිලධාරීන්ගේ සේවා කාලය	57
6.6	උපකරණවල ක්‍රියාකාරීත්වය	61

ප්‍රස්තාර සටහන්

		පිටු අංකය
4.1	සේවය ලැබූ සහ නො ලැබූ ගොවීන්ගේ අධ්‍යාපනික මට්ටම	33
4.2	පුහුණුවක් ලැබූ සහ නො ලැබූ ගොවීන්	38
5.1	සයිබර් ඒකක පිළිබඳ ගොවීන්ගේ දැනුවත්භාවය	39
5.2	ඒකකය හරහා සිදු කෙරෙන වැඩසටහන් හා ලබා ගත හැකි සේවාවන් පිළිබඳ ගොවීන්ගේ දැනුවත්භාවය	40
5.3	ගොවීන්ට වඩාත් ප්‍රයෝජනවත් වූ සහ වැඩි නැඹුරුවක් දක්වා ඇති පුහුණු ක්ෂේත්‍රයන්	43
6.1	සයිබර් ඒකකවල සාර්ථක/අසාර්ථක භාවය පිළිබඳ ඒකක භාර නිලධාරීන්ගේ සමස්ත ප්‍රතිචාරය	50
6.2	සයිබර් ඒකකවල සාර්ථක/අසාර්ථකභාවය පිළිබඳ නියැදියට අයත් නිලධාරීන්ගේ මතය	51
6.3	සයිබර් ඒකකවල සාර්ථක/අසාර්ථකභාවය පිළිබඳ තැපැල් මාර්ගිකව ලැබුණු ප්‍රතිචාර	51
6.4	සයිබර් ඒකකවල සාර්ථක/අසාර්ථකභාවය පිළිබඳ දුරකථන සාකච්ඡා මාර්ගයෙන් ලැබුණු ප්‍රතිචාර	52
6.5	සයිබර් ඒකක භාර නිලධාරීන්ගේ සේවා කාලය	58

පළමු පරිච්ඡේදය
හැඳින්වීම

1.1 අධ්‍යයනයේ පසුබිම

බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල සේ ම ශ්‍රී ලංකාවේ ද ආර්ථිකයෙ හි මූලික ස්ථානයක් කෘෂිකර්මාන්තයට හිමි වන නමුත් දළ දේශීය නිෂ්පාදිතයට එහි ඇති දායකත්වය සාපේක්ෂ ව පහළ මට්ටමක පවතී. එය 2010 වර්ෂයේ දී 11%ක් ලෙස වාර්තා වී ඇත. මිලියන 20ක් පමණ වන රටේ ජනගහනයෙන් 32.7%ක් සෘජු ව හෝ වක්‍ර ව කෘෂිකාර්මික කටයුතුවල නියැළෙති (මහ බැංකු වාර්තා, 2010). මුළු ජනගහනයෙන් 80%ක් ම වාසය කරන්නේ ග්‍රාමීය ප්‍රදේශවල වන අතර ඔවුන්ගෙන් වැඩි ප්‍රමාණයක්, එනම් 70%ක් පමණ තම ජීවන මාර්ගය ලෙස සෘජුව ම හෝ වක්‍ර ව කෘෂිකර්මාන්තය පදනම් කරගත් කාර්යයන් හි නියුතුව සිටිති. වර්තමානයේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය අභියෝග රැසකට මුහුණ දී සිටී. එනම් අක්‍රමවත් දේශගුණික විපර්යාසයන් හේතුවෙන් හට ගන්නා කාලගුණික වෙනස්වීම්, කෘෂිකාර්මික ඉඩම්වල ඵලදායිතාව හීනවීම, ශ්‍රමය හා යෙදවුම් පිළිබඳ ගැටලු, රාජ්‍ය ප්‍රතිපත්තිවල චිචලතා හා මූල්‍යමය ගැටලු, නාගරීකරණය හේතුවෙන් පැන නැගී ඇති ගැටලු ය. එසේ ම ගෝලීයකරණයේ ප්‍රතිඵලයන් ලෙසින් ලෝක වෙළෙඳපොළ තුළට ගලා එන භාණ්ඩ වැඩිවත් ම රටතුළ තරගකාරී මිල ගණන් යටතේ ආනයනික භාණ්ඩවල සුලභතාවය ද වැඩි ව ඇත. ඒ හා සමගාමීව පාරිභෝගිකයින් ද ඉතා බුද්ධිමත් ලෙස වෙළෙඳපොළ තුළ හැසිරීමේ ප්‍රතිඵලයක් ලෙසින් වඩාත් ඉහළ මට්ටමේ ගුණාත්මයක් සහිත භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ අභියෝගයකට ගොවීන්ට මුහුණ දීමට සිදු වේ. එසේ නො වන විට විවෘත ආර්ථිකයත් සමග ඇති වන සාධනීය තත්ත්වයක් වෙත ග්‍රාමීය ගොවීන්ට ප්‍රවේශ වීමේ හැකියාව ද අහිමි වී යයි. කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ පවතින මෙවැනි ගැටලු සඳහා පිළියම් සෙවීමේ දී කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය හරහා කළ හැකි කාර්ය භාරය ඉමහත් ය. දශක ගණනාවක් පුරා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය හරහා ගොවීන් වෙත ප්‍රබල ලෙස සමීප වූ අතර 1980 දශකයෙන් පසුව රට තුළ සිදු වූ දේශපාලනික හා පරිපාලනමය වෙනස්වීම් හේතු කොට ගෙන සමස්ත ව්‍යාප්ති සේවා පද්ධතිය පුරා ම විශාල හිඩැසක් ඇති විය. පර්යේෂණ සොයා ගැනීම් හරහා ජනනය වන දැනුම, සැලසුම් සකස් කරන්නන් හා ඒවා ක්‍රියාකරවන්නන් මෙන් ම ගොවීන් වෙත ප්‍රවේශකර වීමේ ක්‍රියාවලියත්, වෙළෙඳුන් හා ගොවීන් අතර සිදු වූ තොරතුරු ගලා යෑමේ විධිමත් ක්‍රමයත් අඩපණ තත්ත්වයකට පත් විය (Wijekoon and Rizwan, 2009). මේ හේතුවෙන් අදාළ සංවිධාන තුළ හා අනෙකුත් සංවිධාන අතරත්, ව්‍යාප්ති සේවය, පර්යේෂණ, පුහුණු හා සේවා සැපයීමේ අංශයන් (අලෙවි ජාලයන් සහ මූල්‍යමය සංවිධාන) අතරත් පැවති සම්බන්ධතාවය දුර්වල විය. මෙහි අවසන් ප්‍රතිඵලය වූයේ, ඵලදායී පර්යේෂණ පුහුණු හා ව්‍යාප්ති සේවාවන් අවුල් සහගත තත්ත්වයකට පත් වී ග්‍රාමීය ගොවි ප්‍රජාව අසරණ අඩියකට ඇද වැටීම යි.

මෙම තත්ත්වයට පිළියම් සෙවීමේ ක්‍රමෝපායයන් ලෙස, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ඉලෙක්ට්‍රොනික මෙවලම් භාවිතා කරමින් ගොවියා වෙත තොරතුරු මාර්ගයෙන් සමීප වීමේ වැඩපිළිවෙළක් වෙත අවධානය යොමු කරන ලදි. මෙහි දී ඉලෙක්ට්‍රොනික සන්නිවේදනය භාවිතා කරමින් ග්‍රාමීය ගොවි ප්‍රජාව වෙත කෘෂිකාර්මික දැනුම හා තොරතුරු සැපයීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදි. එනම්, තෝරාගත් ගොවිජන සේවා මධ්‍යස්ථානවල කෘෂිකර්ම උපදේශක කාර්යාලවලට පරිගණකයක්, මුද්‍රණ යන්ත්‍රයක්, මධ්‍යම සැකසුම්

ඒකකයක්, අනුලක්ෂණ කැමරාව, සුපරීක්ෂකය, දුරකථනයක් සහ අන්තර්ජාල පහසුකම් ලබා දී ග්‍රාමීය ගොවීන්ට තොරතුරු හා දැනුම ලබාගත හැකි ඒකකයක් ග්‍රාමීය මට්ටමේ දී ස්ථාපිත කිරීම යි. එම ඒකකය සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති ඒකකය නමින් නම් කර ඇත. බිම් සැකසීමේ සිට අස්වනු නෙළන අවස්ථාව දක්වාත්, අනතුරු ව අලෙවිය දක්වාත් වූ කාල පරාසය තුළ ගොවි ප්‍රජාවට අවශ්‍ය තොරතුරු හා නව තාක්ෂණය වෙත ඵලදායක හා කාර්යක්ෂම ලෙස ප්‍රවේශ වීමේ හැකියාව වර්ධනය කිරීම හරහා සමස්ත කෘෂිකර්මාන්තයේ ප්‍රවර්ධනය ඇති කිරීම කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය තුළින් අපේක්ෂා කෙරෙන අතර, එම අපේක්ෂිත කාර්යභාරය ග්‍රාමීය මට්ටමේ දී සාර්ථකත්වයට පත් කරගැනීමට පිටුවහලක් සපයා ගැනීම සඳහා මෙම සයිබර් ඒකක (cyber unit) පිහිටුවීමේ සංකල්පය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථානය විසින් හඳුන්වා දී ඇත. සයිබර් ව්‍යාප්ති ඒකක ස්ථාපිත කිරීම හරහා ග්‍රාමීය ගොවීන්ට තොරතුරු හා නව දැනුම කාර්යක්ෂම ව හා කඩිනම්ව ලබා දීමේ මෙම වැඩසටහන 2004 වර්ෂයේ දී ආරම්භ කරන ලදී, එහි දී ශ්‍රව්‍ය – දෘශ්‍ය මධ්‍යස්ථානය ප්‍රධාන මධ්‍යස්ථානය වූ අතර කාප් ආයතනය (Council of Agricultural Research Policy - CARP), ධාන්‍යාගාර වැඩසටහන (Granary Area Project- GAP), ජාත්‍යන්තර සහල් පර්යේෂණ ආයතනය (International Rice Research Institute - IRRI), ජයිකා (Japan International Cooperation Agency - JAICA), වර්ල්ඩ් විෂන් (World Vision) වැනි ආයතනයන් මූල්‍ය දායකත්වය සපයා දී ඇත.

ග්‍රාමීය අංශය තුළ ව්‍යාප්ති සේවයේ හි පවතින අකාර්යක්ෂමභාවය අවම කිරීමට සහාය වීම සඳහා ස්ථාපිත මෙම ඒකකයන් හි වර්තමාන ක්‍රියාකාරිත්වය හා එහි ප්‍රගතිය පිළිබඳ ජාතික මට්ටමින් ද සාකච්ඡාවට ලක් වී ඇති අතර "මහින්ද චින්තනය" තුළ ද තොරතුරු තාක්ෂණය හරහා කෘෂිකාර්මික තොරතුරු හුවමාරු කර ගැනීමේ ජාතික ක්‍රමවේදයන් පිළිබඳ සඳහන් වී ඇත (Mahinda Chinthanaya: A Vision for the Future Presidential Election, 2010).

1.2 පර්යේෂණ ගැටලුව හා එහි වැදගත්කම

කෘෂිකාර්මික සංවර්ධනයේ දී සමාජය තුළ ජනමාධ්‍ය හරහා සිදු කෙරෙනුයේ ප්‍රබල කාර්යභාරයකි. කෘෂිකාර්මික සංවර්ධනයෙ හි ලා මෙම මාධ්‍යයන් හි මූලික කාර්යභාරයක් වන්නේ, කෘෂි ආර්ථික තත්ත්වයන්, දේශීය හා විදේශ වෙළෙඳපොළ අවස්ථාවන්, කෘෂි අංශයේ ප්‍රවර්ධනයන් හා පසුබෑම්, කෘෂිකර්මාන්තය පිළිබඳ නවතාවයන් හා පර්යේෂණ සොයා ගැනීම්, කෘෂි ව්‍යවසායන් පිළිබඳ වාසිදායක තත්ත්වයන් හා එහි ප්‍රවර්ධනයන්, නිෂ්පාදන මිල ගණන්, රාජ්‍ය ප්‍රතිපත්තිවල බලපෑම්, ස්වාභාවික උපද්‍රව මෙන් ම සංස්කෘතික හා ජනවාර්ගික පසුබිම හා කෘෂිකර්මාන්තය, එහි ඇති සබඳතාවන් යන සියලු අංශයන් පිළිබඳ නිවැරදි හා විශ්වසනීයත්වයෙන් යුතු තොරතුරු සපයා දීම යි. වර්තමානයේ දී මෙම ජනමාධ්‍යයන් කරා ප්‍රවේශ වූ නවතම මෙවලම මෙන් ම ඉතාමත් ප්‍රබල ව සහ ක්ෂණික ව තොරතුරු ගලා යෑමේ මාර්ගය බවට අන්තර්ජාලය පත් වී ඇති අතර, එය සමස්ත විශ්වය පුරා ම විහිදුණු සම්බන්ධතා ජාලයකින් සමන්විත වේ. ඒ අනුව ගොවි ප්‍රජාව වෙත කෘෂිකාර්මික තොරතුරු ක්ෂණිකව සැපයීමේ නවතම ක්‍රමවේදයක් ලෙසින් ඉලෙක්ට්‍රොනික සන්නිවේදන මෙවලම් හරහා තොරතුරු සැපයීමේ ව්‍යාපෘතිය හඳුන්වා දී ඇති අතර, එම ව්‍යාපෘතිය මඟින් ග්‍රාමීය ගොවි ප්‍රජාවන් වෙත ඉතා කඩිනමින් තොරතුරු ලබා ගැනීමේ ක්‍රමවේදයක් ලෙසින්

"සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති ඒකක" ස්ථාපිත කොට ඇත. එම සයිබර් ව්‍යාප්ති ඒකක පිහිටුවීමේ වැඩසටහන ග්‍රාමීය කෘෂිකාර්මික ව්‍යාප්ති අංශයට එක්වූ නව ප්‍රවේශයක් වන බැවින් එහි ක්‍රියාකාරීත්වය හා ප්‍රගතිය පිළිබඳ අධ්‍යයනය කිරීම වඩාත් වැදගත් වේ. සයිබර් ඒකකයන් හි ක්‍රියාකාරීත්වය වර්තමානය වන විට දක්වා ඇති ප්‍රගතිය පිළිබඳවත් ඒ මගින් ගොවි ප්‍රජාවෙ හි කාර්යයන් සාර්ථක කරගැනීම සඳහා කුමනාකාරයේ පිටිවහලක් ලැබී ඇත්ද? යන්න පිළිබඳව අධ්‍යයනය කිරීම වඩාත් වැදගත් වේ. තවද ඒ සම්බන්ධව ගොවීන් දරන ආකල්පයන් පිළිබඳවත් වර්තමානයේ එම ඒකකයන් හි සාර්ථක / අසාර්ථකභාවය සොයා බැලීම පිළිබඳවත්, සිදු කෙරුණු ක්‍රමික අධ්‍යයනයන් ඉතාමත් විරල ය. එසේ ම මෙම වැඩසටහනින් අපේක්ෂිත කාර්යයන් ඉටු කිරීමේ දී නිලධාරීන් මුහුණ දෙන ගැටලු සහ සේවය ලබා ගැනීමේ දී ගොවීන් මුහුණ දෙන ගැටලු අධ්‍යයනය කර ඊට සපයාගත හැකි විසඳුම් කවරේ ද යන්නත් ඒකකයන් හි ක්‍රියාකාරීත්වය සාර්ථක වීමට සිදු විය යුතු නවතාවයන් කවරේ ද? යන්නත් සොයා බැලීම සඳහා මෙවැනි අධ්‍යයනයක් සිදු කිරීම වඩාත් වැදගත් වනවා සේ ම කාලෝචිත කාර්යයක් ද වනු ඇත.

1.3 අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ

සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති ඒකකයන් හි ක්‍රියාකාරීත්වය හා වර්තමාන ප්‍රගතිය පිළිබඳවත් ගොවි ප්‍රජාව වෙත එහි ඇති බලපෑම පිළිබඳවත් අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වේ. අනෙකුත් විශේෂිත අරමුණු පහත පරිදි වේ

01. ස්ථාපිත කර ඇති සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති ඒකකවලින් කෙතරම් ප්‍රමාණයක් සාර්ථක ව පවත්වාගෙන යන්නේ ද යන්න සොයා බැලීම.

02. මෙම ඒකක පිළිබඳ ගොවීන්ගේ දැනුවත්භාවය සහ ඔවුන් එම තොරතුරු කෙතරම් දුරට භාවිතා කරන්නේ ද යන්න සොයා බැලීම.

03. ගොවීන් විසින් මෙම ඒකක හරහා ලබා ගෙන ඇති දැනුමේ ස්වභාවය සහ ඔවුන්ට එයින් අත් වූ ප්‍රයෝජනවත්භාවය පිළිබඳ අධ්‍යයනය කිරීම.

04. ඒකක හරහා සේවය ලබා ගැනීමේ දී ගොවීන් මුහුණ දෙන ගැටලු සහ එම මධ්‍යස්ථාන පවත්වාගෙන යාමේ දී නිලධාරීන් විසින් මුහුණ දෙන ගැටලු පිළිබඳ විමසා බැලීම.

05. මෙම ඒකක ප්‍රයෝජනවත් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සිදු විය යුතු සංශෝධන පිළිබඳ ව ගොවීන්ගේ සහ නිලධාරීන්ගේ අදහස් විමසීම.

06. සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති ඒකක සාර්ථකව ක්‍රියාත්මක කරවීම තුළින් ග්‍රාමීය ව්‍යාප්ති සේවයේ ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය යෝජනා ඉදිරිපත් කිරීම.

1.4 පර්යේෂණ ක්‍රමවේදය

(අ) අධ්‍යයන ප්‍රදේශය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පළාත් 09 ක් ආවරණය වන පරිදි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය උපයෝගී කරගනිමින් ගොවීන් වෙත නව කෘෂිකාර්මික දැනුම හා තොරතුරු සැපයීම සඳහා සයිබර් ඒකක

55ක් දිස්ත්‍රික්ක 21ක් තුළ කලාප හා ගොවිජන සේවා මධ්‍යස්ථාන කේන්ද්‍ර කොටගනිමින් ස්ථාපිත කොට ඇත (ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථානය, 2009). එම දිස්ත්‍රික්ක 21 අතුරින් 15%ක දිස්ත්‍රික්ක නියැදියක් ලෙසින් කෘෂිකර්මාන්තයට වඩාත් නැඹුරු දිස්ත්‍රික්ක 03ක් අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලදී.

(ආ) නියැදිය තේරීම

නියැදිය තෝරා ගැනීමේ දී ස්ථාපිත කර ඇති සයිබර් ව්‍යාප්ති ඒකක ප්‍රමාණය සහ එයින් සේවය ලබාගන්නා සහ සේවය ලබා නො ගන්නා ගොවීන් ප්‍රමාණය සැලකිල්ලට ගත් අතර බහු පියවර නියැදි ක්‍රමය (multi stage random sampling technics) අනුගමනය කරන ලදී. එම ක්‍රමය තුළ පියවර කිහිපයකින් නියැදිය තෝරා ගන්නා ලදී.

පළමු පියවර - සයිබර් ඒකක ස්ථාපිත කොට ඇති දිස්ත්‍රික්ක 21 අතුරින් 15%ක දිස්ත්‍රික්ක නියැදියක් ලෙසින් කෘෂිකර්මාන්තයට වඩාත් නැඹුරු දිස්ත්‍රික්ක 03ක් අධ්‍යයනය සඳහා තෝරා ගැනීම.

දෙවැනි පියවර - දිස්ත්‍රික්ක 03 තුළ දැනට ස්ථාපිත කර ඇති සයිබර් ව්‍යාප්ති ඒකක සංඛ්‍යාව 18ක් වන අතර එම සංඛ්‍යාවෙන් අහඹු ලෙස 50% ක නියැදියක් තෝරා ගැනීම. ඒ අනුව තෝරා ගත් සයිබර් ඒකක සංඛ්‍යාව 09ක් වේ (වගු අංක 01).

තෙවැනි පියවර - අනතුරුව තෝරා ගනු ලැබූ සෑම ඒකකයකින් ම එම සේවාව ලබාගත් ගොවීන් මෙන් ම සේවාව ලබා නො ගත් ගොවීන් කණ්ඩායමක් අධ්‍යයනය සඳහා තෝරාගන්නා ලදී.

සේවය ලබාගත් ගොවීන්ගේ නාම ලේඛනයක් උපයෝගී කරගනිමින් එක් ඒකකයකින් අහඹු ලෙස ගොවීන් 10 දෙනෙකු බැගින් තෝරා ගැනීමට අදහස් කළ මුත්, ප්‍රායෝගිකව මුහුණ දුන් යම් යම් ගැටලු මත එය වෙනසකට ලක් විය. ඒ අනුව ගොවීන් 10 දෙනා යන සංඛ්‍යාව ගොවීන් 11 හෝ 09 බවට පත් වූ අවස්ථා ඇති විය. සේවය නො ලැබූ ගොවීන් 10 දෙනෙකු ද එම ප්‍රදේශය තුළින් ම අහඹු ලෙස තෝරා ගන්නා ලදී. ඒ අනුව සයිබර් ඒකක 09 තුළින් සේවය ලබා ගත් ගොවීන් 90ක් ද, සේවය නොලැබූ ගොවීන් 91ක් ද වූ අතර, මුළු ගොවි නියැදිය 181න් සමන්විත විය. ඒකකය පවත්වා ගෙන යනු ලබන නිලධාරීන් 09 දෙනා ද අධ්‍යයන දත්ත ලබාගැනීම සඳහා තෝරා ගන්නා ලදී (වගු අංක 01). එක් එක් ගොවි ජන සේවා මධ්‍යස්ථානයට අයත් ප්‍රාදේශීය නිලධාරීවරයා සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රව්‍ය - දෘශ්‍ය මධ්‍යස්ථානයේ මීට අදාළ නිලධාරීන් සමග කෙරෙන සම්මුඛ සාකච්ඡා තුළින් ද තොරතුරු ලබා ගන්නා ලදී. ඊට පරිබාහිර වශයෙන් නියැදියට ඇතුළත් නො වන අනෙකුත් සියලු ම ඒකක භාර නිලධාරීන් වෙත තැපැල් මාර්ගයෙන් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නාවලියක් ආශ්‍රයෙන් සමස්ත ඒකක පිළිබඳ තොරතුරු සපයා ගත් අතර තැපැල් මාර්ගික ව පිළිතුරු නො ලැබුණු ඒකකයන් වෙතින් දුරකථන මාර්ගයෙන් තොරතුරු ලබා ගන්නා ලදී.

වගු අංක 1.1: තෝරා ගත් දිස්ත්‍රික්ක, ස්ථාපිත ඒකක සංඛ්‍යාව සහ තෝරා ගනු ලැබූ ගොවි නියැදිය

දිස්ත්‍රික්කය	පවතින ඒකක	අධ්‍යයන ප්‍රදේශය	කෘෂිකර්ම උපදේශක (ඒකක භාර නිලධාරී)	ගොවීන්	
				සේවාව ලබා ගත් ගොවීන්	සේවාව ලබා නො ගත් ගොවීන්
මහනුවර	05	මාරස්සන	1	10	10
		පූජාපිටිය	1	11	10
හම්බන්තොට	06	මිගහජඳුර	1	10	11
		යෝධ කණ්ඩිය	1	10	11
		අම්බලන්තොට	1	10	10
අනුරාධපුර	07	රාජාංගනය වම් ඉවුර	1	09	10
		ශ්‍රාවස්තිපුර	1	10	10
		අනුරාධපුරය	1	10	09
		පේමඩුව	1	10	10
	18	09	09	90	91

(ඇ) දත්ත හා තොරතුරු රැස් කිරීම

මෙම අධ්‍යයනය ප්‍රාථමික හා ද්විතියක දත්ත මත පදනම් විය. අධ්‍යයනයේ අරමුණුවලට අදාළ වන පරිදි ප්‍රධාන නිර්ණායක 03ක් යටතේ දත්ත රැස් කිරීම සිදු විය. එනම්,

01. විස්තරාත්මක සාහිත්‍ය විමර්ශනය
02. කණ්ඩායම් සාකච්ඡා සහ අදාළ නිලධාරීන් සමඟ කෙරෙන සම්මුඛ සාකච්ඡා
03. ව්‍යුහගත ප්‍රශ්නාවලි සමීක්ෂණය

01. විස්තරාත්මක සාහිත්‍ය විමර්ශනය (ද්විතියික දත්ත)

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හරහා ගොවීන් වෙත කෘෂිකාර්මික දැනුම හා තොරතුරු සැපයීම පිළිබඳ ශ්‍රී ලංකාවේ සහ වෙනත් රටවල සිදු කෙරුණු පර්යේෂණයන් හා අධ්‍යයනයන් තුළින් ද මෙම විෂයට අදාළ ග්‍රන්ථ, සඟරා සහ ලිපි ලේඛන පරිශීලනයෙන් ද අදාළ දෙපාර්තමේන්තු, ආයතන සහ මධ්‍යස්ථාන මට්ටමින් ඇති වාර්තා ආදියෙන් ද කෙරුණු සාහිත්‍ය විමර්ශනයෙන් සපයා ගත් තොරතුරු ද්විතියික දත්ත වශයෙන් උපයෝගී කරගන්නා ලදී.

02. කණ්ඩායම් සාකච්ඡා සහ අදාළ නිලධාරීන් හා කෙරුණු සම්මුඛ සාකච්ඡා

සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති ඒකක හරහා ගොවීන් වෙත සේවය ලබා දීමේ කාර්යයට අදාළ නිලධාරීන් සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථානය තුළ මීට අදාළ නිලධාරීන් හා සිදු කළ සම්මුඛ සාකච්ඡා තුළින් තොරතුරු සපයා ගන්නා ලදී.

03. ව්‍යුහගත ප්‍රශ්නාවලි සමීක්ෂණය

අධ්‍යයනයට අදාළ ප්‍රාථමික දත්ත රැස් කිරීම, සේවාව ලබන සහ නො ලබන ගොවීන් වෙත ඉදිරිපත් කෙරෙන ව්‍යුහගත ප්‍රශ්නාවලියක් ආශ්‍රිත ව සිදු කෙරිණි. සේවය ලබා ගන්නා ගොවීන් වෙත ඉදිරිපත් කෙරුණු ප්‍රශ්නාවලිය හරහා මෙම ඒකකයන් තුළින් සැපයෙන සේවාවේ වර්තමාන තත්ත්වය, ඒකය හරහා තොරතුරු ලබා ගන්නා ආකාරය සහ තොරතුරු ලබාගත් ගොවි ප්‍රතිශතය පිළිබඳ තොරතුරු රැස් කරගන්නා ලදී. සේවය ලබා නො ගන්නා ගොවීන් වෙතින් ලබා ගත් තොරතුරු තුළින් ඒකක පිළිබඳ ඔවුන්ගේ දැනුවත් භාවය හා මෙම සේවාව තවදුරටත් ව්‍යාප්ති කිරීමට හැකියාවක් පවතී ද යන්න ගැන හඳුනා ගැනීමට උත්සාහ කෙරිණි. මෙම ඒකක පවත්වා ගෙන යනු ලබන නිලධාරීන් වෙත (කෘෂිකර්ම උපදේශක) ඉදිරිපත් කළ ප්‍රශ්නාවලිය ආශ්‍රයෙන් ලබා ගත් තොරතුරු, මෙම ඒකකයන් හි සාර්ථක/අසාර්ථකභාවය හඳුනා ගැනීමටත් ඒකක පවත්වාගෙන යාමේ දී ඔවුන් විසින් මුහුණ දෙනු ලබන ගැටලු හඳුනා ගැනීමටත් ඒ සඳහා පිළියම් හඳුනා ගැනීමටත් යොදා ගන්නා ලදී. නියැදියට ඇතුළත් නොවූ අනෙකුත් සියලු ම ඒකක භාර නිලධාරීන් වෙත තැපැල් මාර්ගිකව ඉදිරිපත් කළ ප්‍රශ්නාවලිය ආශ්‍රයෙන් සහ දුරකථන සාකච්ඡා තුළින් ලබා ගත් තොරතුරු මඟින් කෘෂිකාර්මික තොරතුරු තාක්ෂණ ව්‍යාප්ති ඒකකයන් පිළිබඳ සමස්ත තොරතුරු ලබා ගැනීමට හැකි විය.

(ඈ) දත්ත විශ්ලේෂණය

ප්‍රශ්නාවලි මඟින් ලබා ගත් දත්ත පරිගණකගත කිරීමෙන් සංඛ්‍යානමය වගු, ප්‍රස්තාර, ආශ්‍රයෙන් විශ්ලේෂණය සිදු කරන ලදී.

1.5 අධ්‍යයනයේ සීමා

ස්ථාපිත කර ඇති ඒකකයන් කිහිපයක දුරකථන ක්‍රියාවිරහිත වී තිබීමෙන් එම ඒකකයන් හි තොරතුරු ලබා ගැනීමේ අවකාශය ගිලිහී යන ලදී. එය මෙම අධ්‍යයනයට අදාළ වූ සීමාවක් විය.

1.6 වාර්තාවේ සැකැස්ම

මෙම වාර්තාවේ පළමු පරිච්ඡේදය, අධ්‍යයනයට ප්‍රවේශයක් සපයමින් එහි පසුබිම, අරමුණු හා ක්‍රමවේදයන් පැහැදිලි කරයි. දෙවන පරිච්ඡේදය, දේශීය කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයේ පසුබිම පිළිබඳ සැකෙවින් විස්තර කරන අතර, එහි නව ප්‍රවණතාවයන් පිළිබඳ සාකච්ඡා කෙරේ. ග්‍රාමීය කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාව සඳහා නව ප්‍රවණතාවක් ලෙසින් හඳුනා ගෙන ඇති තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතාවන් පිළිබඳ එහි දී තොරතුරු ඉදිරිපත් කෙරේ. තෙවන පරිච්ඡේදයේ දී අධ්‍යයනයට බඳුන් වන සයිබර් ව්‍යාප්ති ඒකකයන් පිළිබඳ තොරතුරු විග්‍රහයක යෙදේ. හතරවන, පස්වන හා හයවන පරිච්ඡේද අධ්‍යයන කාලපරිච්ඡේදය තුළ එක් රැස් කරගත් දත්ත හා තොරතුරු විශ්ලේෂණයෙන් ලත් සොයා ගැනීම් සවිස්තරාත්මකව ඉදිරිපත් කරයි. අවසන් පරිච්ඡේදය නිගමන හා නිර්දේශ සඳහා වෙන් කර ඇත.

දෙවැනි පරිච්ඡේදය

සාහිත්‍ය විමර්ශනය

2.1 හැඳින්වීම

ග්‍රාමීය කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයේ කාර්යක්ෂමතාව ඉහළ දැමීමේ අරමුණින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රව්‍ය - දෘශ්‍ය මධ්‍යස්ථානය මගින් ස්ථාපිත කර ඇති සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති ඒකක පිළිබඳ සිදු කෙරෙන මෙම පර්යේෂණාත්මක අධ්‍යයනයේ දෙවන පරිච්ඡේදය, එම අධ්‍යයනය සඳහා අවැසි සාහිත්‍ය විමර්ශනය වෙනුවෙන් වෙන් කර ඇත. ඒ යටතේ, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය පිළිබඳවත්, එහි මෑතකාලීන නව ප්‍රවණතා පිළිබඳවත් ඉතා සැකෙවින් තොරතුරු ඉදිරිපත් කෙරේ. ඊට අමතරව ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය උපයෝගී කරගැනීමේ වැදගත්කම පිළිබඳවත් දැනට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය උපයෝගී කරගනිමින් කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ සිදු කෙරෙන කාර්යයන් පිළිබඳවත් කරුණු විමර්ශනය කර ඇත.

සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති ඒකක පිළිබඳ දැනට විධිමත් ව සිදු කෙරී ඇති පර්යේෂණාත්මක අධ්‍යයනයන් විරල බැවින් ඒ පිළිබඳ වියුක්ත වූ දත්ත හා තොරතුරු ලේඛනගත කිරීම ද මෙම පරිච්ඡේදයෙන් සිදු කෙරේ.

2.2 ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය

නිදහසින් පසු සංවර්ධනය වෙමින් පවතින අනෙකුත් රටවට හා සමගාමීව ශ්‍රී ලංකාවේ ද කෘෂිකර්ම ව්‍යාප්ති සේවය ආරම්භ වූයේ නව කෘෂිකාර්මික ප්‍රවර්ධනය උපක්‍රමයක් ලෙසිණි. නිදහස ලැබීමත් සමගම රජය විසින් සිය අවධානය වී නිෂ්පාදනය වැඩි දියුණු කිරීම කෙරෙහි යොමු කරන ලද අතර, කෘෂිකර්ම උපදේශකවරුන් (AI) ක්ෂේත්‍ර මට්ටමේ ව්‍යාප්තිකරුවන් වශයෙන් සලකන ලදී, මේ නිසා ව්‍යාප්ති කාර්ය මණ්ඩලය විශාල වූ නමුත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ලැබෙන සහයෝගය දුර්වල වූ හෙයින් ව්‍යාප්ති සේවයෙහි වර්ධනයක් සිදු නො වුණි. ජාතික සැලසුම් හා සම්බන්ධීකරණ දුර්වලතාවය, ගොවීන් සමග සෘජුව සම්බන්ධ වීම සඳහා ව්‍යාප්ති නිලධාරීන් ප්‍රමාණවත් නො වීම, පර්යේෂණ හා ව්‍යාප්ති සේවය අතර දුර්වල සම්බන්ධීකරණය, ව්‍යාප්ති සේවකයින්ගේ තාක්ෂණික දැනුම වැඩි දියුණු කරගැනීමට ඇති සීමිත පහසුකම් යන කරුණු මේ සඳහා හේතු විය. මෙම කාලවකවානුව තුළ ව්‍යාප්ති සේවයේ ප්‍රධාන අරමුණ වූ ආහාර නිෂ්පාදනය වැඩි වර්ධනය කිරීම හේතුවෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ වෙන ම දෙපාර්තමේන්තුවක් වශයෙන් "ආහාර නිෂ්පාදන දෙපාර්තමේන්තුව" පිහිටුවිය. 1952 වර්ෂයේ දී ආහාර නිෂ්පාදන දෙපාර්තමේන්තුව විසුරුවා හරින ලද්දේ අදාළ අරමුණ කරා ළඟා විය නො හැකි වූ බැවිණි. ඒ අතර එහි සේවකයන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරන ලදී, මෙම කාලය තුළ ආහාර නිෂ්පාදන අධීක්ෂකවරු 500ක් පමණ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ බඳවා ගන්නා ලද අතර මොවුන්ගෙන් බහුතරයකට කෘෂිකර්මය පිළිබඳ ව කිසිදු අධ්‍යාපනික සුදුසුකමක් නො විය. අනතුරුව මෙම තනතුර "කෘෂිකර්ම ව්‍යාප්ති සේවක" වශයෙන් සංශෝධනය විය. මෙයට සමගාමීව මොවුන් සඳහා රජයේ කෘෂිකර්ම විද්‍යාලයේ එක් අවුරුදු ප්‍රායෝගික පාඨමාලාවක් ලබා දෙන ලදී, මෙම කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින්ට කෘෂිකර්ම උපදේශකවරුන් යටතේ ග්‍රාමීය

LIBRARY

මට්ටම සමඟ සෘජු සම්බන්ධතාවක් පවත්වාගෙන යාමට අවශ්‍ය මඟ පෙන්වීම සිදු කෙරිණි (Bogahawatta, 1994).

1963 වර්ෂයේ දී ග්‍රාමීය, ප්‍රාදේශීය දිස්ත්‍රික් හා ජාතික මට්ටම ආවරණය වන පරිදි නවතාවයකින් යුක්ත වූ ව්‍යාප්ති අංශයක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිත වූ අතර ගොවීන්ගේ අවශ්‍යතාවයන්ට සරිලන පරිදි එය වඩාත් හොඳින් සංවිධානය විය.

2.2.1 පුහුණු සහ හමුවීම් ක්‍රමය

ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් පළමු විධිමත් ව්‍යාප්ති ක්‍රියාවලිය ලෙසින් 1979 සිට 1980 දශකය මැද භාගය දක්වා කාලය තුළ ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වූ කෘෂිකර්ම ව්‍යාප්ති සහ යෝග්‍යතා පර්යේෂණ ව්‍යාපෘතිය (Agriculture Extension and Adaptive Research project - AEARP) හඳුනාගත හැකි ය. ශ්‍රී ලංකාව ආහාර අතින් ස්වයංපෝෂිත කිරීමේ අරමුණ සහ ව්‍යාප්ති ක්ෂේත්‍රයේ පැවති දුර්වලතා අඩු කරමින් කෘෂිකර්ම කටයුතු වඩාත් කාර්යක්ෂමව සිදු කිරීම මෙයින් අපේක්ෂා කළ අතර මේ තුළින් ව්‍යාප්ති සේවය තුළ ද කැපී පෙනෙන පුළුල් වීමක් ඇතිවිය. මෙම ව්‍යාපෘතිය මගින් පුහුණු වීම් සහ හමුවීමේ ක්‍රමවේදය (training and visit system) හඳුන්වා දුන් අතර, ඒ මගින් යටිතල පහසුකම් දියුණු කිරීම, සේවක සංචලන වැඩසටහන් සහ විවිධ මට්ටමින් සේවක සංවර්ධන වැඩසටහන් ද දියත් කරන ලදී. මෙම පුහුණු හා හමුවීමේ ක්‍රමය පර්යේෂණ හා ව්‍යාප්ති සේවය සම්බන්ධ කරන්නා වූ මෙවලමක් වූ අතර, ව්‍යාප්ති කාරකයන් සහ ගොවීන් හමුවන ක්‍රමවත් වූ වැඩපිළිවෙළක් ද විය. මෙහි දී ක්‍රමවත් අධීක්ෂණ ක්‍රමයක් සහ ක්‍රමානුකූල පුහුණු ක්‍රමයක්, ව්‍යාප්ති කාර්ය මණ්ඩලය වෙත හඳුන්වා දෙන ලදී. ඉන් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයේ වැඩි දියුණු වීමක් ඇති විය. මෙහි කාර්යයන් පැහැදිලිව දක්වා තිබූ අතර, ඒ අතරින් ව්‍යාප්ති කාර්ය මණ්ඩලය සඳහා පර්යේෂණ හා පුහුණු ප්‍රමුඛතා හඳුනා ගැනීම සහ ඒ සඳහා මුදල් වෙන් කිරීම ප්‍රාදේශීය වශයෙන් අවශ්‍ය ව්‍යාප්ති වැඩසටහන් සැලසුම් කිරීම යන කාර්යයන් ප්‍රධාන විය. සෑම කෘෂි පාරිසරික කලාපයක් තුළ ම "කලාපීය තාක්ෂණික ක්‍රියාකරුවන් කණ්ඩායමක්" පිහිටුවන ලදී. ඒ අනුව මෙවැනි කණ්ඩායම් 09 ක් දිවයින පුරා ක්‍රියාත්මක විය. ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයේ පර්යේෂණ සම්බන්ධ නියෝජ්‍ය අධ්‍යක්ෂ මෙම කණ්ඩායමේ ප්‍රධානත්වය දැරූ අතර, ප්‍රදේශයේ පර්යේෂණ පුහුණු හා ව්‍යාප්ති කාර්ය මණ්ඩලය ද මෙයට අයත් විය. මෙය අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ආයතනගත විය (Weeratunga, 2001).

මෙම පුහුණු හා හමුවීම් ක්‍රමවේදය ක්‍රියාත්මක වීමේ දී ප්‍රධාන කෘෂිකාර්මික නිෂ්පාදනයන් හි සංවර්ධනයක් දැකිය හැකි වූ අතර, විශේෂයෙන් වී නිෂ්පාදනයේ කැපී පෙනෙන ප්‍රගතියක් පෙන්නුම් කරන ලදී. නමුත් පුහුණු හා හමුවීම් ක්‍රමය පිළිබඳ විවිධ විවේචන ද ඉදිරිපත් වී ඇත. මෙම ක්‍රමය ක්‍රියාත්මක තත්ත්වයේ දී දැඩි අනම්‍යශීලිත්වයක් පැවතීම, වාරිමාර්ග ව්‍යාපෘති යටතේ වී වගාව පිළිබඳ ව්‍යාප්ති සේවයට වැඩි පක්ෂපාතීත්වයක් දැක්වීම, විශාල වියදමක් සහිත ව්‍යාප්ති ක්‍රමයක් වීම යනාදී දුර්වලතා එහි පවතින බව විවේචන තුළින් ඉදිරිපත් වී ඇත. කෙසේ නමුත් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය තුළට පුහුණු හා හමුවීමේ ක්‍රමවේදය ප්‍රවේශ වීමක් සමග ව්‍යාප්ති සේවය විශේෂ ලක්ෂණ කිහිපයකින් සමන්විත විය (Bogahawatta, 1994). එනම්, ව්‍යාප්ති කටයුතු සම්බන්ධ නියෝජ්‍ය අධ්‍යක්ෂකගේ ප්‍රධානත්වය සහිත ව ග්‍රාමීය මට්ටමේ

ව්‍යාප්ති කාරකයන්ගෙන් සමන්විත වූ වෘත්තීමය ඒකාබද්ධ ව්‍යාප්ති සේවයක් සියලුම බෝග ආවරණය වන පරිදි නිර්මාණය වීම. විවිධ බෝග පිළිබඳ විෂය භාර නිලධාරීන් විසින් කෘෂිකර්ම උපදේශකට සහ ව්‍යාප්ති සේවක නිලධාරීන්ට අඛණ්ඩව ම දෙසති පුහුණු පාඨමාලාවක් ලබා දීම සහ කෘෂිකර්ම ව්‍යාප්ති සේවක නිලධාරීන් සෑම දෙසතියකට ම වරක් ගොවි කණ්ඩායම් සඳහා එම දෙසතිය තුළ වැදගත් වන කැමැත්තක් දක්වන සහ අදාළ වන තොරතුරු හා මාතෘකා පිළිබඳ පූර්ව සැලසුම් අනුව ගොවීන් මුණගැසීම හා දැනුවත් කිරීම යි.

මෙම ව්‍යාප්ති ක්‍රමවේදයේ මෙහෙයුම් වියදම ඉතාමත් විශාල වූ අතර වැය වන වියදමට සාපේක්ෂව ලැබූ ප්‍රතිලාභ ඉතා අල්ප විය. වියදම් අධික වූ මෙම ව්‍යාපෘතිය 1987 දක්වා ලෝක බැංකු මූල්‍ය ආධාර යටතේ ක්‍රියාත්මක වුව ද අනතුරුව ක්‍රියාත්මක කිරීමේ මූල්‍ය ගැටලු පැන නැගුණු අතර රජය විසින් ඒ සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රතිපාදන සීමා කරන ලදී. අනතුරුව ග්‍රාමීය මට්ටමේ ව්‍යාප්ති නිලධාරීන් වශයෙන් සිටි කෘෂිකර්ම ව්‍යාප්ති සේවක නිලධාරීන් 2400ක පිරිස, සහ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ වගා නිලධාරීන්, ග්‍රාම නිලධාරීන් වශයෙන් ප්‍රාදේශීය ලේකම්වරුන්ට අනුයුක්ත කරන ලද්දේ, "දිළිඳුකම පිටු දැකීමේ ව්‍යාපෘතිය" යටතේ ය. මෙම කාලය තුළ වැදගත් පරිපාලනමය වෙනසක් ද රජය විසින් හඳුන්වා දෙන ලදී. පළාත් සභා බිහි කරමින් අධිකාරි බලය විමධ්‍යගත කිරීම යි. මෙම තත්ත්වය තුළ කෘෂිකර්ම ව්‍යාප්ති සේවය පළාත් සභා යටතට පත්වීමත් සමග ම එවකට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති අංශය වෙත පැවරී තිබූ ව්‍යාප්ති වගකීම් අහෝසි විය (Weeratunga, 2001). මේ සියලු කරුණු සමග පුහුණු හා හමුවීම් ක්‍රම වේදය අහෝසි වූ අතර 80 දශකය අවසන් භාගය වන විට කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ව්‍යාප්ති කටයුතු වඩාත් දුර්වල මට්ටමකට පත්විය. ව්‍යාප්ති හා පුහුණු කටයුතු සිදු කිරීමේ වගකීම් පළාත් සභාවල පැවරීමත් පර්යේෂණ කාර්යභාරය මධ්‍යම රජය සතු වීමත් තුළ කෘෂිකර්ම සංවර්ධනයට අත්‍යවශ්‍ය පර්යේෂණ හා ව්‍යාප්ති සම්බන්ධතාවය වඩාත් දුර්වල මට්ටමකට පත් විය.

2.2.2 දෙවැනි කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා ව්‍යාපෘතිය

අකර්මන්‍ය වෙමින් පැවති ව්‍යාප්ති සේවය නැවත නංවාලීම පිණිස, පැවති කෘෂිකර්ම ව්‍යාප්ති කටයුතුවල දුර්වලතා හඳුනා ගනිමින් රජය විසින් ලෝක බැංකු ආධාර යටතේ දෙවන කෘෂිකාර්මික ව්‍යාප්ති ව්‍යාපෘතිය (Second Agricultural Extension Project – SAEP) 1993 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. මෙම නව උපක්‍රමය ගොවීන් කේන්ද්‍ර කොටගත් පරිපූර්ණ වගා පද්ධති ප්‍රවේශයකින් යුක්තව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තුළ පවතින ව්‍යාප්ති සේවය, සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, අපනයන කෘෂි බෝග දෙපාර්තමේන්තුව සහ පොල් වගා කිරීමේ මණ්ඩලය යන ආයතන හා ඒකාබද්ධ වෙමින් සිදු කරන ලද ඒකාබද්ධ කෘෂිකාර්මික ව්‍යාප්ති ක්‍රමෝපායයකි. මෙය පහළ සිට ඉහළට විහිදුණු සහභාගීත්ව ප්‍රවේශයක් වූ අතර, මේ තුළින් ගොවීන්ගේ අවශ්‍යතා හඳුනා ගන්නා ලදී. මෙහි දී රට පුරා ම එකම ව්‍යාප්ති ක්‍රමයක් ඇති කරන ලද අතර එක් එක් ප්‍රදේශයන් සඳහා සංවර්ධන ඒකාබද්ධ කෘෂිකාර්මික ව්‍යාප්ති වැඩ සැලසුමක් තුළින් තොරතුරු එක් රැස් කරගන්නා ලදී. මෙම පද්ධතිය යටතේ ව්‍යාප්ති නියෝජිතයා ගොවීන්ගේ ගැටලු සම්බන්ධයෙන් සාමාන්‍ය වෘත්තිකයෙකු ලෙස ක්‍රියා කළේය. කෙසේ නමුත් මෙම ඒකාබද්ධ කෘෂිකාර්මික ව්‍යාප්ති ක්‍රමෝපාය සාර්ථක ලෙස ක්‍රියාත්මක නො වුණු අතර, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ කාල සීමාවේ පවා

සැලකිය යුතු ප්‍රගතියක් පෙන්වීමට අපොහොසත් විය. ඒ අනුව මෙම ව්‍යාපෘතිය 1998 මැද භාගය වන විට අවසන් කරන ලදී (Bogahawatta, 1994).

2.3 කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයේ මෑතකාලීන වෙනස්වීම් සහ නව ප්‍රවණතා

කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය සඳහා ක්‍රියාත්මක වූ වඩාත් විධිමත් ආකාරයේ ව්‍යාප්ති ප්‍රවේශයක් ලෙසින් පුහුණු හා හමුවීමේ ක්‍රමය හඳුනාගත් නමුත් ව්‍යාපෘතියේ පැවති යම් යම් දුර්වලතා හේතුවෙන් එම ව්‍යාප්ති ප්‍රවේශය අවසන් විය. නමුත් එම ක්‍රමයේ පැවති විධිමත්භාවය සහ ගොවීන් සමඟ සමීප ව කටයුතු කිරීමේ හැකියාව හේතුවෙන් සමස්ත කෘෂි ව්‍යාප්ති සේවා පද්ධතියටත් කාර්ය මණ්ඩලයටත් ඉහළ මට්ටමේ විනයානුකූල වෙනසක් එක් විය. පුහුණු හා හමුවීමේ ව්‍යාප්ති ප්‍රවේශය අවසන් වීමෙන් ඇති වූ හිඩැස පිරවීම සඳහා ලෝක බැංකු ආධාර යටතේ දෙවන කෘෂිකාර්මික ව්‍යාප්ති ව්‍යාපෘතිය ආරම්භ වුවත් අපේක්ෂිත ප්‍රතිඵල නො ලැබුණු බැවින් එය ද වසර කිහිපයකින් අවසන් විය.

වර්තමානය වන විට, රාජ්‍ය අංශය පෞද්ගලික අංශය සහ රාජ්‍ය නො වන සංවිධාන විසින් ගොවීන්ගේ අවශ්‍යතාවයන් හා විවිධ භෝග අනුව ව්‍යාප්ති සේවය සැපයීම කරනු ලබයි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව එක්ව කෘෂි තාක්ෂණය ජනනය කිරීමේ හා ව්‍යාප්ත කිරීමේ කාර්යයෙහි නියැළී සිටී. මහවැලි ව්‍යාපෘතිය යටතේ පවතින ප්‍රදේශයන් හි ව්‍යාප්ති කටයුතු මහවැලි අධිකාරිය විසින් සිදු කරනු ලබයි. උතුරු - නැගෙනහිර ප්‍රදේශයේ හැර අපනයන වටිනාකමක් සහිත බෝගයන් සඳහා වන ව්‍යාප්ති සේවය, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් සිදු කෙරේ. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, මානව සම්පත් සංවර්ධන කටයුතු සඳහා සෘජුව ම දායක වන අතර පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ගොවීන් සඳහා තොරතුරු හා සේවා සැපයීමේ කාර්යයෙ හි නියැළෙමින් ව්‍යාප්ති කටයුතුවල වගකීම භාරව සිටී. වැවිලි අංශයේ ව්‍යාප්ති සේවය සැපයීමේ කාර්යය ආයතන කිහිපයක් යටතේ පවතින අතර එම ආයතන හරහා ව්‍යාප්ති සේවය සිදු වේ.

පෞද්ගලික අංශය විසින් තම ව්‍යාප්ති සේවය සැපයීමේ කාර්යය ලාභය මත පදනම් කරගනිමින් සේවාවන් හා යෙදවුම් සැපයීමේ කාර්යයෙහි නිරත වන අතර රාජ්‍ය නො වන සංවිධාන විසින් එක් එක් වැඩසටහන් හරහා සමාජයේ වෙසෙන ආර්ථිකමය වශයෙන් දුර්වල කණ්ඩායම්, විශේෂයෙන් ග්‍රාමීය දිළිඳු ගොවි ප්‍රජාව සඳහා සහාය සැපයීම සිදු කරනු ලබයි.

ව්‍යාප්ති සේවය සැපයීමේ දී මෙම එක් එක් අංශයන් හි විශාල විවිධත්වයක් පවතී. එයට හේතු වන්නේ, ඔවුන් භාවිතා කරන ව්‍යාප්ති ප්‍රවේශයන් හි විවිධත්වය යි. එසේ ම වැඩසටහන් ක්‍රියාත්මක කරන ආකාරය, අරමුදල් සම්පාදනය කරගැනීම, වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට තෝරා ගනු ලබන භූමි ප්‍රදේශයන් ඉලක්ක කණ්ඩායම් හා ප්‍රතිලාභීන් යන සියලු කටයුතු විවිධ වේ.

කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ නව ප්‍රවණතාව වන්නේ, නිෂ්පාදනය වර්ධනය කිරීම හරහා ගොවි ප්‍රජාවගේ ආදායම් මට්ටම හා ජීවන තත්ත්වය ඉහළ නැංවීම යි. එබැවින් ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය වැඩි වශයෙන් නිෂ්පාදනය ඉහළ නැංවීම හා වාණිජ මට්ටමේ කෘෂිකර්මාන්ත සඳහා වැඩි නැඹුරුවක් දක්වනු ලබයි. ආහාර

ද්‍රව්‍ය සඳහා වෙනස්වන ඉල්ලුම පිළිබඳ සැලකිලිමත් වෙමින් ඉහළ ඉල්ලුමක් පවතින නිෂ්පාදන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට වර්තමානයේ සෘජු පෙළැඹීමක් ඇත. ගෝලීය වශයෙන් පවතින මෙම තිරසාරත්වය පිළිබඳ සංකල්පය හමුවේ කෘෂිකර්මාන්තය සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම ද අත්‍යවශ්‍ය අංගයක් බවට පත් වී ඇත. එසේ ම ආහාර සුරක්ෂිතතාව පිළිබඳ සංකල්පය ද අද වන විට කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ ඉදිරියෙන් ම පවතින සංකල්පයක් වී ඇත. වර්තමාන කෘෂි ක්ෂේත්‍රය තුළ පවතින මෙම ඉලක්ක කරා ළඟා වීම සඳහා ඉතාමත්ම ඵලදායි හා කාර්යක්ෂමතාවයකින් යුක්ත වූ ව්‍යාප්ති සේවයක් ගොඩනැංවීම අත්‍යවශ්‍ය කාරණයක් බවට පත් වී ඇත.

2.3.1 කෘෂිකාර්මික ව්‍යාප්ති වැඩසටහන් හි ප්‍රධාන අරමුණු සහ අපේක්ෂිත කාර්යභාරය

කෘෂිකාර්මික ව්‍යාප්ති වැඩසටහන් දෙයාකාර වූ ප්‍රධාන අරමුණුවලින් යුක්ත වේ.

01. සන්නිවේදන ක්‍රමෝපායයන් උපයෝගී කරගනිමින් ග්‍රාමීය ප්‍රජාවගේ හැසිරීමෙ හි වෙනසක් ඇති කිරීම
02. සන්නිවේදන ක්‍රමෝපායයන් උපයෝගී කරගනිමින් ග්‍රාමීය ප්‍රජාවගේ දැනුම් මට්ටමේ වෙනසක් ඇති කිරීම.

මිනිසාගේ හැසිරීම් රටාවත් ඔහු සතු දැනුමත් අතර ඇත්තේ ඉතා සමීප වූ සම්බන්ධතාවයකි. ගොවීන් මෙන් ම අනෙකුත් ග්‍රාමීය ප්‍රජාව තුළින් ම පැන නැගෙන අවශ්‍යතාවයන් මත ව්‍යාප්ති සේවය ලබා ගැනීමට ඇතිවන කැමැත්ත හරහා ඔවුනගේ දැනුම අනිවාර්ය වෙනසකට ලක්වේ. මෙම දැනුම, ගොවීන්ගේ වගා කටයුතු සඳහා නිවැරදි තීරණ ගැනීමට ඉතාමත් ඉහළ මට්ටමේ සහයක් සපයනු ලබයි (http://en.wikipedia.org).

ප්‍රතිඵලදායක තොරතුරු හා තාක්ෂණය භාවිතා කිරීමෙන් කුසලතා හා ආකල්පයන් වෙනස් කිරීමටත්, අත්‍යවශ්‍ය දැනුම ලබා ගැනීමටත්, තොරතුරු ගොවීන් වෙත සැපයීමටත් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය අඛණ්ඩ වූ ක්‍රියාවලියක් ලෙස පැවතිය යුතු වේ (Mahaliyanarachchi, 2003). ගොවීන් වෙත දැනුම හා තාක්ෂණය ලබා දීම සඳහා ව්‍යාප්ති සේවකයින් විසින් විවිධ වර්ගයේ ව්‍යාප්ති ක්‍රමවේදයන් භාවිතා කරනු ලබයි. පර්යේෂකයින් සහ තාක්ෂණවේදීන් විසින් ජනනය කරනු ලබන නව දැනුම හා තාක්ෂණය කෘෂිකාර්මික නිෂ්පාදනය ඉහළ දැමීම සඳහා ගොවීන් වෙත ලබා දීමේ දී කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයට ඇත්තේ ප්‍රධාන කාර්යභාරයකි.

වර්තමානයේ කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා අංශය තුළ වෙනස් වීම් සිදු වෙමින් පවතින අතර ගොවි ප්‍රජාවට තොරතුරු හා දැනුම ලබා ගැනීමට පහසු ආකාරයේ ක්‍රමවේදයන් පිළිබඳ අවධානය යොමු වෙමින් පවතී. එය තිරසාර වූ කෘෂිකාර්මික සංවර්ධනයක් සඳහා අත්‍යවශ්‍ය වූ කාරණයක් බවට පත් වී ඇත.

2.3.2 ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය උපයෝගී කරගැනීමේ වැදගත්කම.

ශ්‍රී ලංකාවේ ආර්ථිකය, කෘෂිකාර්මික අංශය මත විශාල වශයෙන් රැඳී පැවතුන ද වර්තමානය වන විට දළ දේශීය නිෂ්පාදිතයට එහි දායකත්වය ක්‍රමයෙන් අඩු වෙමින් පවතී. 2010 මහ බැංකු වාර්තාවට අනුව වර්තමානයේ දළ දේශීය නිෂ්පාදිතයට කෘෂි අංශයේ දායකත්වය 11%කි. එසේ වුවත් ග්‍රාමීය ජනතාවගෙන් 32.7%ක් තවදුරටත් තම ප්‍රධාන ජීවනෝපායන මාර්ගය ලෙසින් නියැළී සිටිනුයේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ රැකියාවල වේ (මහ බැංකු වාර්තා, 2010).

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ප්‍රධාන අභියෝගයක් වන ගොවීන්ට අවශ්‍ය නිවැරදි තොරතුරු නියමිත කාලයට නො ලැබීමේ ගැටලුවට පිළියමක් ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය උපයෝගී කරගැනීමට වර්තමානයේ වැඩි අවධානයක් යොමු කර ඇති අතර අනෙකුත් ක්ෂේත්‍රයන්ට සේ ම කෘෂිකර්මාන්තයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට ද තොරතුරු තාක්ෂණයේ උපයෝගීතාව ඉතා වැදගත් වන බව හඳුනාගෙන ඇත (http://sundaytimes.lk). "තොරතුරු සමාජය" පිළිබඳ 2003 වර්ෂයේ පැවති ලෝක සමුළුවේ දී ආසියානු පැසිපික් කලාපීය රටවල කෘෂිකර්මාන්තයේ සංවර්ධන ප්‍රමුඛතාවයන් සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම පිළිබඳව ඉස්මතු කොට දක්වා ඇති අතර ආහාර සුරක්ෂිතතාව සහ කෘෂිකර්මාන්තයේ තිරසාරත්වය සඳහා නවීන කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට ප්‍රධාන කාර්යභාරයක් කළ හැකි බව සඳහන් වේ.

ආර්ථිකයේ අනෙකුත් අංශයන් හා සැසඳීමේ දී කෘෂි ආර්ථිකය තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම පවතින්නේ ඉතාමත් ළඳරු අවධියක වේ. විශේෂයෙන් ග්‍රාමීය ප්‍රජාවන් අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීම, දැනුවත්භාවය, හා ඒ සඳහා ප්‍රවේශ වීම ඉතාමත් අඩු මට්ටමක පවතී (Hemarathna,2008). එසේ වුවත් කෘෂිකර්මික ක්ෂේත්‍රයට සාපේක්ෂව අනෙකුත් ආර්ථික අංශයන් හි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය ඉහළ මට්ටමක ඇත. තේ වගා ක්ෂේත්‍රය පිළිබඳ සැලකිල්මත් වීමේදී එහි සැලකිය යුතු තේ වතු ප්‍රමාණයක් පරිගණක හා දුරකථන භාවිතා කරන අතර විද්‍යුත් තැපෑල (e-mail) හා අන්තර්ජාල භාවිතය (internet) ෆැක්ස් හා ජංගම දුරකථන භාවිතය ද දැකිය හැකිය. බොහෝ තේ වතු හිමියන් විසින් , භාණ්ඩ ලේඛන, ගිණුම්, සේවක තොරතුරු, නිෂ්පාදන ප්‍රමාණයන් හා කාර්යාලීය වාර්තා සකස් කර ගැනීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කරනු ලබයි (Hemarathna, 2008).

තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම, ඒ සඳහා ප්‍රවේශ වීම හා ඒ පිළිබඳ ඇති දැනුවත්භාවය පිළිබඳ සලකා බලන විට නාගරික අංශයට සාපේක්ෂව ග්‍රාමීය අංශය ඉතා පසුගාමී තත්ත්වයක හිඳී, සංවර්ධිත රටවල් හා සැසඳීමේ දී සංවර්ධනය වන රටවල, විශේෂයෙන් ශ්‍රී ලංකාව වැනි රටවල් තුළ පරිගණක ආශ්‍රිත දැනුම පහළ මට්ටමක පැවතීම වැනි විවිධ බාධාවන් නිසා තොරතුරු සන්නිවේදන තාක්ෂණය ප්‍රචලිත වීම ද අවම මට්ටමක පවතී. ශ්‍රී ලංකාව තුළ ද කර්මාන්ත හා සේවා අංශයන් හා සැසඳීමේ දී ද කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ සන්නිවේදන තාක්ෂණය භාවිතය අඩු මට්ටමක පවතින බව පෙනී. යයි එසේ වුවද පසුගිය වසර කිහිපය තුළ දී කෘෂිකර්මාන්තය තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීම වේගවත්

වර්ධනයක් දැකිය හැකි වේ. ඒ අනුව ගෙවීගිය වසර 10-15 අතර කාලය තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය වඩාත් සංවර්ධනීය මාවතකට ප්‍රවේශ වී ඇති අතර ඉන් මිදුණු කිසිදු මානව ක්‍රියාකාරකමක් සොයා ගැනීම ද ඉතාමත් දුර්ලභ කාරණයක් බවට පත් වී ඇත. කෘෂිකාර්මික ක්ෂේත්‍රය මෙන් ම ඒ හා බැඳුණු අනෙකුත් අංශයන් ද මෙම තත්ත්වයෙන් මිදී නොමැති බව පෙනී යයි. ග්‍රාමීය ගොවි ප්‍රජාවටත් එම ප්‍රජාවන් වෙනුවෙන් තීරණ ගන්නා පාර්ශවයන්ටත් ඉතාමත් ක්ෂණික ව නව තොරතුරු වෙත ප්‍රවේශ වීමේ හැකියාව වර්ධනය කිරීම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ වාසිදායක තත්ත්වයකි (USAID, 2003).

කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ මිල තොරතුරු සඳහා පවතින්නේ ඉතා ඉහළ ඉල්ලුමකි. නිෂ්පාදනය හා වෙළෙඳපොළ තීරණ සම්බන්ධයෙන් මිල තොරතුරු ප්‍රයෝජනයට ගැනීම සඳහා වැඩිහිටි ගොවීන්ට පුහුණුව අවශ්‍ය වන අතර අලෙවිකරණයේ දී අවශ්‍ය වන බොහෝ තොරතුරු නියමිත කාලයට හා නියමිත වේලාවට නො පැවතීමත් තොරතුරු වෙත ගොවීන්ට ප්‍රවේශ වීමේ අපහසුවකුත් පවතී (Rupasena,*et al* 2007).

සමස්තයක් ලෙස සැලකීමේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතයේ දී පවතින පොදු ගැටලු ලෙසින් හඳුනාගත හැක්කේ, ඩිජිටල් විප්ලවය සහ එහි ඇති සාධනීය අවස්ථාවන් පිළිබඳ බහුතර පිරිසකගේ ඇති නො දැනුවත්භාවය යි (not aware). එම නොදැනුවත්භාවය නිසා ම අදාළ තාක්ෂණයන් සහ තොරතුරු වෙතට ප්‍රවේශ වීමේ (access) හැකියාවත් ඒවායින් ප්‍රයෝජන ගැනීමේ හැකියාවත් අහිමි වී ඇත (Dilanthi, 2003).

කෙසේ වුව ද ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින රටවල සංවර්ධන ක්‍රමෝපායයන් යටතේ මිනිසුන්ගේ ජීවන තත්වය ගුණාත්මයෙන් ඉහළ මට්ටමක් කරා ප්‍රවේශ කරවීමටත්, දරිද්‍රතාව අවම කර මානව සංවර්ධනය ඇති කිරීමටත් අධ්‍යාපනය හා දැනුම හරහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හඳුන්වා දීම ප්‍රමුඛත්වයක් ගෙන ඇති අතර මානව වර්ගයාට තොරතුරු වෙත ළඟා වීමටත් එයින් ප්‍රයෝජන ගැනීමේ හැකියාව වර්ධනය කිරීමටත් අවශ්‍ය ප්‍රබල යටිතල පහසුකමක් ලෙස තොරතුරු හා සන්නිවේදනය හඳුනාගත හැකි ය (Dilanthi, 2003).

බොහෝ රටවල කෘෂිකර්මාන්තය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය උපයෝගී කරගැනීම පිළිබඳ පර්යේෂණයන් සිදු කර ඇති අතර එම පර්යේෂණයන් වැඩි වශයෙන් යොමු වී පවතින්නේ සාමාන්‍ය කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා වන පරිගණක භාවිතය පිළිබඳ ව වේ (Jayathilaka, H.A.C.K. *et al*, 2006).

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සඳහා අනුවර්තනය වීම, කෘෂි ක්ෂේත්‍රය තුළ ඉතා සීඝ්‍රයෙන් වර්ධනය වී ඇති බව ඉහත තොරතුරු අනුව පැහැදිලි වේ. කළමනාකරණයේදීත්, නිසි තීරණ ගැනීමේදීත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය බහුල ලෙස යොදා ගනිමින් ගෝලීය කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ නවතාවයක් ඇති කිරීමට එය සමත් වී ඇත. නමුත් ශ්‍රී ලංකාවේ කෘෂි ක්ෂේත්‍රය තුළ තත්ත්වය තරමක් දුරට වෙනස් වේ. ග්‍රාමීය ගොවීන් තුළ පවතින පරිගණක සාක්ෂරතාවය අඩුවීම, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ

123739

පුස්තකාලය
LIBRARY

භාවිතාවන් පිළිබඳ ගොවීන් තුළ පවතින සෘණ ආකල්පයන්, පුවත්පත්, සඟරා, පත්‍රිකා වැනි පාරම්පරික සන්නිවේදන ක්‍රමයන් සඳහා ඇති වැඩි නැඹුරුව සහ නව්‍යතාවයන් වෙත ඉතා ඉක්මනින් අනුවර්තනය වීමට ඇති මැලිකම වැනි සාධක නිසා සංවර්ධිත රටවලට සාපේක්ෂ ව ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මාන්තය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය උපයෝගී කරගැනීම තවදුරටත් සිදුවෙමින් පවතින ක්‍රියාවලියක් ලෙසින් හඳුනා ගැනීමට සිදුව ඇත (http://rural.nic.in).

2.4 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය පිළිබඳ අනෙකුත් රටවල අත්දැකීම්

ගෝලීයකරණය, පෞද්ගලීකරණය, විවෘත ආර්ථික ප්‍රතිපත්ති යටතේ "තොරතුරු" වඩාත් නිවැරදි හා කාලීන භාවයෙන් උචිත විය යුතු බැවින් අනෙකුත් අංශයන්ට පමණක් නොව කෘෂිකාර්මික අංශයට ද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ඉතා වටිනා නිෂ්පාදන සාධකයක් වී ඇත. නිවැරදිවූත් කාලීන වූත් තොරතුරු හරහා ඉල්ලුම් හා සැපයුම් අංශ අතර අන්‍යෝන්‍ය අවබෝධය වර්ධනය කළ හැකි අතර එතුළින් වෙළෙඳපොළ සමතුලිතතාව පවත්වා ගත හැකි වේ. එය තිරසාර කෘෂි නිෂ්පාදනයකට වඩාත් වැදගත් වේ (http://www.itfac.mrt.ac.lk). එසේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීම හරහා තොරතුරු වෙත ප්‍රවේශ වීමේ දී ඒ සඳහා වැය වන ගනුදෙනු පිරිවැය (transaction cost) අවම කර ගැනීමේ හැකියාව ද පවතී (http://www.lirne asia.net).

සංවර්ධනය වෙමින් පවතින රටවල කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙ හි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීමට ඇති හැකියාව පිළිබඳ සොයා බැලීමේ දී කරුණු කිහිපයක් මත එය රඳා පවතින බව සඳහන් වේ. එනම් නිෂ්පාදනයේ දී ගොවියා සතු දැනුම හා අවබෝධයත්, කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ සිටින අනෙකුත් පාර්ශවකරුවනුත් එකම පද්ධතියක් තුළ පාර්ශවකරුවන් බවට පත් වීම හරහා දැනුම කළමනාකරණය කිරීමේ පහසුකම් සැලසීම මඟින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගනිමින් තොරතුරු පහසුවෙන් ලබාදීමේ හැකියාව ඇති කළ හැකි වේ (Eric Rusten, *et al*.2003).

Ahammed (2006), අනුව ඉන්දියාවේ දැනුම පිළිබඳ විප්ලවීය වෙනසකට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය මූලික වන අතර සෑම ග්‍රාමයක ම රාජ්‍ය අංශය, තාක්ෂණික ආයතන හා සිවිල් ජනතාව එක් දැනුම් මධ්‍යස්ථානයක් ලෙස කේන්ද්‍රගත කිරීම හරහා එය සිදු කළ හැකි බව සඳහන් කර ඇත (htt://www. comminit.com).

ඉන්දියාවේ ග්‍රාමීය ගොවීන් සඳහා අවශ්‍ය තොරතුරු සපයා ගැනීම සඳහා "kiosk" නැමැති මධ්‍යස්ථාන මඟින් අන්තර්ජාල පහසුකම සපයා ඇති අතර ඒ සඳහා ප්‍රවේශ වීමේ එක් මාර්ගයක් ලෙස "e-choupal" නැමැති ප්‍රවේශය භාවිතා කරයි. ග්‍රාමීය මට්ටමේ තොරතුරු සපයා ගැනීමට සහය වන ජාලයන් වෙත ප්‍රවේශ වීමේ හොඳ ම මාර්ගය ලෙස මෙම "e-choupal" හඳුනාගෙන ඇත (Anon, 2006). මධ්‍යස්ථාන ක්‍රියාත්මක කරනු ලබන්නේ, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ පුහුණුව ලත් දේශීය ගොවීන් විසිනි. මෙවැනි ස්ථාන හරහා තොරතුරු සපයා ගන්නා ගොවීන් ගොවිපළ ක්‍රියාකාරකම් උසස් මට්ටමින් සිදු

කරගන්නා අතර නිෂ්පාදන අලෙවිය සිදු කරන්නේ කුමන අවස්ථාවන් හි ද, කුමන පාර්ශවයන්ට ද යන්න පිළිබඳ නිවැරදි තීරණ ගනු ලබය (www.unescap.org).

LEISA, (2002), අනුව දකුණු ඉන්දියාවේ පොන්ඩිචරි ප්‍රදේශයේ එම්.එස්. ස්වාමිනාදන් පර්යේෂණ පදනම මගින් තොරතුරු ගම්මාන ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති අතර, පොන්ඩිචරි ප්‍රදේශය අවට ගම්මාන 10ක් අන්තර්ජාලයට සම්බන්ධ තොරතුරු ජාලයකට සම්බන්ධ කිරීම හරහා ග්‍රාමීය ප්‍රජාවගේ සාමූහික සහභාගීත්වය තුළින් නවීන තාක්ෂණය භාවිතය වැඩි දියුණු කිරීම මෙහි අරමුණ වී ඇත. ග්‍රාමීය දිළිඳු ප්‍රජාවගේ ජීවන මට්ටම වැඩි දියුණු කිරීම සඳහා තොරතුරු තාක්ෂණය මගින් සැලකිය යුතු දායකත්වයක් සපයා ඇති මුත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී අන්තර්ජාලය තුළ දේශීය භාෂාවන් භාවිතා නො වීම, ග්‍රාමීය ප්‍රදේශවල පවතින විදුලිය හා දුරකථන අපහසුතා සහ දේශීය රාජ්‍ය නිලධාරින්ගේ තොරතුරු පිළිබඳ තමන් සතු කරගෙන ඇති ඒකාධිකාරය අත්හැරීමට ඇති අකමැත්ත ආදී ගැටළුසහගත තත්ත්වයන් එහි සාර්ථකත්වයට බාධා පමුණුවා ඇති බව සඳහන් කර ඇත. karthikeyan *et.al*, 2007 අනුව ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තයේ ගොවීන් සඳහා තොරතුරු හා දැනුම ලබා ගැනීමට පිහිටුවා ඇති “kuisan call center” පිළිබඳ සිදු කෙරී ඇති ඇගයීමකට අනුව, අධ්‍යයනයට ලක් වූ ගොවීන්ගෙන් මෙම මධ්‍යස්ථාන පිළිබඳ දැනුවත් වී ඇත්තේ, 23% ක් බවත්, දැනුවත් වී සේවය ලැබූ ගොවීන්ගෙන් බහුතරයක් එම මධ්‍යස්ථාන හරහා ලබා දෙන සේවය පිළිබඳව තෘප්තිමත් නො වන බවත් සඳහන් කර ඇත.

Anon, (2006) අනුව ඉන්දියානු කෘෂිකර්ම පර්යේෂණ ආයතනයට අයත් කෘෂිතාක්ෂණික තොරතුරු මධ්‍යස්ථානයන්ගෙන් ගොවීන්ට ඇති බලපෑම පිළිබඳ සිදු කර ඇති අධ්‍යයනයට අනුව, ගොවීන් විසින් කෘෂිකර්මාන්තය පිළිබඳ නව දැනුම ලබා ගැනීම, අලෙවිය හා ව්‍යවසායකත්ව හැකියාව වර්ධනය කරගැනීම, ආදායම් වැඩි කර ඉතුරුම් වැඩිකර ගැනීමටත්, ණය බරින් මිදීමටත් මෙම මධ්‍යස්ථානයන් ධනාත්මකව බලපා ඇත. නමුත් සේවය ලබා ගැනීමට ගොවීන් පැමිණෙන විට නිලධාරින් වෙනත් රාජකාරිවල යෙදී සිටීමෙන් අවශ්‍ය සේවාව නිසි පරිදි ලබා ගැනීමට නො හැකි වීම එහි දුර්වලතාවන් බව පෙන්වා දී ඇත.

ගොවි ප්‍රජාවගේ අධ්‍යාපනික මට්ටම, ගොවිපලේ ප්‍රමාණයන් සහ ගොවීන්ගේ වයස් මට්ටම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අනුවර්තනය වීම කෙරෙහි දැඩි ලෙස බලපානු ලබයි (Warren, 2002). එසේ ම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය කෙරෙහි අනුවර්තනය වීමේ දී යම් යම් බාධාවන් ද පවතී. එම බාධාවන් නිසා ගොවීන්ට ඉතා ඉක්මනින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය වෙත නැඹුරු වීමට නො හැකි වී ඇත. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ පවතින අඩු සාක්ෂරතාවය, එයින් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ පවතින අඩු දැනුම, භාවිතා කිරීමේ දී පවතින අපහසුතාවය, තාක්ෂණික යටිතල පහසුකම් අඩුවීම, තාක්ෂණික පිරිවැය, තොරතුරු තාක්ෂණික ක්‍රමයන් පිළිබඳ ඇති විශ්වාසනීයත්වය අඩුවීම, පුහුණුව අඩුවීම, සහ ගොවීන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීමේ දී එම පද්ධතීන් හි පවතින ඒකාබද්ධතාව සහ මෘදුකාංග සැපයීමේ සීමාසහිතභාවය එම බාධාවන් ලෙස හඳුනාගෙන ඇත (Taragola and Gelb, 2005). කෙසේ වුව ද ලෝකයේ කෘෂිකාර්මික රටවල කෘෂිකර්මාන්තය කෙරෙහි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විවිධාකාරයෙන් භාවිතා කරමින් කෘෂි අංශයේ සංවර්ධනය අපේක්ෂා කරන බව පෙනී යයි. කෙන්යාවේ, වෙළෙඳපොළ පිළිබඳ දැනුම හා තොරතුරු ඉතාමත් සාර්ථක ලෙස සැපයීම සඳහා තොරතුරු

තාක්ෂණය යොදා ගන්නා අතර පිලිපීනයේ ද ග්‍රාමීය අංශය තුළ කෘෂිකාර්මික තොරතුරු සැපයීම සඳහා නව තාක්ෂණය උපරිම ලෙස යොදා ගනු ලබයි. එසේ ම තායිලන්තයේ බහු–භාෂා ජාලය (multilingual network portal), කෘෂිකාර්මික තොරතුරු ජාලය (agricultural information network) වැනි ජාලයන්ට ප්‍රවේශ වීම හරහා ග්‍රාමීය ගොවීන්ට ක්ෂේත්‍ර නිලධාරීන්ට ප්‍රතිපත්ති සම්පාදකයින්ට සහ රාජ්‍ය අංශයට අවශ්‍ය කෘෂිකාර්මික තොරතුරු සපයා ගැනීමේ හැකියාව ලබා ගෙන ඇත.

කෙසේ වුව ද ආසියානු කලාපීය දියුණු වෙමින් පවතින රටවලට නවයතාවන් (innovations) හඳුන්වා දීමේ දී යම් දුෂ්කරතා පැණ නැගුණ ද වර්තමානය වන විට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, සෘජුව හෝ වක්‍රව තොරතුරු හුවමාරු කිරීමේ කාර්යයේ දී ප්‍රමුඛස්ථානය ගෙන ඇති බව පෙනේ (Abdon and Robert, 2004).

2.4.1 ග්‍රාමීය කෘෂිකාර්මික ක්ෂේත්‍රය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය

ග්‍රාමීය සංවර්ධන ප්‍රවේශයන් හි මූලික අරමුණ වන්නේ, ග්‍රාමීය කෘෂි සමාජයන් හි වෙසෙන ඉතාමත් පහළ මට්ටමේ ජීවන තත්වයෙන් යුතු කොටස් උසස් ජීවන තලයක් කරා මෙහෙයවීම යි. මෙම සංවර්ධන ප්‍රවේශයන් විවිධ ක්ෂේත්‍ර යටතේ විවිධ අයුරින් ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකාවේ මෑතකාලීන ග්‍රාමීය සංවර්ධන ප්‍රවේශයක් ලෙස, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හරහා ග්‍රාමීය ගොවීන්ට තොරතුරු හා දැනුම සැපයීමේ වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරනු ලබන්නේ, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒජන්සිය (ICTA), කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (DOA.), විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය, ගැමි දිරිය ව්‍යාපෘතිය සහ සර්වෝදය ව්‍යාපාරය වැනි රාජ්‍ය ආයතන වේ (http://www.rural.nic.in).

2.4.1.1 ඊ - ශ්‍රී ලංකා වැඩ සටහන (e -sri lanka initiative).

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජනතාව ගෝලීය වශයෙන් (global society) සම්බන්ධ කරගැනීමේ ප්‍රධාන අරමුණ ඇතිව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒජන්සිය (ICTA) විසින් ඊ - ශ්‍රී ලංකා වැඩසටහන ආරම්භ කර ඇත. ග්‍රාමීය ගොවි ප්‍රජාවගේ දරිද්‍රතාව අඩු කිරීම හරහා ජීවන තත්වය උසස් මට්ටමක් කරා ළඟා කර ගැනීම සඳහා තොරතුරු තාක්ෂණය උපයෝගී කරගැනීම මෙම වැඩසටහන යටතේ සිදු වේ. ප්‍රජා ප්‍රතිලාභී ව්‍යාපෘති (community benificiary project) සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගනිමින් දුෂ්කර ප්‍රදේශයන්හි ග්‍රාමීය ජනතාවගේ තොරතුරු අවශ්‍යතාව සපුරාලීමත් ගැටලු විසඳා ගැනීමේ හැකියාවත් ඇති කිරීම මෙම වැඩසටහන හරහා සිදු කෙරේ (http://www.rural.nic.in).

ග්‍රාමීය ජනයාගේ ආහාර සුරක්ෂිතතාව වර්ධනය කිරීම සඳහා මෙම වැඩසටහන්වල දායකත්වය උපරිමයෙන් ලැබෙන අතර, එය කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ පුළුල් දියුණුවට සෘජුව ම බලපානු ලබයි. ජනතාවගේ වැඩි නැඹුරුතාව, ඔවුන්ගේ දක්ෂතාවයන්, විභවතාවන් මත ඊ – සොසයිටි (e-society) සඳහා ගොවීන්ව දායක කර ගැනීම ද මෙමඟින් සිදුවේ. මෙම ඊ – සොසයිටි හරහා ග්‍රාමීය ගොවිජනතාව අත්‍යවශ්‍ය වන තොරතුරු,

එනම් බෝග සඳහා වැළදෙන පළිබෝධ රෝග, නව තාක්ෂණික දැනුම , වැඩි දියුණු කළ ප්‍රභේද පිළිබඳ තොරතුරු හා වර්තමාන වෙළෙඳපොළ තත්ත්වය පිළිබඳ තොරතුරු ගොවියාට ලබාදීම සිදු කෙරේ.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒජන්සියේ ඊ – සොසයිටි හරහා ක්‍රියාත්මක කරන ලද සාර්ථක නව ව්‍යාපෘති පහත පරිදි වේ.

- **ග්‍රාමීය මට්ටමින් කිරි නිෂ්පාදිතය ඉහළ නැංවීම**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ "දඹදෙනිය සංවර්ධන පදනමේ (Dambadeniya Development Foundation)" අරමුදල් යටතේ, අලව්ව, නාරම්මල යන ග්‍රාමයන් හි මෙම වැඩසටහන ආරම්භ කර ඇත. ගොවීන්ට අවශ්‍ය තොරතුරු පහසුවෙන් ව්‍යාප්ත කිරීම සඳහා ඉතා පහසු ක්‍රම කිහිපයක් ද හඳුනා ගෙන ඇත. එනම්,

- අදාළ දත්ත හා තොරතුරු දේශීය භාෂාවන්ගෙන් නිර්මාණය කිරීම
- ජංගම දුරකථන මගින් කෙටි පණිවිඩ හරහා තොරතුරු ලබා ගැනීම වැනි දේ වර්ධනය කිරීම.
- විදුලිය නොමැති ප්‍රදේශවල සූර්යතාපය උපයෝගී කරගනිමින් සී.ඩී.එම්.ඒ. (CDMA) දුරකථන යොදා ගනිමින් අන්තර්ජාලය හා සම්බන්ධ වීමේ හැකියාව ඇති කිරීම.
- ජංගම දුරකථන හෝ සී.ඩී.එම්.ඒ. (CDMA) සම්බන්ධතාවකින් තොරව තිරය ස්පර්ශ කිරීමෙන් (touch screen) පාලනය කළ හැකි පරිගණක ජාලයක් පොදු ස්ථානවල ස්ථාපිත කිරීම (http://telecenter community.ning.com).

2.4.1.2 අන්තර්ජාලය පදනම් කරගත් කෘෂි අධ්‍යාපන ක්‍රම **(e-learning system)**

කෘෂිකර්ම දෙපාර්තුමේන්තුවේ ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථානය මගින් මෙම අන්තර්ජාලය පදනම් කරගත් කෘෂි අධ්‍යාපන ක්‍රම ආරම්භ කර ඇත. කෘෂිකාර්මික සේවයට අදාළ සියලු තොරතුරු රැස්කිරීම මෙහි අරමුණ වී ඇත. මෙමගින් තොරතුරු ලබා ගැනීම සඳහා http://www.govia.lk යන වෙබ් අඩවිය භාවිතා කළ හැකි ය. දේශීය භෝග පිළිබඳ විශේෂිත තොරතුරු මෙහි අඩංගු වේ. මෙහි අන්තර්ගතය නිරන්තරයෙන් තොරතුරු හා දැනුමෙන් සංවර්ධනය කිරීම සඳහා තොරතුරු එක් කිරීම (added) නිවැරදි කිරීම (edit) වෙනස් කිරීම (changed) හෝ ඉවත් කිරීම (deleted) කිරීම සිදු කෙරේ. විකිපීඩියා (wikipidia) නමින් යුත් මෙම මෙහෙයුම් පද්ධතියේ ආරම්භක පිටුව නිවැරදි කිරීමේ අයිතිය පරිපාලන නිලධාරීට පැවරී ඇති අතර ඇතුළු පිටු නිවැරදි කිරීමට යෝජනා කිරීම කෘෂිකර්ම උපදේශකවරුන්ට සහ ගොවීන්ට අයත් වේ. මෙහි අවසන් ප්‍රතිඵලය ලෙස අපේක්ෂා කරනු ලබන්නේ කාර්යක්ෂම ලෙස තොරතුරු හා දැනුම එක්රැස් කිරීම වේ (http://telecenter community.ning.com).

2.4.1.3. ගොවි සහන සරණ සේවාව (1920)

වර්ෂ 2006 දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රව්‍ය–දෘශ්‍ය මධ්‍යස්ථානයේ ස්ථාපිත කර ඇත. ගොවි සහන සරණ සේවය නමින් ද හැඳින්වෙන මෙම සේවය කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයට වඩා පහසුවක් ඇති කර තිබේ. මෙම සේවය හරහා 1920 දුරකථන අංකය ඔස්සේ නොමිලේ උපදෙස් ලබා ගැනීමේ හැකියාව පවතී. ලංකාවේ ඕනෑම ප්‍රදේශයක ගොවියෙකුට ඕනෑම දුරකථන මාර්ගයක් හරහා මෙම සේවා පහසුකම් ලැබිය හැකිය. පෙ.ව. 8.30 සිට ප.ව. 4.30 දක්වා මෙයින් සේවය ලබා ගත හැකි ය. ගොවීන් අතරත් සාමාන්‍ය ජනතාව අතරත් මෙම සේවාව වඩාත් ජනප්‍රිය වී ඇති බව පෙනී යන්නේ, දිනක දී මෙම සේවය ලබා ගැනීමේ වාර ගණනෙහි සාමාන්‍ය අගය 350 ක් බව සඳහන් වීම හේතුවෙනි. සතියක් තුළ දී ගැටලු ඉදිරිපත් කිරීමේ වාර ගණන සැලකිල්ලට ගනිමින් එම සතියට අදාළ ප්‍රධාන ගැටලුව හඳුනා ගෙන රූපවාහිනී වැඩසටහන් හරහා එම ගැටලුවට අදාළව විසඳුම් ද සාකච්ඡා කෙරේ (Wijekoon. 2009).

2.4.1.4. කෘෂි තාක්ෂණික උද්‍යාන

කඩිනමින් කෘෂිකාර්මික තොරතුරු ගොවීන් වෙත ලබා දීමේ අරමුණින් 2005 වර්ෂයේ දී ශ්‍රව්‍ය–දෘශ්‍ය මධ්‍යස්ථානය විසින් ගන්නොරුව කෘෂිකර්ම සංකීර්ණයේ මෙම උද්‍යානය පිහිටුවා ඇත. 2007 වර්ෂයේ දී හම්බන්තොට දිස්ත්‍රික්කයේ දෙවැනි කෘෂි තාක්ෂණික උද්‍යානය ස්ථාපිත කර ඇත. දිනක දී මෙම උද්‍යානයන් නැරඹීමට පැමිණෙන දහසක් පමණ වන ජනතාවට කෘෂිකාර්මික තොරතුරු ලබා දීම සඳහා ජීවී ආදර්ශන, උපදෙස් පත්‍රිකා, උපදේශන පුවරු, සී.ඩී. තැටි උපයෝගී කරගෙන ඇත (Wijekoon 2009).

උද්‍යාන නැරඹීම සඳහා පැමිණෙන ජනතාවගේ අවශ්‍යතාවන් සඳහා සයිබර් කෘෂිකාර්මික තොරතුරු ඒකකයන්, බීජ හා රෝපණ ද්‍රව්‍ය මිල දී ගැනීමේ මධ්‍යස්ථානයත්, ග්‍රන්ථ හා ප්‍රකාශන මිල දී ගැනීමේ කුටිත් උද්‍යානය තුළ පිහිටුවා ඇත.

මෙම කෘෂි තාක්ෂණික උද්‍යානයන් හි ප්‍රධාන අරමුණ වී ඇත්තේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව යන අංශයන් හි නව නිර්දේශයන් පිළිබඳ කෘෂිකාර්මික ක්ෂේත්‍රය පිළිබඳ දැනුවත් ගොවීන් වෙත ප්‍රදර්ශනය කිරීම යි.

ග්‍රාමීය ගොවීන්ගේ විවිධ වූ තොරතුරු අවශ්‍යතාවයන් සඳහා පෞද්ගලික අංශයේ ආයතන විසින් ද විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. වගාකිරීමේ දී අවශ්‍ය වන නව දැනුම අලෙවි තොරතුරු බැංකු කටයුතු පිළිබඳ ගොවීන්ට තොරතුරු ලබා දීම මේ හරහා සිදු කෙරේ.

2.4.1.5 "නව ගොවියා" වැඩසටහන

CIC කෘෂිරසායන ආයතනය මඟින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. අනුරාධපුරය, මාතලේ, බදුල්ල මොණරාගල සහ නුවර යන දිස්ත්‍රික්කවල නව ගොවියා වැඩසටහනට ක්‍රියාත්මක කරන අතර කෘෂිකාර්මික

ක්ෂේත්‍රයට අදාළ නව දැනුම සිංහල හා දෙමළ භාෂාවන් උපයෝගී කරගෙන ගොවීන්ට ලබා දීම හරහා නිෂ්පාදනය හා එහි ගුණාත්මය වැඩි කිරීම ව්‍යාපෘතියේ අරමුණ වී ඇත. නව වගා දැනුම ලබාදීම, වගාවන්ට සුදුසු බෝග තෝරා ගැනීම, ඉඩම් භාවිතයේ දී ඉඩම සැලසුම් කිරීම පළිබෝධනාශක භාවිතය හා පොහොර භාවිතය, වගා කළමනාකාරණය, අස්වැන්න නෙළීම පසු අස්වනු තාක්ෂණය යන අංශ යටතේ ගොවියා වෙත දැනුම ලබාදීම සිදු වේ. මීට අමතර ව ගොවීන්ගේ ගොවිපළ ව්‍යාපාරික හැකියාව වර්ධනය කිරීමේ අරමුණින් වෙළෙඳපොළ අවස්ථා, බැංකු කටයුතු සහ නිෂ්පාදන අපනයනය පිළිබඳ තොරතුරු ද ලබා දේ. නව ගොවියා වැඩසටහනෙ හි අන්තර්ගතය පෝෂණය කිරීම සඳහා සිද්ධි අධ්‍යයනයන්, ආදර්ශනයන්, ආකර්ශනීය හා භාවිතය පහසු ආකාරයේ වීඩියෝ පට, ඇනිමේශන් සහ ග්‍රැෆික්ස් යන පරිගණක ක්‍රමයන් භාවිතා කර ඇත. මෙම වැඩසටහන් මගින් තිරසාර කෘෂිකර්මාන්තයක් සඳහා අවශ්‍ය වන ස්වභාවික අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය, යෝග්‍ය තාක්ෂණය භාවිතය, නිර්දේශිත අයුරින් පොහොර යෙදීම, පසේ සාරවත්භාවය වැඩිකිරීම ඒ හරහා ඉහළ අස්වැන්නක් ලබාගැනීම හා වගාවට උචිත පරිසරයක් සකස් කරගැනීමට අවශ්‍ය දැනුම හා තොරතුරු ගොවියා වෙත ලබා දීම සිදු කෙරේ (http://telecenter community.ning.com).

2.4.1.6 කෙටි පණිවිඩ (SMS) භාවිතයෙන් භාණ්ඩ වෙළෙඳාම සිදුකිරීම

ජංගම දුරකථන උපයෝගී කරගනිමින් කෙටි පණිවිඩ හරහා ගොවියාට නව නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ නිර්මාණය කරගැනීමට හැකියාව ලබාදීමේ අරමුණ ඇතිව සර්වෝදය ව්‍යාපාරය විසින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කර ඇත. මෙමගින් ග්‍රාමීය ගොවීන්ට තම නිෂ්පාදන සඳහා අවශ්‍ය වෙළෙඳපොළ සකස් කෙරෙන අතර වෙළෙඳපොළ පරිසරයේ වර්ධනයක් ද සිදු වේ. කෙටි පණිවිඩයක් හරහා විකුණුම්කරුවා සහ ගැණුම්කරුවා හමුවන අතර එම දෙපාර්ශවයේ අවශ්‍යතාවය එහි දී සඳහන් කළ හැකි ය. මෙහි දී විකුණුම් කරුවාගේ නිෂ්පාදනය හා දිස්ත්‍රික්කයටත් ගැණුම්කරුවාගේ අවශ්‍යතාවයට හා දිස්ත්‍රික්කයටත් සම්බන්ධ වීමට අවශ්‍ය තොරතුරු ලබාදීම සිදු වේ. මෙම සේවාව මහනුවර දිස්ත්‍රික්කයේ සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ සිදු කෙරේ (http://telecenter community.ning.com).

තෙවැනි පරිච්ඡේදය
සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති ඒකක

3.1 හැඳින්වීම

සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්තිය යනු කුමක් ද යන්න පිළිබඳවත්, එම ඒකකයන් ස්ථාපිත කිරීම හා එහි ක්‍රියාකාරීත්වය පිළිබඳවත්, නිලධාරීන්ට ලබා දුන් පුහුණුව හා ඒකකයන් හි අධීක්ෂණය පිළිබඳවත් වූ වත්මන් තත්ත්වය පිළිබඳ ව මෙම පරිච්ඡේදයේ දී විමසුමට ලක් කෙරේ.

3.2 සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාව

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කරමින් ඉලෙක්ට්‍රොනික සන්නිවේදනය කෙරෙන පරිසරයක් තුළ අන්තර් සම්බන්ධතාවයක් සහිත පරිගණක ජාලයක් හරහා කෘෂිකාර්මික තොරතුරු හුවමාරු කරගැනීමේ තාක්ෂණයක් ලෙස ඉලෙක්ට්‍රොනික් සන්නිවේදන මෙවලම් හරහා සිදු කෙරෙන මෙම ව්‍යාප්ති සේවය හඳුනාගත හැකි අතර පරිගණක, අන්තර්ජාලය හා අන්තර් ක්‍රියාකාරී බහු මාධ්‍යයන් භාවිතා කරමින් අවශ්‍ය තොරතුරු හුවමාරු කරගැනීමේ කාර්යය පහසුවෙන් ඉටු කරගැනීමට මේ හරහා හැකියාව ලැබේ (Wijekoon, 2009).

පර්යේෂණ හා ව්‍යාප්ති සේවාවන් හි ඵලදායිතාව හීන වීම ග්‍රාමීය කෘෂිකාර්මික සංවර්ධනයේ දී ප්‍රබල ගැටලුවක් ලෙස ඉස්මතු වී ඇත. ව්‍යාප්ති සේවය, පර්යේෂණ, අලෙවි ජාලයන් හා ගොවීන් අතර පවතින දුර්වල සම්බන්ධතාවය මෙයට බලපාන ප්‍රධාන හේතු ලෙස හඳුනාගෙන ඇත. එයට පිළියම් සෙවීමේ අරමුණින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය උපයෝගී කරගනිමින් ග්‍රාමීය මට්ටමේ ගොවීන්ට කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළ තොරතුරු හා දැනුම ඉතා කඩිනමින් ලබා ගැනීමේ ක්‍රමවේදයක් ලෙසින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රව්‍ය – දෘශ්‍ය මධ්‍යස්ථානය විසින් සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය හඳුන්වා දී ඇත. සයිබර් කෘෂිකර්මික ව්‍යාප්ති සේවය සැපයීම සඳහා ගොවිජන සේවා මධ්‍යස්ථානයේ කෘෂිකර්ම උපදේශක කාර්යාලය තුළ පරිගණකය හා ඊට අදාළ අනෙකුත් උපාංග දුරකථනය සහ අන්තර්ජාල පහසුකම් ඇතුළු ව තොරතුරු හා දැනුම ලබාගත හැකි ඒකකයක් ස්ථාපිත කර ඇත. එය සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති ඒකකය නමින් හඳුන්වනු ලබයි.

3.3 සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති ඒකක ස්ථාපිත කිරීම

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු අංශය යටතේ ස්ථාපිත කොට ඇති ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථානය විසින් 2004 වර්ෂයේ දී සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති ඒකක පිහිටුවීමේ වැඩසටහන ආරම්භ කර ඇත. ග්‍රාමීය කෘෂිකාර්මික අංශය තුළ ව්‍යාප්ති සේවයෙ හි පවතින අකාර්යක්ෂමතාවය අවම කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය උපයෝගී කරගනිමින් ග්‍රාමීය ගොවීන්ට කෘෂිකාර්මික දැනුම හා තොරතුරු සැපයීමේ ක්‍රමවේදයක් ලෙසින් මෙම වැඩසටහන ආරම්භ කර ඇත. දිස්ත්‍රික්ක 21ක් ආවරණය වන සේ කෘෂිකර්ම උපදේශක කාර්යාලවල තෝරාගත් කෘෂිකර්ම උපදේශක මහතුන් යටතේ සයිබර් ඒකක ස්ථාපිත කර ඇත. 2004 වර්ෂයේ දී කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ මූල්‍ය ප්‍රතිපාදන මත

සයිබර් ඒකක 25ක් ආරම්භ කර ඇති අතර ධාන්‍යාගාර වැඩසටහන ද ඊට දායක වී ඇත. 2005 වර්ෂය වන විට නැවතත් කාප් ආයතනයේ දායකත්වයෙන් ඒකක 13ක් ස්ථාපිත කර ඇත. 2006 වර්ෂය වන විට ධාන්‍යාගාර වැඩසටහන යටතේ සයිබර් ඒකක 06ක් ද කාප් ආයතනය සහ ධාන්‍යාගාර වැඩසටහන යන දෙකෙහි ම මූල්‍ය දායකත්වය මත තවත් ඒකක 07ක් ද ස්ථාපිත කර ඇත. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒජන්සිය හා ජයිකා, වර්ල්ඩ් විෂන් (World Vision) යන රාජ්‍ය නො වන සංවිධාන යටතේ සයිබර් ඒකක 04ක් ද ස්ථාපිත කර ඇති අතර 2010 වර්ෂය වන විට ස්ථාපිත මුළු සයිබර් ඒකක ප්‍රමාණය 55කි. සයිබර් ඒකක ස්ථාපිත කිරීම සඳහා මූල්‍ය දායකත්වය සැපයීමේ කාර්යයේ දී කාප් ආයතනය සහ ධාන්‍යාගාර වැඩසටහන මූලිකව ම කටයුතුකර ඇත. පහත දැක්වෙන්නේ එක් එක් දිස්ත්‍රික්කයන්ට අයත් සයිබර් ඒකක සහ ඒවා ස්ථාපිත කිරීමට මුල් වූ ආයතන පිළිබඳ තොරතුරු වේ.

වගු අංක 3.1 : ස්ථාපිත සයිබර් ඒකක, වර්ෂය සහ අනුග්‍රහය සැපයූ සංවිධාන

අනු අංකය	දිස්ත්‍රික්කය	අනු අංකය	සයිබර් ව්‍යාප්ති ඒකක	ස්ථාපිත වර්ෂය	අනුග්‍රහය සැපයූ සංවිධානය
01	අම්පාර	1	දමන	2006 පෙබරවාරි	GAP
		2	මායාදුන්න	2007 නොවැම්බර්	GAP
		3	නින්තවූර්	2004 ඔක්තෝබර්	GAP
		4	සමන්තුරෙයි	2006 පෙබරවාරි	GAP
		5	උහන	2004 ඔක්තෝබර්	GAP
		6	වච්නියා	2004 ඔක්තෝබර්	GAP
02	අනුරාධපුර	7	අනුරාධපුර	2005 ජූනි	CARP
		8	කහටගස්දිගිලිය	2005 ජූනි	CARP
		9	පදවිය	2007 නොවැම්බර්	CARP
		10	රාජාංගනය දකුණු ඉවුර	2004 ඔක්තෝබර්	JICA
		11	රාජාංගනය වම් ඉවුර	2008 ජූනි	JICA
		12	රඹෑව	2008 ජූනි	JICA
		13	ශ්‍රාවස්තිපුර	2006 පෙබරවාරි	GAP
03	බදුල්ල	14	කැප්පෙටිපොළ	2005 ජූනි	CARP
04	මඩකලපුව	15	මඩකලපුව	2004 ඔක්තෝබර්	CARP
05	කොළඹ	16	රත්මලාන	2004 ඔක්තෝබර්	CARP
06	ගාල්ල	17	ලබුදුව	2005 ජූනි	CARP
07	ගම්පහ	18	කැළණිය	2004 ඔක්තෝබර්	CARP
		19	උඩරාපොළ	2004 ඔක්තෝබර්	CARP
08	හම්බන්තොට	20	අම්බලන්තොට	2004 ඔක්තෝබර්	CARP
		21	කල්තොට	2007 නොවැම්බර්	CARP
		22	මීගහජඳුර	2005 ජූනි	CARP
		23	වීරකැටිය	2006 පෙබරවාරි	CARP
		24	වීරවිල	2005 ජූනි	CARP
		25	යෝධකණ්ඩිය	2007 නොවැම්බර්	GAP
09	කළුතර	26	කළුතර	2005 ජූනි	CARP

10	නුවර	27	පුහුණු හා ව්‍යාප්ති අංශය	2004 ඔක්තෝබර්	GAP
		28	මහියංගනය	2004 ඔක්තෝබර්	GAP
		29	මාරස්සන	2004 ඔක්තෝබර්	GAP
		30	පූජාපිටිය	2004 ඔක්තෝබර්	GAP
11	කෑගල්ල	31	අබේපුස්ස	2004 ඔක්තෝබර්	CARP
		32	බැමිණිවත්ත	2004 ඔක්තෝබර්	CARP
12	කුරුණෑගල	33	මහව	2004 ඔක්තෝබර්	GAP
		34	ආර්.ආර්.ඩී.අයි.	2004 ඔක්තෝබර්	GAP
13	මන්නාරම	35	මන්නාරම	2004 ඔක්තෝම්බර්	GAP
14	මාතලේ	36	දඹුල්ල	2005 ජුනි	CARP
		37	විශේෂිත ආර්ථික කලාපය	2008 ජනවාරි	ICTA
		38	හෙට්ටිපොළ - හසලක	2004 ඔක්තෝම්බර්	GAP
15	මාතර	39	කඹුරුපිටිය	2005 ජුනි	CARP
16	මොණරාගල	40	ඔක්කම්පිටිය	2006 පෙබරවාරි	GAP
		41	සියඹලාණ්ඩුව	2007 නොවැම්බර්	GAP
		42	තෙලුල්ල	2004 ඔක්තෝබර්	CARP
17	නුවරඑළිය	43	හඟුරන්කෙත	2004 ඔක්තෝබර්	CARP
		44	කඳපොළ	2004 ඔක්තෝබර්	CARP
18	පොළොන්නරුව	45	බකමූණ	2006 පෙබරවාරි	GAP
		46	හිඟුරක්ගොඩ	2006 පෙබරවාරි	GAP
		47	මැදිරිගිරිය	2004 ඔක්තෝබර්	GAP
		48	නවනගරය	2004 ඔක්තෝබර්	GAP
		49	පුලස්තිගම	2008 ජුනි	GAP
19	පුත්තලම	50	ඉගිනිමිටිය	2005 ජුනි	CARP
		51	පාලකුඩා	2007 නොවැම්බර්	World Vision
20	රත්නපුර	52	ඇඹිලිපිටිය	2005 ජුනි	CARP
		53	නිවිතිගල	2005 ජුනි	CARP
		54	රාස්සගල	2005 ජුනි	CARP
21	ත්‍රිකුණාමලය	55	කන්තලේ	2004 ඔක්තෝබර්	GAP

මූලාශ්‍රය: ශ්‍රව්‍ය-දෘෂ්‍ය මධ්‍යස්ථානය, (2010).

සයිබර් ඒකක ස්ථාපිත කිරීමේ වැඩසටහන අදියර දෙකක් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර, පළමු අදියරේ දී තෝරාගත් කෘෂිකාර්මික ප්‍රදේශයන් හි සයිබර් ව්‍යාප්ති ඒකක ස්ථාපිත කර ඇත. ස්ථාපිත කරන ලද ඒකකයන් හරහා ව්‍යාප්ති ක්‍රමෝපායන් 5ක් ක්‍රියාවේ යොදවා ඇත. එනම්,

3.3.1. පළමු අදියර

01. අන්තර් ක්‍රියාකාරී බහුමාධ්‍ය සී.ඩී. තැටි ලබා දීම සිදු කිරීම.

    මේ යටතේ බෝගය පිළිබඳ ව ගොවීන් තුළ කුසලතාවය හා දැනුම වර්ධනය කරගැනීමට අවශ්‍ය තාක්ෂණය හා දැනුම ලබාදීම සිදු කිරීම.

02. කෘෂිකර්ම උපදේශකවරයාගේ ඉගැනුම් කුසලතාවය වර්ධනය කිරීම.

මේ යටතේ ඒකකයේ පහසුකම් උපයෝගි කරගැනීමට සී. ඩී. තැටි වැඩි දියුණු කිරීම හා නිෂ්පාදනය කිරීම.

03. කෘෂිකර්ම දෙපාර්තුමේන්තුවේ වෙබ් අඩවියක් වන (www.agrideptgov.lk) මගින් කෘෂිකර්මාන්තයට අදාළ තොරතුරු ලබා දීම.

04. සී. ඩී. තැටි නිෂ්පාදනය කර ඇත්තේ ජාතික මට්ටමින් බැවින් ප්‍රාදේශීය ගැටලු සඳහා එහි දැනුම අන්තර්ගත නොවේ. එබැවින් සරල තාක්ෂණික ව්‍යාප්ති ක්‍රමවේදයන් (පවර්පොයින්ට් ඉදිරිපත් කිරීම් අත්පත්‍රිකා, කුඩා පොත්) භාවිතා කරමින් ප්‍රාදේශිය මට්ටමේ ගැටලු සඳහා දැනුම ලබාදීම.

05. කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන්ට (කෘ.ප.නි.ස.) කෘෂි කර්මාන්තය පිළිබඳ දැනුම හා කුසලතාවය ලබාදීමට සයිබර් ඒකකයන් හි පහසුකම් උපයෝගී කරගැනීම.

3.3.2 දෙවැනි අදියර

කාලීනව සන්නිවේදන ක්ෂේත්‍රයේ සිදු වන ප්‍රවර්ධනයට අනුව ජනතාව අතර අන්තර්ජාල පහසුකම් ජනප්‍රිය වීමත් සමග සයිබර් ඒකක සඳහා ද අන්තර්ජාල පහසුකම් සැපයීමේ වැඩපිළිවෙළක් සයිබර් ඒකක පිහිටු වීමේ දෙවන අදියරේ දී සිදුකර ඇත. ඒ අනුව 2007/2008 වර්ෂයන් හි දී සයිබර් ඒකක 40 ට දුරකථන හා අන්තර්ජාල පහසුකම් සපයා ඇත. පහත දැක්වෙන්නේ දුරකථන පහසුකම් සහ අන්තර්ජාල පහසුකම් ලබා දුන් සයිබර් ඒකක සහ ඊට අදාළ තොරතුරු වේ.

වගු අංක 3.2 : දුරකථන හා අන්තර්ජාල පහසුකම් ලබා දුන් සයිබර් ඒකක

සයිබර් ඒකකය	දුරකථන අංකය
කහටගස්දිගිලිය	0602806643
රාස්සගල	0602454681
නිවිතිගල	0602454682
බැමිණිවත්ත	0602354295
අඟිබිපුස්ස	0602354293
යටිවාවල	0602801083
මාරස්සන	0602801082
හගුරංකෙත	0602801081
කඹුරුපිටිය	0602405262
ලබුදුව	0602902977
වීරකැටිය	0602484091
මීගහජඳුර	0602484090
කන්තලේ	0602269986

නවනගරය	0602279956
මිද්දෙනිය	0602279957
රාජාංගනය	0602259962
හෙට්ටිපොළ	0602559962
බකමූණ	0602279958
හිඟුරක්ගොඩ	0602279959
ඔක්කංපිටිය	0602579953
ශ්‍රාවස්තිපුර	0602259963
ඇඹිලිපිටිය	0602459957
කන්දපොළ	0602539950
තෙල්ලුල	0602579952
කැප්පෙටිපොළ	0602559962
අනුරාධපුර	0602259967
ඌරාපොළ	0602838609
කළුතර	0602348550
ඉගිනිමිටිය	0602329977
දඹුල්ල	0602668516
වැවින්න	0602639954
වීරවිල	0602489872
උහන	0602639984
නින්තවූර්	0602639983
මඩකලපුව	06026558532
අම්බලන්තොට	0602489862
මහව	0602979742
මන්නාරම	0602239970
දඹාන	0602639978
කැලණිය	0112925211

මූලාශ්‍රය : ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථානය, (2010).

සයිබර් ව්‍යාප්ති ඒකක සඳහා අන්තර්ජාල සහ දුරකථන පහසුකම් ලබා දීම හරහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහ වෙනත් දේශීය මෙන් ම විදේශීය වෙබ් අඩවි හරහා තොරතුරු වෙත ළඟා වීමේ හැකියාව ඇති කිරීම අපේක්ෂා කර ඇත.

එසේ ම ප්‍රදේශය තුළ වගාවන් හි නව රෝගයක් පැතිර ගිය හොත් ඉතා ඉක්මනින් ඒ සඳහා විසඳුම් සොයා ගැනීමට සයිබර් ඒකක ය වෙත ලබා දී ඇති ඩිජිටල් කැමරාව උපයෝගී කරගෙන ඡායාරූප රැගෙන ස්කෑන් කර ඊට අදාළ විශේෂඥයන් වෙත හෝ පර්යේෂකයන් වෙත යැවීම හරහා ගැටලුවට විසඳුම් ලබා ගැනීම මෙම පහසුකම් ලබා දීම හරහා බලාපොරොත්තු වී ඇත.

එසේ ම, අන්තර්ජාල හා දුරකථන පහසුකම් ඒකකයන් වෙත ලබාදීම හරහා ගොවීන් මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් වන වෙළෙඳපොළ තොරතුරු ඌනතාවයට විසඳුම් සෙවීමට වෙළෙඳපොළ තොරතුරු පිළිබඳ ගොවි දත්ත පද්ධති සකස් කිරීමට ද මෙමගින් උත්සාහ දරා ඇත. ඒ අනුව විශේෂයෙන් අස්වැන්න නෙළන සමයේ දී ඉතාමත් අඩු මිල ගණන් යටතේ තම නිෂ්පාදන අලෙවි කිරීමට ලැබීම නිරන්තරයෙන් ගොවීන් මුහුණ දෙන අමිහිරි අත්දැකීමකි. උදාහරණයක් ලෙස අර්තාපල් හා ලොකුළුනු අස්වැන්න නෙළන කාලයටත් දෙහි දොඩම් වැනි වගාවන් හි අස්වැන්න නෙළන කාලයටත් මෙවැනි අත්දැකීම් බහුතරයක් ගොවීන්ට අත්දැකීමට සිදු වේ. මෙයට විසඳුමක් ලෙස තොරතුරු තාක්ෂණය උපයෝගී කරගෙන ජාතික මට්ටමින් කෘෂි ක්ෂේත්‍රයේ දෛනිකව නවතාවයකට පත්වන සංඛ්‍යාත්මක තොරතුරු සැපයීමේ ක්‍රමයක් ලෙස ගොවීන්ගේ දත්ත බැංකුව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර ඇත. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පවත්වාගෙන යන (www.agrideptgov.lk) වෙබ් අඩවියට එක් එක් සයිබර් ඒකකවලට අදාළව ගොවීන්ගේ තොරතුරු (ගොවියාගේ නම, වගාකරන බෝගය, වගා කරණ ප්‍රමාණය, අපේක්ෂිත අස්වැන්න) එක්රැස් කිරීමට අන්තර්ජාල පහසුකම් ලබාදීමේ අරමුණ වී ඇත. මීට අමතරව නම් කරන ලද විශේෂ ආර්ථික මධ්‍යස්ථානවල ප්‍රධාන එළවළු හා එහි දෛනික තොග මිල පිළිබඳ තොරතුරු ලබා ගැනේ. මෙම ක්‍රියාවලියේ වර්තමාන තත්ත්වය පිළිබඳ විමසීමේ දී මේ වන විට සයිබර් ඒකකයන් හි අන්තර්ජාල පහසුකම් අඩපණ වී ඇති අතර එයට හේතු වී ඇත්තේ දුරකථන ගාස්තු ගෙවීමේ ප්‍රමාදයන් මත සේවා අක්‍රිය වීම යි. ඒ අනුව දෙවන අදියරයේ අපේක්ෂිත අරමුණු ඉටු නො වීමට එය බලපා ඇත.

3.4 ඒකකය වෙත ලබා දී ඇති උපකරණ සහ නිලධාරීන්ට ලබා දී ඇති පරිගණක පුහුණුවීම්

මෙම සෑම ඒකකයකට ම පරිගණක යන්ත්‍රයක් (සී.ඩී. පට කියැවීම, කොපි කිරීම හා ඩී.වී.ඩී. පට කියැවීමේ පහසුකම් සහිත) ස්කෑනර් යන්ත්‍රයක්, ප්‍රින්ටර් යන්ත්‍රයක්, ඩිජිටල් කැමරාව සහ යූ.පී.එස් එකක් සහ විවිධ බෝග පිළිබඳ දැනුම සහිත සි.ඩී. තැටි සපයා දී ඇත. කෘෂිකර්ම උපදේශක මෙම ඒකක භාර නිලධාරියා ලෙස පත්කර ඇති අතර ඔවුන්ට ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථානයෙන් ඒකක පවත්වා ගෙන යෑම සඳහා අවශ්‍ය පරිගණක සාක්ෂරතාව පිළිබඳ දැනුම ලබා දී ඇත. දැනුම ලබාදීම සඳහා ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථානයේ නිලධාරීන් පුහුණු වැඩසටහන් සංවිධානය කර ඇත. පරිගණකය පිළිබඳ මූලික දැනුම පරිගණකය ආශ්‍රයෙන් ලිපි සකස් කිරීම, කාර්යාලීය කටයුතු සිදුකරගැනීම, පවර්පොයින්ට් ඉදිරිපත් කිරීම් සකස් කරගැනීම, අන්තර්ජාලය භාවිතා කිරීම විද්‍යුත් තැපැල මෙන් ම කාලීන ව පරිගණක ක්ෂේත්‍රය තුළ සිදුවන නවතාවයන් ද ඇතුළත් වන පරිදි ශ්‍රව්‍ය දෘශ්‍ය නිලධාරීන් මෙම පුහුණු වැඩසටහන් සංවිධානය කර ඇත.

සයිබර් ඒකක ස්ථාපිත කිරීමේ දී ඒකක භාර කෘෂිකර්ම උපදේශකවරයාට අමතර ව තවත් එක් කෘෂිකර්ම උපදේශකවරයෙකු සඳහා ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථානය මගින් පරිගණක සාක්ෂරතාව පිළිබඳව පුහුණුවීම් ලබා දී ඇත. 2005 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා ඒකක භාර නිලධාරීන් ලැබූ පුහුණුවීම් සංඛ්‍යාව පහත සංඛ්‍යා වගු අංක 04න් පෙන්නුම් කෙරේ.

පුස්තකාලය
LIBRARY

වගු අංක 3.3 : පුහුණුව ලැබූ නිලධාරීන් සංඛ්‍යාව සහ පුහුණුවීම් සංඛ්‍යාව

වර්ෂය	පුහුණු වීම් සංඛ්‍යාව	සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව
2005	05	83
2006	06	110
2007	04	79
2008	03	50
2009	02	32

මූලාශ්‍රය : ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථානය, (2010).

2005 ආරම්භක වර්ෂයේ දී පුහුණු වීම් වාර 05ක් සංවිධානය කර ඇති අතර, ඒ සඳහා කෘෂිකර්ම උපදේශකවරුන් 83 දෙනෙකු සහභාගී වී ඇත. අනතුරු ව 2006 වර්ෂයේ දී පුහුණු වීම් වාර 06ක් සංවිධානය කර තිබේ. ඒ සඳහා කෘෂිකර්ම උපදේශකවරුන් 110ක් සහභාගී වී ඇත. 2006 වර්ෂයේ සියලු සයිබර් ඒකකයන් නියෝජනය වන පරිදි නිලධාරීන් සහභාගී වූ බව ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථානයේ නිලධාරීහු සඳහන් කළහ. එසේ වුව ද 2007 වර්ෂයේ සිට වර්තමානය වන විට සංවිධානය කර ඇති පුහුණු වීම් සංඛ්‍යාව අඩු වෙමින් ගොස් ඇති බව සංඛ්‍යා සටහනින් පෙන්නුම් කෙරේ.

දින 03ක් වැනි කාලයක්, නේවාසික ව ලබා දෙන මෙම පුහුණුවීම් සඳහා මූල්‍ය ප්‍රතිපාදන සපයා ගැනීමේ අපහසුව නිසා පුහුණු වීම් සංවිධානය කිරීමේ අපහසුවක් පැණ නැගුණු බවත්, එම තත්ත්වය මත සංවිධානය කළ හැකි වූ පුහුණු වීම් සංඛ්‍යාව අඩු වූ බවත් ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථාන නිලධාරීන් සඳහන් කළහ.

3.5 ඒකක වෙත ලබා දී ඇති අන්තර් ක්‍රියාකාරී බහුමාධ්‍ය සී.ඩී. තැටි

ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථානය විසින් කෘෂිකාර්මික දැනුම ලබා දීම සඳහා භාවිතා කර ඇති නවතම විද්‍යුත් ඉගැනුම් ක්‍රමෝපායය වන්නේ අන්තර් ක්‍රියාකාරී බහු මාධ්‍ය සී.ඩී. තැටි වේ. තෝරා ගනු ලැබූ ආහාර බෝග, විසිතුරු මල් වර්ග, පිටු පෙරලනය තාක්ෂණය සහ රාජකීය උද්භිද උද්‍යානයන් නම් වූ විවිධ ක්ෂේත්‍ර යටතේ සී.ඩී. තැටි 48ක් නිෂ්පාදනය කර ඇත.

ආහාර බෝග පිළිබඳ නිෂ්පාදනය කර ඇති සී.ඩී. පට හරහා එම බෝගයන් ට අදාළ තාක්ෂණික තොරතුරු සියල්ල අන්තර්ගත වන අතර, වගාව හා ආහාර සැකසුම පිළිබඳ තොරතුරු ද ඇතුළත් වේ. එම තොරතුරු ග්‍රාහකයාට ප්‍රියමනාප වන පරිදි එයට අදාළ ඡායාරූප, වීඩියෝ පට, නිදර්ශන හා ශබ්ද ඇතුළත් කර නිර්මාණය කර තිබීම විශේෂත්වයකි. සිංහල භාෂාවෙන් නිර්මාණය කර ඇති සී.ඩී. පට තුළින් ගොවීන්ට අවශ්‍ය පරිදි සී.ඩී. පටවල අඩංගු පිටු මුද්‍රණය කරගැනීමේ හැකියාව ද පවතී.

වගු අංක 5න් දැක්වෙන්නේ ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථානය මගින් නිෂ්පාදනය කර ගොවීන්ට ලබා දී ඇති සී.ඩී. පටයන් හි තොරතුරු වේ.

වගු අංක 3.4 : ශ්‍රව්‍ය දෘශ්‍ය මධ්‍යස්ථානය විසින් නිෂ්පාදනය කරන ලද අන්තර් ක්‍රියාකාරී බහුමාධ්‍ය සී.ඩී. තැටි

2004		මාධ්‍ය
01	වී	සිංහල
02	වම්බටු	සිංහල
03	තක්කාලි	සිංහල
04	මිරිස්	සිංහල
05	ලොකු ළූනු	සිංහල
06	රතු ළූනු	සිංහල
07	අර්තාපල්	සිංහල
08	කෙසෙල්	සිංහල
09	හතු	සිංහල
10	පිටු පෙරළනය (flipchart)	සිංහල
11	රාජකීය උද්භිද උද්‍යානය (royal botanic gardens)	ඉංග්‍රීසි
12	ඇන්තූරියම් වගාව (anthurium story)	ඉංග්‍රීසි
13	එළවළු වගාවේ කෘමි හා පළිබෝධ පාලනය (vegetable insect pest management)	ඉංග්‍රීසි
2005		
14	බෝංචි	සිංහල
15	තිරිඟු	සිංහල
16	ඇන්තූරියම්	සිංහල
17	පැපොල්	සිංහල
18	ඕකිඩ්	සිංහල
19	ජර්බෙරා	සිංහල
20	බූලත්	සිංහල
21	තක්කාලි	දෙමළ
22	රතුළූනු	දෙමළ
2006		
23	ක්ෂුද්‍ර වාරි කර්මාන්ත	සිංහල
24	පොල්	සිංහල
25	තෘණ වගාවන් (forages)	සිංහල
26	කොළ එළවළු	සිංහල
27	එළවළු කෘමි හා පළිබෝධ	සිංහල
28	කොස්	සිංහල
29	තිබ්බටු	සිංහල
30	ලොකු ළූනු	දෙමළ
31	කුකර්බිටේසියේ (cucurbitacea)	සිංහල
2007		
32	ආරක්ෂිත කෘෂිකර්මාන්තය	සිංහල
33	පස සංරක්ෂණය	සිංහල
34	දොඩම්/පැඟිරි කුලය	සිංහල

35	හතු ii	සිංහල
36	වී	දෙමළ
37	පැපොල්	දෙමළ
38	වම්බටු	දෙමළ
2008		
39	නිසි එල නෙළා නො ගන්නා පලතුරු බෝග	සිංහල
40	පොල් ii	සිංහල
41	ධාන්‍ය	සිංහල
42	උඩරට එළවළු	සිංහල
43	කෙසෙල් ප්‍රභේදය (2009)	සිංහල
44	ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය (IPM – 2009)	සිංහල

මූලාශ්‍රය : ශ්‍රව්‍ය – දෘශ්‍ය මධ්‍යස්ථානය, (2010).

මෙම සී.ඩී. තැටි 2004 වර්ෂයේ දී නිෂ්පාදනය ආරම්භකර 2008 වර්ෂය වන විට සී.ඩී. තැටි 44ක් සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන මාධ්‍ය තුනෙන් ම සකස් කර ඇත. 2010 වර්ෂය වන විට සී.ඩී. තැටි 48ක් ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථානය සතු ව ඇත. වගු අංක 6න් දැක්වෙන්නේ 2008 වර්ෂය දක්වා සිංහල දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා තුනෙන් නිෂ්පාදිත සී.ඩී.තැටි සංඛ්‍යාව වේ.

වගු අංක 3.5 : වාර්ෂිකව නිෂ්පාදිත සී.ඩී. තැටි ප්‍රමාණයන්

වර්ෂය	සිංහල මාධ්‍ය	දෙමළ මාධ්‍ය	ඉංග්‍රීසි මාධ්‍යය	එකතුව
2004	10	--	03	13
2005	07	02	--	09
2006	08	01	--	09
2007	04	03	--	07
2008	06	--	--	06
එකතුව	35	06	03	44

මූලාශ්‍රය: ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථානය, (2010).

3.6 සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති ඒකක අධීක්ෂණ කටයුතු ක්‍රියාත්මක වන ආකාරය

සයිබර් ව්‍යාප්ති ඒකකයන් හි ප්‍රගතිය පිළිබඳ ඇගයීම සඳහා ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථානය විසින් ප්‍රධාන වශයෙන් ක්‍රම 02ක් අනුගමනය කර ඇති බව සාහිත්‍ය විමර්ශනයේ දී පැහැදිලි විය. ඊට අමතර ව එහි ප්‍රගතිය හා ක්‍රියාකාරිත්වය පිළිබඳ සමීක්ෂණයන් ද සිදු කර ඇත. එනම්,

01. සෑම සයිබර් ඒකකයකින් ම මාසික ප්‍රගති වාර්තා ලබා ගැනීම

මෙහිදී නිර්ණායක කිහිපයක් යටතේ සයිබර් ඒකකයේ ක්‍රියාකාරිත්වය හා කාර්යයන් ඇගයීමට ලක් කර ඇත. මාසයක් තුළ සී.ඩී. පට භාවිතා කරමින් ගොවීන් සඳහා පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව, ඒකකය

වෙත පැමිණ සී.ඩී. තැටි කොපි කරගෙන ඇති ගොවීන් සංඛ්‍යාව, එසේ ම එම ක්‍රියාකාරකම් සිදු කිරීමේ දී නිලධාරීන් මුහුණ දෙන ගැටළු, වැඩසටහන් සඳහා වැය වූ කාලය වැනි කරුණු මෙම මාසික ප්‍රගති වාර්තාවේ ඇතුළත් වේ. මෙම කරුණු ඉටු කර ඇති ප්‍රමාණය මගින් ඒකකයේ ප්‍රගතිය ඇගයීමට ලක් කර ඇත.

02. ඇගයීම් නිලධාරීන් කණ්ඩායමක් මගින් ඒකක නිරීක්ෂණය කිරීම

මෙම කාර්යය සඳහා මධ්‍යස්ථානයේ ඇගයීම් අංශයක් ස්ථාපිත කර එහි නිලධාරීන් කණ්ඩායමක් මාස 03 ට වරක් පෙර දැනුම් දීමකින් තොරව නිරීක්ෂණ ඇගයීම් සිදු කර ඇත. සයිබර් ඒකකයන් හි ක්‍රියාත්මක තත්ත්වය, ඒකකය හරහා ක්‍රියාත්මක කළ වැඩසටහන්, නිලධාරීන්ගේ පරිගණක සාක්ෂරතාවය, සයිබර් ඒකකයේ නඩත්තුව, සඟ දින පගේ ම විවෘත කර පවතී ද? යන කරුණු පිළිබඳ නිරීක්ෂණය කිරීම සිදු වන බව නිලධාරීහු සඳහන් කළහ.

ඉහත ක්‍රමවේදයන් 02 මගින් සයිබර් ඒකකය පිළිබඳ මාසිකව හා ත්‍රෛමාසිකව අධීක්ෂණය සිදු කර ඇති අතර ඊට අමතරව, ව්‍යුහගත ප්‍රශ්නාවලී සමීක්ෂණයන් හා ක්ෂේත්‍රය තුළ සයිබර් ඒකකවල බලපෑම පිළිබඳ විවිධ සමීක්ෂණයන් මගින් එහි ක්‍රියාකාරීත්වය, ගොවීන්ගේ දැනුවත්භාවය, ගොවීන්ගේ සහභාගීත්වය, නිලධාරීන්ගේ පරිගණක සාක්ෂරතාවය, පිළිබඳ හා පුහුණුවීම් හි අවශ්‍යතාවය පිළිබඳ ඇගයීම් සිදු කර ඇත.

3.6.1 අධීක්ෂණය හා ඇගයීම පිළිබඳ වර්තමාන තත්ත්වය

සයිබර් ඒකකයන් අධීක්ෂණය කිරීම සඳහා මුල්කාලීනව මාස 03 ට වරක් සිදු කළ නිරීක්ෂණ චාරිකාව වසර 03ක් පමණ අඛණ්ඩව සිදු කළ බවත්, එම කාලය තුළ නිරීක්ෂණයට ලක් වූ සයිබර් ඒකකයන් හි ක්‍රියාකාරීත්වය ඉහළ මට්ටමින් පැවතුණු බවත් ශ්‍රව්‍ය–දෘශ්‍ය මධ්‍යස්ථානයේ නිලධාරීහු සඳහන් කළහ. නමුත් වර්තමානයේ මෙම නිරීක්ෂණ චාරිකා මගින් කෙරෙන අධීක්ෂණ කටයුත්ත ක්‍රමානුකූලව සිදු නො වන බව නිරීක්ෂණය කළ හැකි විය.

සයිබර් ඒකක භාර කෘෂිකර්ම උපදේශක විසින් ශ්‍රව්‍ය–දෘශ්‍ය මධ්‍යස්ථානය වෙත යවන මාසික ප්‍රගති වාර්තාව, දැනට ඒකකයන් සුළු ප්‍රමාණයක කෙරෙන අතර එය ද ක්‍රමානුකූලව හා අඛණ්ඩව සිදු නො වන බව අධ්‍යයනයේ දී නිරීක්ෂණය කළ හැකි විය. එසේ ම ඒකකයන් විසින් සකස් කර එවන මෙම ප්‍රගතිය පිළිබඳ වාර්තාවේ නිරවද්‍යතාවය හෝ සඳහන් කර ඇති වැඩසටහන් සත්‍ය ලෙස ම ක්‍රියාත්මක වුවා ද යන්න පිළිබඳ ව ශ්‍රව්‍ය–දෘශ්‍ය මධ්‍යස්ථානය මගින් පසු විපරමක් නො කරනු ලබන බව ද අනාවරණය විය. මෙම තත්ත්වයන්ට හේතු විමසීමේ දී ශ්‍රව්‍ය-දෘශ්‍ය ඒකක භාර නිලධාරීන් සඳහන් කළේ, මෙවැනි කාර්යයන් සඳහා නිලධාරීන් යෙදවීමේ දී වර්තමාන මූල්‍ය ප්‍රතිපාදනයන් ඊට හරස් වන බව යි.

3.7 සයිබර් ව්‍යාප්ති ඒකක පිළිබඳ ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

ජන සන්නිවේදන ක්‍රමෝපායයන් ප්‍රයෝජනයට නො ගෙන සයිබර් ව්‍යාප්ති ඒකක පිළිබඳ නව සන්නිවේදන උපක්‍රම මගින් දැනුවත් කිරීමේ වැඩසටහන් ශ්‍රව්‍ය–දෘශ්‍ය මධ්‍යස්ථානය විසින් ක්‍රියාත්මක කර ඇත. එනම්

"තොරතුරු දින" නමින් වැඩසටහන් කිහිපයක් ඇතුළත් වූ නව ක්‍රමයක් අනුගමනය කිරීම එහි විශේෂත්වය යි. මෙය 2007 වර්ෂයේ දී මාරස්සන, රාස්සගල, පොළොන්නරුව සහ බුත්තල යන ඒකකයන් හි පවත්වා ඇත. වීදි නාට්‍ය, රූකඩ, ජංගම ප්‍රදර්ශන කුටි, බැනර් වැනි බහු මාධ්‍ය ප්‍රවේශයන් මෙහි දී උපයෝගී කරගෙන ඇත. ගොවි සායන, ගොවි හමුව වැනි වැඩසටහන් ද මෙයට ඇතුළත් වී ඇත. ඒ හරහා ගොවියා, ව්‍යාප්ති නිලධාරියා, පර්යේෂකයා යන පාර්ශවයන්ගේ එකතුවක් මඟින් මෙම දැනුවත් කිරීම් සිදු කර තිබේ. ඊට අමතර ව සයිබර් ඒකක පිළිබඳ ගොවීන් දැනුවත් කිරීම සඳහා ඒකකයන් කිහිපයකට නාම පුවරු ද ලබා දී ඇත.

මෙවැනි වැඩසටහන් සිදු කිරීම ඒකක ස්ථාපිත කිරීමේ මුල් අවධියේ දී සිදු කර ඇති මුත් වර්තමානය වන තෙක් අඛණ්ඩ ව සිදු කිරීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන වෙන් කරගැනීමේ අපහසුව සහ වෙනත් පරිපාලනමය දුෂ්කරතාවයන් ඒ සඳහා බාධාවක් වී ඇත. එබැවින් වර්තමානයේ මෙවැනි දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක වීම ඉතාමත් විරල බව අධ්‍යයනයේ දී පැහැදිලි විය.

සිව් වැනි පරිච්ඡේදය

ප්‍රතිඵල හා සාකච්ඡා

අධ්‍යයනයට ලක් කළ ගොවීන්ගේ සමාජ, ආර්ථික පසුබිම

4.1 හැඳින්වීම

ග්‍රාමීය ගොවීන්ට කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළ දැනුම හා තොරතුරු ලබා ගැනීම සඳහා පිහිටුවා ඇති සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති ඒකක මගින් තම වගා හා අලෙවි කටයුතු සඳහා සේවයක් ලැබූ ගොවීන්ගේ මෙන්ම එයින් සේවය ලබා නො ගත් ගොවීන්ගේ සමාජ-ආර්ථික පසුබිම සකස් වී ඇත්තේ කෙසේද? එය අධ්‍යයනයේ අපේක්ෂාවන් ඉටු කරගැනීමට ඉවහල් වන්නේ කුමන අයුරින් ද යන්න පැහැදිලි අවබෝධයක් ලැබීම ඉතා වැදගත් වේ. ඒ අනුව මෙම පරිච්ඡේදයේ දී අධ්‍යයනයට භාජනය කළ ගොවීන්ගේ සමාජ-ආර්ථික පසුබිම පිළිබඳ විමර්ශනය කෙරේ. ඊට අමතර ව ගොවිතැනෙ හි යෙදීමේ දී ගොවීන් විසින් මුහුණ දෙනු ලබන පොදු ගැටලු විසඳීම සඳහා උපයෝගී කරගනු ලබන මූලාශ්‍ර සහ ගොවීන් කෘෂි ක්ෂේත්‍රය තුළ ලැබූ පුහුණු වීම් පිළිබඳව ද මෙම පරිච්ඡේදය තුළ සාකච්ඡාවට ලක් කෙරේ.

4.2 නියැදියේ සමාජ-ආර්ථික තොරතුරු

4.2.1 ස්ත්‍රී/පුරුෂ භාවය

අධ්‍යයනයට ලක් වූ සමස්ත නියැදිය ස්ත්‍රී/පුරුෂභාවය අනුව ව්‍යාප්ත වී ඇති ආකාරය වගු අංක 4.1 මගින් ඉදිරිපත් කර ඇත.

වගු අංක 4.1: ස්ත්‍රී/පුරුෂභාවය අනුව නියැදියේ ව්‍යාප්තිය

ස්ත්‍රී/පුරුෂභාවය	සේවය ලැබූ ගොවීන්		සේවය නො ලැබූ ගොවීන්		සමස්ත නියැදියේ එකතුව	
	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය
පුරුෂ	44	49.0	62	68.0	106	59.0
ස්ත්‍රී	46	51.0	29	32.0	75	41.0
එකතුව	90	100.0	91	100.0	181	100.0

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත (2010).

සමස්ත ගොවි නියැදියෙන් 59%ක් පුරුෂයින් වන අතර 41%ක් ස්ත්‍රීහු වෙති. අධ්‍යයනය සඳහා තෝරා ගනු ලැබූ සමස්ත ගොවි නියැදියේ පුරුෂ පාර්ශවය 59%ක් ද ස්ත්‍රී පාර්ශවය 41% ක් ද සිටින ලදී. ඉන් සයිබර් ඒකක හරහා සේවය ලබාගත් ගොවි කණ්ඩායමින් 49%ක් පුරුෂයින් ලෙසත්, 51%ක් ස්ත්‍රීන් ලෙසත් ව්‍යාප්තව සිටින ලදී. සේවය ලබා නො ගත් ගොවි කණ්ඩායම, පුරුෂයින් 68%කින් ද ස්ත්‍රීන් 32%කින් ද සමන්විත විය. කෙසේ වුව ද ග්‍රාමීය ගොවි ප්‍රජාවට සයිබර් ඒකක නව අත්දැකීමක් වූ අතර ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයට ම නව දැනුම ලබා ගැනීම සඳහා එය ඉවහල් වී ඇත.

4.2.2 ගොවීන්ගේ වයස් කාණ්ඩ

සයිබර් ඒකක පිහිටුවීමෙන් ගෝලීය තාක්ෂණය ගමට රැගෙන යාමක් සිදුවේ. ග්‍රාමීය ගොවි ප්‍රජාවන් වෙත නව දැනුම ලබා දීමේ දී එම කාර්යය සාර්ථක වීම කෙරෙහි ඔවුන්ගේ වයස් මට්ටම් ද ඉතා වැදගත් වනු ඇත. තරුණ ගොවි කණ්ඩායම් වැඩි වශයෙන් යොමු වන්නේ නම් එම කාර්යය සාර්ථක වීමට එය වැඩි රුකුලක් වනු ඇත. විවිධ වයස් මට්ටම්වලට අයත් ගොවීන් සයිබර් ඒකක තුළින් සේවය ලැබූ සහ සේවය නොලැබූ ගොවීන්ගේ නියැදියට අයත් වී ඇති බව පහත 4.2 වගුවෙන් පැහැදිලි වේ.

වගු අංක 4.2: සයිබර් ඒකක තුළින් සේවය ලැබූ සහ නො ලැබූ ගොවීන්ගේ වයස් කාණ්ඩ අනුව ව්‍යාප්තිය

වයස් මට්ටම	සේවය ලැබූ ගොවීන්		සේවය නොලැබූ ගොවීන්	
	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය
<30	04	4.4	05	5.4
30-45	35	39.0	45	49.3
45-60	39	43.3	27	30.0
60<	12	13.3	14	15.3
එකතුව	90	100.0	91	100.0

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත (2010).

සයිබර් ඒකක හරහා සේවය ලැබූ ගොවීන් මෙන් ම සේවය නො ලැබූ ගොවීන්ගෙන් වැඩි ප්‍රමාණයක් අයත් වන්නේ, වයස අවු. 30 ට වැඩි වයස් කාණ්ඩයන්ට වේ. සයිබර් ඒකක හරහා සේවය ලැබූ ගොවීන් පිළිබඳ සැලකීමේ දී වයස අවු. 30 ට අඩු කණ්ඩායම් මේ සඳහා යොමුවීම ඉතාමත් අඩු මට්ටමක පවතී. එය 4.4% කි. නමුත් නියැදියට අයත් ගොවීන් මෙන් ම නිලධාරීන් සමග කළ සාකච්ඡාවල දී පැහැදිලි වූයේ, තරුණ පරපුර ගොවිතැනින් බැහැර නොවී තබා ගැනීමට මෙවැනි තාක්ෂණ ක්‍රම හඳුන්වා දීම වඩාත් උචිත වන බව යි. එසේ වුවත් ඔවුන්ගේ සහභාගීත්වය අඩුවීම තුළින් පැහැදිලි වන්නේ සයිබර් ඒකක පිළිබඳ ප්‍රචාරණය හොඳින් සිදු වී නොමැති බව යි. සයිබර් ඒකක හරහා සේවය ලබා ගැනීමට යොමු වූ කණ්ඩායමෙන් (82.3%) ක් (39.0%+43.3%) අයත් වන්නේ වයස අවු. 30 – 60 අතර වයස් කාණ්ඩයට බව වගු අංක 4.2න් පැහැදිලි වේ. එයින් ගම්‍ය වන්නේ ද තරුණ ගොවි කණ්ඩායම් සයිබර් ඒකක වෙත යොමු කරගැනීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමේ අවශ්‍යතාවයක් පවතින බව යි. වයස අවුරුදු 60 ට වැඩි වයස් කාණ්ඩයේ ගොවීන් 13.3%ක් සයිබර් ඒකක හරහා සේවය ලබා ගෙන ඇත. අතීතයේ සිට වර්තමානය දක්වා කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ සිදු වන නව ප්‍රවණතාවන් පිළිබඳ උනන්දු වන එසේ ම, තම සාම්ප්‍රදායික දැනුමත් සමග නව තාක්ෂණික දැනුම අත්හදා බැලීමට කැමති ගොවීන් පිරිසක් ග්‍රාමීය අංශය තුළ වෙසෙන බව ඉන් පැහැදිලි වේ.

4.2.3 අධ්‍යාපනික තත්ත්වය

නව තාක්ෂණික ක්‍රමවේදයන් ප්‍රචලිත කිරීමේ දී ගොවීන්ගේ වයස් ප්‍රමාණය සේ ම අධ්‍යාපනික තත්ත්වය ද ඉතා වැදගත් නිර්ණායකයකි. ගොවිතැන හෝ වෙනයම් කටයුත්තක් සාර්ථක වීමට හෝ අසාර්ථක වීමට අධ්‍යාපනික මට්ටම වඩාත් ඉවහල් වේ. සයිබර් ඒකක හරහා සේවය ලැබූ සහ සේවය නො ලැබූ ගොවීන්ගේ අධ්‍යාපනික තත්ත්වය වගු අංක 4.3න් පෙන්නුම් කෙරේ.

වගු අංක 4.3: සේවය ලැබූ සහ නො ලැබූ ගොවීන්ගේ අධ්‍යාපනික මට්ටම

අධ්‍යාපන මට්ටම	සේවය ලැබූ ගොවීන්		සේවය නො ලැබූ ගොවීන්		එකතුව	
	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය
අ.පො.ස. (සා.පෙළ) දක්වා	48	53.3	69	76.0	117	64.6
අ.පො.ස. (සා.පෙළ) සමත්	12	13.3	11	12.0	23	12.7
අ.පො.ස. (උ.පෙළ) දක්වා	08	9.0	05	5.5	13	7.0
අ.පො.ස. (උ.පෙළ) සමත්	19	21.1	04	4.3	23	12.7
ඩිප්ලෝමාලාභීන්	02	2.2	-	-	02	1.0
උපාධිධාරීන්	01	1.1	-	-	01	1.0
පාසල් නො ගිය	-	-	02	2.2	02	1.0
එකතුව	90	100.0	91	100.0	181	100.0

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත (2010).



ප්‍රස්තාර අංක 4.1 : සේවය ලැබූ සහ නො ලැබූ ගොවීන්ගේ අධ්‍යාපනික මට්ටම

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2010).

සමස්ත නියැදියේ අධ්‍යාපනික තත්ත්වය පිළිබඳ සැලකීමේ දී අ.පො.ස. (සා.පෙ.) දක්වා උගත් පිරිස 64.6%කි. සයිබර් ඒකක හරහා සේවය ලැබූ ගොවීන්ගෙන් 53.3%ක් ද සේවය නො ලැබූ ගොවීන් 76.0%ක් ද ඊට අයත් වේ. සයිබර් ඒකක හරහා සේවය ලැබූ ගොවීන් පිළිබඳ පමණක් සැලකිලිමත් වීමේ දී එම ගොවීන්ගෙන් 21.1%ක් අ.පො.ස. (උ.පෙ.) සමතුන් වේ. එසේ ම ඩිප්ලෝමාලාභීන් දෙදෙනෙක් ද එක් උපාධිධාරියෙක් ද එම

කණ්ඩායමට අයත් විය. සයිබර් ඒකක හරහා සේවය නො ලැබූ ගොවීන්ගෙන් බහුතරයක් (76%)ක් අ.පො.ස. (සා.පෙ.) දක්වා අධ්‍යාපනය ලබා ඇති නමුත් සයිබර් ඒකක වෙත යොමු වීමට ඔවුන් උනන්දුවක් දක්වා නොමැති බව මෙහි දී පෙනී යයි. සමීක්ෂණයට භාජනය වූ ගොවීන් මෙන් ම නිලධාරීන් සමග ද කෙරුණු කණ්ඩායම් සාකච්ඡාවල දී හෙළි වූ තොරතුරුවලට අනුව පැහැදිලි වූයේ, බොහෝමයක් ගොවීන් පරිගණක හා ඒ ආශ්‍රිත උපකරණ පරිහරණය කිරීමට මැලිකමක් දක්වනවා මෙන් ම නව තාක්ෂණික උපකරණ භාවිතය පිළිබඳ එතරම් විශ්වාසයක් නො දක්වන බව යි. එසේ ම අධ්‍යාපනික අංශය තුළින් ඉදිරියට ගිය පුද්ගලයින් තුළ මෙවැනි ආකල්ප පවතින්නේ ඉතාමත් අවම වශයෙන් බව ද ඔවුන්ගේ සාකච්ඡා තුළින් පැහැදිලි විය.

4.2.4 කෘෂිකර්මාන්තයේ යෙදුණු කාල පරාසය

සයිබර් ඒකක හරහා සේවය ලැබූ ගොවීන් හා සේවය නොලැබූ ගොවීන් කොතරම් කාලයක සිට කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ රැඳී සිටියේ ද යන්න විමසීමට ලක් කරන ලදී. එය 4.4 සංඛ්‍යා සටහනින් පැහැදිලි කර ඇත.

වගු අංක 4.4: සේවය ලැබූ සහ නො ලැබූ ගොවීන් කෘෂිකර්මාන්තයේ යෙදී සිටි කාලය

කාලය (වර්ෂය)	සේවය ලැබූ ගොවීන්		සේවය නො ලැබූ ගොවීන්		එකතුව	
	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය
<10	27	30.0	27	30.0	54	30.0
10-25	34	38.0	41	45.0	75	41.0
25-40	26	29.0	22	24.0	48	27.0
40<	03	3.0	01	0.1	04	2.0
එකතුව	90	100.0	91	100.0	181	100.0

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත. (2010).

සයිබර් ඒකක හරහා සේවය ලැබූ හා සේවය නො ලැබූ ගොවි නියැදියේ සමස්තය පිළිබඳ සැලකීමේ දී 70%ක්ම ගොවීන් වසර 10 කට වැඩි කාලයක් තිස්සේ ගොවිතැනෙ හි නියැලුණු පුද්ගලයෝ වෙති. සේවය ලැබූ ගොවීන් මෙන් ම සේවය නො ලැබූ ගොවීන්ගෙන් වැඩි ප්‍රමාණයක් (41%) වසර 10ක් 25 ත් අතර කාලයක් තිස්සේ ගොවිතැන් කටයුතුවල නියැළී ඇත. එය සේවය ලැබූ ගොවීන්ගෙන් සේවය නො ලැබූ ගොවීන්ගෙන් පිළිවෙළින් 38%ක් සහ 45%ක් වේ. වසර 40 ට වැඩි කාලයක් තිස්සේ ගොවිතැන් කටයුතුවල නියැළී සිටි ගොවි ප්‍රතිශතය කණ්ඩායම් දෙකෙ හි ම අඩු අගයක් ගන්නා අතර සමස්ත නියැදියෙන් එය 2%ක් වැනි ප්‍රමාණයක් වේ. කෙසේ වුව ද පාරම්පරික ගොවීන්ගෙන් සුළු ප්‍රමාණයක් හෝ සයිබර් ඒකක හරහා තොරතුරු හා උපදෙස් ලබා ගැනීමට පෙළැඹී සිටීම යම් තරමක හෝ යහපත් තත්ත්වයක් ලෙස පෙන්වා දිය හැකි ය.

4.2.5 ප්‍රධාන රැකියා මාර්ගය

සයිබර් ඒකක හරහා සේවය ලබා ගැනීමට යොමු වූ කණ්ඩායමේ සාමාජිකත්වය හා ඒ සඳහා යොමු නොවූ සාමාජිකත්වය පිළිබඳ සැලකීමේ දී ඔවුන් විවිධ වූ රැකියා මාර්ගයන් හි නියුක්ත ව සිටින්නන් බව පෙනුණි.

වගු අංක 4.5: සේවය ලැබූ සහ නො ලැබූ ගොවීන්ගේ ප්‍රධාන රැකියාව

රැකියා	සේවය ලැබූ ගොවීන්		සේවය නො ලැබූ ගොවීන්		සමස්ත නියැදිය	
	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය
ගොවිතැන	64	71.1	63	69.2	127	70.2
ගෘහණිය	08	8.9	09	10.0	17	9.4
ස්වයං රැකියා	03	3.3	05	5.5	08	4.4
රජයේ සේවක	14	15.6	09	10.0	23	12.7
ව්‍යාපාරික	01	1.1	03	3.2	04	2.2
ශිල්පීය රැකියා	-	-	02	2.1	02	1.1
එකතුව	90	100.0	91	100.0	181	100.0

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2010).

වගු අංක 4.5ට අනුව සමස්ත නියැදියේ ගොවීන්ගේ ප්‍රධාන රැකියාව ගොවිතැන වන අතර එය ප්‍රතිශතයක් ලෙස 70.2% කි. සේවය ලැබූ ගොවීන් 71.1%ක් ද සේවය නො ලැබූ ගොවීන් 69.2%ක් ද ඊට අයත් වේ.

මෙහි දී සේවය ලැබූ කණ්ඩායම තුළ රජයේ රැකියාවන් හි නියුක්ත වූවන්ගේ ප්‍රතිශතය 15.6% කි. ගුරුවරුන් වෙනත් රජයේ නිලධාරීන් සයිබර් ඒකක හරහා සේවය ගැනීමේ නැඹුරුවක් පවතින බව මෙයින් පෙනී යන අතර නව තාක්ෂණික දැනුම හා තොරතුරු ලබා ගැනීමත් තම ප්‍රධාන රැකියාවට අමතරව කෘෂිකර්මාන්තයට ඇති නැඹුරුවත් එයින් ගම්‍ය වේ.

4.2.6 කෘෂිකර්මාන්තයේ යෙදීමේ දී මුහුණ දෙන පොදු ගැටලු

සයිබර් ඒකක හරහා සේවය ලැබූ ගොවීන් සහ සේවය නො ලැබූ ගොවීන් කෘෂිකර්මාන්තයේ යෙදෙන විට පොදුවේ ඔවුන් මුහුණ දෙනු ලබන ගැටලු පිළිබඳ අධ්‍යයනයේ දී අවධානයට යොමු විය. ගොවීන් මෙන් ම නිලධාරීන් සමග ද පවත්වනු ලැබූ සාකච්ඡාවලට අනුව, ගොවීන් හට තම ගොවිතැන් කටයුතු සඳහා අත්‍යවශ්‍ය වන යෙදවුම් කලට වේලාවට සපයා ගැනීමටත්, එසේ ම නියම ප්‍රමිතියක් ඇති යෙදවුම් භාවිතා කිරීමටත් තම නිෂ්පාදනයන් සඳහා අලෙවි මාර්ගයන් විවර කරගැනීමටත් අවශ්‍ය වූ තොරතුරු හා දැනුම පිළිබඳ ඌනතාවයකින් ගොවීන් පෙළෙන බව පැහැදිලි විය.

සංඛ්‍යා සටහන් අංක 4.6 : සයිබර් ඒකක හරහා සේවය ලැබූ සහ නොලැබූ ගොවීන්හට කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන් පවතින ගැටලු පිළිබඳ දැක් වූ ප්‍රතිචාර

ගැටලු	ප්‍රතිචර	ප්‍රතිශතය **n =181**
සත්ව හානි	140	77.3
ජල කළමනාකරණ ගැටලු හා නියමිත අයුරින් ජලය පාලනය කිරීම සම්බන්ධ ගැටලු	128	70.7
නිෂ්පාදන අලෙවිය සම්බන්ධ ගැටලු	120	66.2
කෘමිනාශක හා වෙනත් රසායනික ද්‍රව්‍ය භාවිතය පිළිබඳ ගැටලු	116	64.0
පස නිසරු වීම නිසා මුහුණ දීමට සිදුවන ගැටලු	114	62.9
වගාවට අවශ්‍ය යෙදවුම් නියමිත කාලයට ලබා ගැනීමට නො හැකි වීමේ අපහසුව	110	60.7
කෘෂිකර්මාන්තයේ සිදුවන නව ප්‍රවණතා පිළිබඳ දැනුම නොමැති වීම	108	59.6

* ප්‍රතිශතය ගණනය කර ඇත්තේ ප්‍රතිචාර සංඛ්‍යාව මත නොව ප්‍රතිචාර දැක් වූ ගොවීන් සංඛ්‍යාව අනුව ය. ඒ නිසා ප්‍රතිශත එකතුව 100 ට සමාන නො වනු ඇත.

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය දත්ත, (2010).

වගු අංක 4.6ට අනුව ගොවීන්ට පවතින ගැටලු අතර ප්‍රධාන වී ඇත්තේ ගොවිතැනේ දී මුහුණ දීමට සිදුවන සත්ව හානි පිළිබඳ ගැටලුව යි. එය සමස්ත නියැදියෙන් 77.3%කි. එසේ ම ඔවුන්ට පවතින තවත් ප්‍රධාන ගැටලුවක් වී ඇත්තේ, ජල කළමනාකරණය යි. ඒ සඳහා ගොවි ප්‍රතිචාර 70.7%කි. තම නිෂ්පාදනය සාධාරණ මිලකට අලෙවි කිරීම සඳහා අලෙවි මාර්ග සොයා ගැනීම සම්බන්ධයෙන් ද ගැටලු පවතින බව 66.2%ක් දැක්වූ ප්‍රතිචාර අනුව පෙනී යයි. එසේ ම වගාවන් සඳහා නිසි ප්‍රමිතියක් සහිතව කෘමිනාශක හා රසායනික පොහොර යෙදීමට අදාළ දැනුම නොමැති වීම ගැටලුවක් බව දක්වූ ගොවීන්ගේ ප්‍රතිචාර සංඛ්‍යාව 64%කි. යෙදවුම් නියමිත කාලයට ලබා ගැනීමට අපහසු වීම ගැටලුවක් බව 60.7%ක් සඳහන් කළ අතර කාලයක් තිස්සේ වගා කළ තම වගා භූමිවල සාරවත්භාවය වර්තමානය වන විට අඩු වී ගොස් තිබීම ද විශාල ගැටලුවක් බව 62.9%ක් සඳහන් කළහ. කාලීනව කෘෂිකර්මාන්තය තුළ සිදුවන නව ප්‍රවණතා පිළිබඳ දැනුම ලබා ගැනීමේ මාර්ග නොමැති වීම ගැටලුවක් බව 59.6%කගේ ප්‍රතිචාර අනුව පැහැදිලි වේ. නව තාක්ෂණික ක්‍රමයන් පිළිබඳවත්, වැඩි දියුණු කළ බෝග වගාවන් පිළිබඳවත්, දැනුම ලබා ගැනීමට අවශ්‍යතාව පවතින ගොවීන් පිරිසක් අධ්‍යයනය නියැදිය තුළ සිටින බව මෙම ප්‍රතිචාර තුළින් පැහැදිලි වේ.

4.2.7 කෘෂිකාර්මික ගැටලු පිළිබඳ දැනුවත් වූ ආකාරය (සයිබර් ඒකක හරහා සේවය ලැබීමට පෙර)

සමස්තයක් ලෙස කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළ ගැටලු සම්බන්ධයෙන් ගොවීන් දැනුවත් වන්නේ කුමන ආකාරයෙන් ද යන්න අධ්‍යයනයේ දී විමසීමට ලක් කළ අතර පහත වගුවෙන් ගොවීන් තම ගැටලු සඳහා පිළිතුරු සොයා ගන්නා මාර්ග පිළිබඳ පැහැදිලි කෙරේ.

වගු අංක 4.7: ගොවීන් කෘෂිකාර්මික ගැටලු පිළිබඳ දැනුම ලබා ගන්නා ආකාරය (සයිබර් ඒකක හරහා සේවය ලැබීමට පෙර)

දැනුම ලබා ගන්නා ආකාරය	අනුරාධපුර				හම්බන්තොට				මහනුවර				සමස්ත නියැදියේ ප්‍රතිචාර එකතුව	
	සේවය ලබාගත් n=39		සේවය ලබා නො ගත් n=39		සේවය ලබාගත් n=30		සේවය ලබා නො ගත් n=32		සේවය ලබාගත් n=21		සේවය ලබා නො ගත් n=20			
	සං	%	සං	%	සං	%	සං	%	සං	%	සං	%	සං	%
01. ගොවිජන සේවා මධ්‍යස්ථාන නිලධාරීන්	39	72.2	26	50.0	32	64.0	26	45.6	24	60.0	19	53.0	166	57.4
02. අසල්වැසි ගොවීන්	08	14.8	15	28.8	07	14.0	13	22.8	07	17.5	05	13.8	55	19.0
03. කෘෂිරසායන අලෙවි ද්‍රව්‍ය වෙළෙඳුන්	03	5.6	05	9.6	04	8.0	06	10.5	01	2.5	05	13.8	24	8.4
04. රාජ්‍ය නො වන සංවිධාන නිලධාරීන්	02	3.7	02	3.8	00	00	01	1.8	00	0.0	00	00	05	1.7
05. ගොවි සංවිධාන නිලධාරීන්	02	3.7	00	00	01	02	01	1.8	01	2.5	01	2.8	06	2.0
06. තමාගේ අත්දැකීමෙන්	00	00	04	7.8	01	01	06	10.5	02	5.0	03	8.3	16	5.5
07. මාධ්‍ය මගින්	00	00	00	00	05	01	04	7.0	03	7.5	02	5.5	14	5.0
වෙනත්	00	00	00	00	00	00	00	00	02	5.0	0.1	2.8	03	1.0
එකතුව	54.0	100.0	52.0	100.0	50.0	100.0	57.0	100.0	40.0	100.0	36.0	100.0	289	100.0

* ගොවීන් ලබා දී ඇති ප්‍රතිචාර සංඛ්‍යාව මත ප්‍රතිශතය ගණනය කර ඇත.

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2010).

අධ්‍යයනයට සම්බන්ධ වූ සියලු ම ගොවීන්ගෙන් පොදුවේ කෘෂිකාර්මික අංශයේ යම් ගැටලුවක් පිළිබඳ දැනුවත් වන්නේ කාගෙන් ද යන්න විමසීමට ලක් කරන ලදී. ඒ අනුව ගොවීන්ගෙන් 57.4%ක් දැනුම ලබා ගෙන ඇත්තේ ගොවිජන සේවා මධ්‍යස්ථාන නිලධාරීගෙනි. මෙහි දී කෘෂිකර්ම උපදේශක මඟින් තාක්ෂණික දැනුම ලබා ගෙන ඇති අතර ගොවිජන සේවා ප්‍රාදේශීය නිලධාරී සහ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන්ගෙන් අනෙකුත් සේවාවන් ලබාගෙන ඇත. මෙහි දී පොහොර සහනාධාර ලබා ගැනීම සඳහා ගොවීන් හට කිහිප වාරයක් ගොවිජන සේවා මධ්‍යස්ථානයට පැමිණීමට සිදුවීම මෙම සේවාවන් ලබා ගැනීමට පිටුවහලක් වී ඇත.

මීට අමතරව, කෘෂිරසායන යෙදීම සම්බන්ධ ගැටලු කෘෂිරසායන ද්‍රව්‍ය අලෙවි මධ්‍යස්ථානයෙන් ලබා තිබූ අතර, සයිබර් ඒකකවලින් සේවය ලැබූ ගොවීන්ට සාපේක්ෂ ව සේවය නො ලැබූ ගොවීන් ඊට දක්වා ඇති නැඹුරුව වැඩි බව සංඛ්‍යා දත්තවලින් පෙනී යයි. කෘෂිරසායන වෙළෙඳුන් තමන්ගේ ලාභ ප්‍රතිශත හා කොමිස් මුදල් වැඩියෙන් ලැබෙන ආයතනවල රසායන ද්‍රව්‍ය අලෙවියට ප්‍රමුඛත්වයක් ලබාදෙන බැවින් මෙය කෘෂි ක්ෂේත්‍රයට අදාළ ගැටලු සම්බන්ධයෙන් වූ අයහපත් ලෙස බලපෑම් සිදු කරන්නා වූ ක්‍රියාවක් බව පෙනී යයි.

මෙහි දී විශේෂත්වය වූයේ, අසල්වැසි ගොවීන්ගෙන් කෘෂිකර්මාන්තයට අදාළ තොරතුරු ලබා ගන්නා ගොවීන් ප්‍රතිශතය සමස්ත නියැදියෙන් 19%ක් වීම යි. මාධ්‍ය මඟින් තොරතුරු ලබා ගැනීමේ දී විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය භාවිතා කර තිබූ අතර එය ප්‍රතිශතයක් ලෙස සමස්ත නියැදියෙන් 5%ක් වේ. රූපවාහිනී කෘෂිකාර්මික වැඩසටහන් වන "ගොවි බිමට අරුණළු", "මිහිකත දිනුවෝ" වැනි වැඩසටහන් ගොවීන්ගේ තොරතුරු ලබා ගැනීම සඳහා වඩාත් ජනප්‍රිය වී තිබුණි. තව ද මහනුවර දිස්ත්‍රික් නියැදියේ සයිබර් ඒකක හරහා සේවය ලබාගත් ගොවීන්ගෙන් 5%ක් සහ සේවය නො ලැබූ ගොවීන්ගෙන් 2.8%ක් දැනුම ලබා ගැනීම සඳහා "ගොවි සහන සරණ සේවය" (1920-Toll Free) භාවිතා කර තිබූ බව ප්‍රතිචාර තුළින් හෙළි විය.

4.2.8 කෘෂිකර්මාන්තය පිළිබඳ ලැබූ පුහුණුවීම්

කෘෂිකර්මාන්තයේ යෙදෙන ගොවීන් වශයෙන් ඒ පිළිබඳ වූ නව ක්‍රමවේදයන් හා දැනුම සම්බන්ධයෙන් යම් පුහුණුවක් ලබා තිබේ ද යන්න පිළිබඳ වැඩසටහනේ දී දත්ත ලබා ගන්නා ලදී. එහි දී සයිබර් ඒකකවලින් සේවය ලබා ගැනීමට පෙර කෘෂිකර්මාන්තය පිළිබඳ මොනයම් ම හෝ පුහුණුවක් ලබා ගත්තේ ද යන්න පිළිබඳව සයිබර් ඒකකවලින් සේවය ලබා ගත් ගොවීන්ගෙන් පමණක් විමසන ලදුව, ඔවුන්ගෙන් 82%ක් කෘෂිකර්මය පිළිබඳ කුමන හෝ පුහුණුවක් ලබාගෙන ඇත. මෙහි දී කෘෂිකර්ම උපදේශක සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අයත් විවිධ පර්යේෂණ ආයතන ගොවීන්ට මෙම පුහුණුවීම් ලබාදීමට මැදිහත් වී ඇති බව අනාවරණය විය. බතලේගොඩ වී පර්යේෂණ ආයතනය, වීරව්ල දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථානය, බිබිල ගොවි පුහුණු පර්යේෂණ ආයතනය හා පශු අස්වනු තාක්ෂණ ආයතනය ඇතුළු තවත් ආයතන රාශියක් මේ හා සම්බන්ධයෙන් කටයුතු කර ඇති බව පැහැදිලි විය. ගොවීන් ලබාගත් පුහුණුවීම් අතර, ගෙවතු වගාව, කෘෂිකර්මාන්තය පිළිබඳ තාක්ෂණික පුහුණුව, (විවිධ ක්ෂේත්‍ර) විසිතුරු මල් හා පතු වගාව, පළිබෝධ පාලනය හා සත්ව පාලනය පිළිබඳ පුහුණුවීම් සඳහා ඔවුහු සහභාගි වී ඇත.



ප්‍රස්තාර අංක 4.2 : පුහුණුවක් ලැබූ සහ නො ලැබූ ගොවීන්

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2010).

පස් වන පරිච්ඡේදය

සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති ඒකක පිළිබඳ ගොවීන්ගේ ප්‍රතිචාර

5.1 හැඳින්වීම

සයිබර් කෘෂිකාර්මික ව්‍යාප්ති ඒකකයන් හි ක්‍රියාකාරිත්වය හා ප්‍රගතිය ඇගයීම සඳහා ඒකක පිළිබඳ ගොවීන්ගේ දැනුවත්භාවය, ඒකක හරහා ගොවීන් ලැබූ සේවාවන්, එම සේවාවන් ලබා ගැනීමේ දී ගොවීන් මුහුණ දෙන ගැටලු සහ සේවය සැපයීමේ දී ඒකක භාර නිලධාරීන් මුහුණ දෙන ගැටලු පිළිබඳ ව අධ්‍යයනයේ දී දත්ත හා තොරතුරු රැස් කරන ලදී. එම දත්ත හා තොරතුරු විශ්ලේෂණය සඳහා මෙම පරිච්ඡේදය වෙන් වේ.

5.2 සයිබර් ව්‍යාප්ති ඒකක පිළිබඳ ගොවීන්ගේ දැනුවත්භාවය

ගොවිජන සේවා මධ්‍යස්ථානයේ කෘෂිකර්ම උපදේශක කාර්යාලය තුළ සයිබර් ඒකකයක් ස්ථාපිත කර තිබීම පිළිබඳ ව ගොවීන්ගේ දැනුවත්භාවය කොතරම් ද යන්න පිළිබඳ අධ්‍යයනයේ දී විමසීමට ලක් කරන ලදී. එහි දී සයිබර් ඒකකයෙන් සේවය නො ලැබූ ගොවීන්ගේ අදහස් පමණක් සැලකිල්ලට ගත් අතර, ඔවුන්ගේ අදහස් පහත වගුවෙන් පැහැදිලි කෙරේ.

වගු අංක 5.1 : සයිබර් ව්‍යාප්ති ඒකක පිළිබඳ ගොවීන්ගේ දැනුවත්භාවය

දැනුවත්භාවය	අනුරාධපුර		හම්බන්තොට		මහනුවර		ගොවි නියැදියේ එකතුව	
	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය
ඒකක පිළිබඳව දනී	15	38.0	12	37.5	11	55..0	38	42.0
ඒකක පිළිබඳව නොදනී	24	62.0	20	62.5	09	45.0	53	58.0
එකතුව	39	100.0	32	100.0	20	100.0	91	100.0

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත. (2010).



ප්‍රස්තාර අංක 5.1: සයිබර් ව්‍යාප්ති ඒකක පිළිබඳ ගොවීන්ගේ දැනුවත්භාවය

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත. (2010).

ඉහත සංඛ්‍යාන සටහන අනුව සයිබර් ඒකක හරහා සේවය ලබා නො ගන්නා ගොවීන්ගෙන් 58%ක් සයිබර් ඒකක පිහිටුවා ඇති බව හෝ එයින් ලබා ගත හැකි සේවාවන් පිළිබඳ නො දන්නා අතර, 42%ක් සයිබර් ඒකකයක් කෘෂිකර්ම උපදේශක කාර්යාලය තුළ පිහිටුවා ඇති බව දැනුවත් වී ඇත. දිස්ත්‍රික්ක නියැදිය පිළිබඳ විමසීමේ දී අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවි නියැදියෙන් 62%ක්, හම්බන්තොට ගොවි නියැදියෙන් 62.5%ක් සහ මහනුවර ගොවි නියැදියෙන් 45%ක් සයිබර් ඒකක පිළිබඳ නො දන්නා බව අනාවරණය විය. තමන්ට අයත් බල ප්‍රදේශය තුළ සයිබර් ඒකකයක් ස්ථාපිත කර ඇති බවට දැනුවත් වී ඇති ගොවීන්ගෙන් බහුතරයක් (90%) ඒ පිළිබඳ දැනුවත් වී ඇත්තේ, කෘෂිකර්ම උපදේශකවරයාගෙන්, කෘ.ප.නි.ස. වරයාගෙන් සහ සමෘද්ධි නිලධාරීවරයාගෙනි. ඉතා සුළු පිරිසක් (10%) දැනුවත් වී ඇත්තේ, ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ඇති දැන්වීම් පුවරුවෙන් සහ අසල්වැසි ගොවීන්ගෙනි. මෙසේ දැනුවත්භාවය ලැබූ ගොවීන්ගෙන් වැඩි ප්‍රමාණයක් (68.4%) සයිබර් ඒකක වෙතින් ලබා ගත හැකි සේවාවන් පිළිබඳ නො දන්නා බව සඳහන් කරන ලදී. එනම්, කෘෂිකර්ම උපදේශක කාර්යාලය තුළ පිහිටුවා ඇති සයිබර් ඒකකය හරහා ගොවීන්ට දැනුම හා තොරතුරු ලබා ගත හැකි බව ඔවුන් දැනුවත් වී නොමැත. එය පහත වගුවෙන් පැහැදිලි කෙරේ.

වගු අංක 5.2: ඒකකය හරහා සිදු කෙරෙන වැඩසටහන් හා ලබා ගත හැකි සේවාවන් පිළිබඳ ගොවීන්ගේ දැනුවත්භාවය

සිදු කෙරෙන වැඩසටහන් හා ලබාගත හැකි සේවාවන් පිළිබඳ දැනුවත්භාවය	අනුරාධපුර n=15		හම්බන්තොට n=12		මහනුවර n=11		සමස්ත එකතුව n=38	
	සං	%	සං	%	සං	%	සං	%
දැනුවත්	04	26.6	03	25.0	05	45.5	12	31.6
නො දැනුවත්	11	73.4	09	75.0	06	54.5	26	68.4
එකතුව	15	100.0	12	100.0	11	100.0	38	100.0

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2010),



ප්‍රස්තාර අංක 5.2: ඒකකය හරහා සිදු කෙරෙන වැඩසටහන් හා ලබා ගත හැකි සේවාවන් පිළිබඳ ගොවීන්ගේ දැනුවත්භාවය

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2010),

5.3 සයිබර් ව්‍යාප්ති ඒකක හරහා සේවය ලැබූ ගොවීන්ගේ ප්‍රතිශතය

සයිබර් ඒකක ස්ථාපිත කිරීමේ වැඩසටහනෙ හි ප්‍රධාන අරමුණ වී ඇත්තේ, ග්‍රාමීය මට්ටමේ ගොවීන්ගේ කෘෂිකාර්මික ගැටලු අවම කිරීම සඳහා නව තාක්ෂණය භාවිතා කරමින් ඔවුන්ට දැනුම ලබාදීමේ සේවයක් සැපයීම යි. ඒ යටතේ ගොවීන්ට ඒකකයට පැමිණ පරිගණකය හරහා සී.ඩී. මාර්ගයෙන් සේවය ලබා ගැනීමේ හැකියාවත් කෘෂිකර්ම උපදේශකවරුන්ට ක්ෂේත්‍රයේ දී ගොවීන් හට දැනුම ලබාදීමේ වැඩසටහන් සංවිධානය කිරීමටත් මෙම ඒකකය හරහා හැකියාව ලැබී ඇත. ඒ අනුව ගොවීන් විසින් සයිබර් ඒකකයෙන් සේවය ලබා ගන්නා ප්‍රධාන ආකාර 02ක් පවතින බව තොරතුරු රැස් කිරීමේ දී පැහැදිලි වූ අතර, එම ක්‍රම දෙක ම භාවිතා කර ඇති ගොවීන් පිරිසක් ද සිටින බව පෙනුණි. ඒ අනුව, සයිබර් ඒකකයට ගොස් උපදෙස් ලබා ගැනීම, සයිබර් ඒකකය මගින් ක්ෂේත්‍රය තුළ පවත්වනු ලබන වැඩසටහන්වලට සහභාගී වීමෙන් උපදෙස් ලබා ගැනීම හා ඉහත දෙයාකාරයට ම සහභාගී වීමෙන් උපදෙස් ලබා ගැනීම යන ආකාර තුන ම ප්‍රයෝජනයට ගනිමින් සේවය ලබා ගන්නා ගොවීන්ගේ ප්‍රතිශතය කොතරම් ද යන්න පිළිබඳ විමසීම සඳහා සේවය ලැබූ ගොවි නියැදිය පමණක් උපයෝගී කර ගත් අතර වගු අංක 5.3න් එය පැහැදිලි කෙරේ.

වගු අංක 5.3: සයිබර් ඒකක හරහා සේවය ලබා ගන්නා ගොවීන්ගේ ප්‍රතිශතය

සේවය සපයා ගන්නා ආකාරය	අනුරාධපුරය		හම්බන්තොට		මහනුවර		සේවය ලැබූ සමස්ත ගොවි නියැදිය	
	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය
01. සයිබර් ඒකකයට ගොස් සේවය ලබා ගැනීම.	24	61.5	24	80.0	14	66.7	62	69
02. කෘෂිකර්ම උපදේශක විසින් ක්ෂේත්‍රය තුළ පවත්වනු ලබන වැඩසටහන් හරහා සේවය ලබා ගැනීම.	07	18.0	03	10.0	02	9.5	12	13
03. ඉහත දෙයාකාරයෙන් ම සේවය සපයා ගැනීම.	08	20.5	03	10.0	05	23.8	16	18
එකතුව	39	100.0	30	100.0	21	100.0	90	100.0

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2010).

5.3.1 ඒකකයට ගොස් දැනුම හා උපදෙස් ලබා ගැනීම

මෙහිදී ගොවියා තමන්ට අවශ්‍ය දැනුම හා උපදෙස් ලබා ගැනීම සඳහා සයිබර් ඒකකයට යන අතර එහි ඒකක භාර කෘෂිකර්ම උපදේශක හරහා එම සේවාව ලබා ගැනේ. ඒකක භාර කෘෂිකර්ම උපදේශක විසින් ගොවියා රැගෙන එන ගැටලුව හඳුනාගෙන ඒකක සතු සී.ඩී. තැටි උපයෝගී කරගෙන දැනුවත් කිරීම සිදු කරනු ලබයි. පරිගණක භාවිතය පිළිබඳ දැනුවත්භාවයක් ඇති ගොවීන් හට තමන් විසින් ම එම සී.ඩී. තැටි නරඹා ඉගෙන ගැනීමට යොමු කෙරේ. සමස්ත නියැදියෙන් 69%ක් ඒකකයට ගොස් උපදෙස් ලබා ගෙන ඇත. අධ්‍යයනයට භාජනය කළ දිස්ත්‍රික්ක පිළිබඳ නියැදි සැලකීමේ දී අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් 61.5%ක් හම්බන්තොට දිස්ත්‍රික්කයේ 80%ක් මහනුවර දිස්ත්‍රික්කයෙන් 66.7%ක් මෙම පහසුකම ලබා ගැනීම සඳහා ඒකකයට ගොස් ඇත. ඒකකයට ගොස් පුහුණුව ලබා ගැනීමේ දී ගොවීන් විවිධ වූ දුෂ්කරතාවලට මුහුණ

දුන් බව ද සාකච්ඡා මාර්ගයෙන් දත්ත ලබා ගැනීමේ දී පැහැදිලි විය. මෙම අපහසුතා අතර මෙම කාර්යයට ම වෙන් වූ නිලධාරියෙකු නොමැති වීම ගොවීන්ට ගැටලුවක් වී ඇති බව පැහැදිලි විය.

5.3.2 ක්ෂේත්‍රයේ පැවැත් වූ වැඩසටහන්වලට සහභාගී වී දැනුම හා තොරතුරු ලබා ගැනීම

ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශවලට අයත් කෘෂිකර්ම උපදේශකවරුන් හා එක්ව ඒකක භාර කෘෂිකර්ම උපදේශකවරයා විසින් මෙම පුහුණු වැඩසටහන් සංවිධානය කරනු ලබයි. කෘෂිකර්ම උපදේශකවරයා විසින් තම බල ප්‍රදේශයේ සුදුසු ස්ථානයකට ගොවීන් කැඳවා සයිබර් ඒකකයට අයත් උපකරණ එම ස්ථානයට රැගෙන ගොස් සී.ඩී. පට උපයෝගී කරගෙන ගොවීන්ට අදාළ දැනුම ලබා දීම සිදු කෙරේ. සයිබර් ඒකකයේ උපකරණ ක්ෂේත්‍රයට ප්‍රවාහනය කිරීමට අපහසු අවස්ථාවල දී ගම්මානයේ පවතින පරිගණකයක් භාවිතා කරමින් දැනුම් ලබා දීමේ වැඩසටහන් සිදු කරනු ලබයි. අධ්‍යයනයට අනුව ක්ෂේත්‍රයේ පුහුණු වැඩසටහන් සඳහා පමණක් සහභාගී වූ ගොවීන් සංඛ්‍යාව 13% ක් වන අතර දිස්ත්‍රික්ක නියැදි පිළිබඳ සැලකීමේ දී අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් 18% ක් ක්ෂේත්‍රයේ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වී ඇත.

5.3.3 ඉහත දෙයාකාරය ම භාවිතා කර සේවය ලබා ගැනීම

සයිබර් ඒකකයට යෑමත්, ක්ෂේත්‍රයේ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීමත් යන දෙයාකාරය ම භාවිතා කරමින් දැනුම ලබා ගත් ගොවීන් සංඛ්‍යාව නියැදියෙන් 18% කි. දිස්ත්‍රික්ක නියැදීන් අනුව අනුරාධපුරය සහ මහනුවර දිස්ත්‍රික්කයන් හි ගොවීන් මෙම ආකාර දෙක ම ප්‍රයෝජනයට ගැනීමේ වැඩි නැඹුරුවක් පැවති බව පෙනුණි.

5.4 ගොවීන් ලබා ඇති දැනුමේ ස්වභාවය හා එහි ප්‍රයෝජනවත්භාවය

ගොවීන් සයිබර් ව්‍යාප්ති ඒකක හරහා ලබා ගෙන ඇති දැනුමේ ස්වභාවය, එනම් කුමන ක්ෂේත්‍රයන්ට අයත් වූ දැනුම හා තොරතුරු ලබා ගෙන ඇත් ද යන්න මෙහි දී විමසුමට ලක් කරන ලදී. ක්ෂේත්‍රය තුළ පවත්වන පුහුණු වැඩසටහන් සඳහාත් ඒකකය තුළ දී දැනුම ලබා දීම සඳහාත් ප්‍රධාන ලෙසට නිලධාරීන් භාවිතා කර ඇත්තේ සී.ඩී. තැටි වන අතර, ගොවීන් මෙම සී. ඩී. තැටි භාවිතා කිරීම හරහා දැනුම ලබාගැනීමට වැඩි නැඹුරුවක් දක්වා ඇත්තේ වාණිජ වටිනාකමක් සහිත බෝග සඳහා බව නිලධාරීන් සමග කෙරුණු සාකච්ඡාවලින් පැහැදිලි විය. එනම් එළවළු, පලතුරු හා ගෙවතු වගාවන් පිළිබඳවත් බිම්මල් නිෂ්පාදනය හා විසිතුරු මල් හා පත්‍ර වගාවන් පිළිබඳවත් ගොවීන් වැඩි නැඹුරුවක් දක්වා තිබීම විශේෂත්වයකි. මෙය ගෙවතු වගා ප්‍රවර්ධනය සඳහා මහත් රුකුළක් බව ද නිලධාරීන්ගේ අදහස විය. තව ද ආරක්ෂිත කෘෂිකර්මාන්තය, පාංශු සංරක්ෂණය සහ කොම්පෝස්ට් නිෂ්පාදනයට අදාළ තොරතුරු ලබා ගැනීම ගෙවතු වගා වැඩසටහන තව දුරටත් වැඩි වර්ධනය වීමට උත්ප්‍රේරකයක් වී ඇති බව පැහැදිලි විය. විශේෂයෙන් කොම්පෝස්ට් නිෂ්පාදනයේ දී පෙර භාවිතා කළ සාම්ප්‍රදායික ක්‍රමයන්ට අමතර ව නව ක්‍රමයන් පිළිබඳ දැනුම ලබාගැනීමට හැකිවීම ගොවීන්ට විශාල පහසුවක් වී ඇති බව ගොවීන් හා කෙරුණු සාකච්ඡාවල දී පැහැදිලි විය.

මේ අනුව, සි. ඩී. තැටි භාවිතා කරමින් ක්ෂේත්‍රයේ පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන්වලින් සහ ඒකකයට පැමිණ ලබාගත් දැනුමේ ස්වභාවය විමසීමේ දි ගොවීන් විසින් ඔවුන් ලබාගත් දැනුම් ක්ෂේත්‍ර පිළිබඳ විවිධ අදහස් පළ කරන ලදි, එම ලබාදුන් අදහස් ගොවින් සයිබර් ඒකක හරහා ලබාගත් දැනුම හඳුනා ගැනීමට ඉතා වැදගත් විය. දත්ත ලබාගැනීමේ දී එක් ගොවියෙකු ප්‍රතිචාර කීපයක් ලබා දුන් අතර පහත වගුව මඟින් ප්‍රතිචාර සියල්ලේ ව්‍යාප්තිය ප්‍රතිශත මඟින් ඉදිරිපත් කර ඇත.

වගු අංක 5.4: ගොවීන්ට වඩාත් ප්‍රයෝජනවත් වූ සහ වැඩි නැඹුරුවක් දක්වා ඇති පුහුණු ක්ෂේත්‍රයන්

ක්ෂේත්‍රයන්	ගොවි ප්‍රතිචාර සංඛ්‍යාව	ප්‍රතිශතය n=90
පලතුරු වගාව	30	33.3
ගෙවතු වගාව	15	16.6
එළවළු වගාව	14	15.6
වී වගාව	13	14.4
කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය	09	10.0
බිම්මල් වගාව	08	8.9
මල් හා විසිතුරු පත්‍ර වගාව	06	6.6
ඒකාබද්ධ පළිබෝධ පාලනය	05	5.6
ඉඟුරු වගාව හා අලෙවිය	05	5.6
වෙනත්	03	3.3

* ප්‍රතිශත ගණනය කර ඇත්තේ ප්‍රතිචාර සංඛ්‍යාව මත නොව ප්‍රතිචාර දැක්වූ ගොවීන් සංඛ්‍යාව අනුව ය. ඒ නිසා ප්‍රතිශත එකතුව 100 ට සමාන නො වනු ඇත.

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2010).



ප්‍රස්තාර අංක 5.3: ගොවීන්ට වඩාත් ප්‍රයෝජනවත් වූ සහ වැඩි නැඹුරුවක් දක්වා ඇති පුහුණු ක්ෂේත්‍රයන්

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2010).

පුස්තකාලය
LIBRARY

සී.ඩී. තැටි හරහා දැනුම ලබාගත් ගොවීන්ගෙන් 33.3%ක් සඳහන් කළේ ඔවුන්ට පලතුරු වගාව පිළිබඳ ලැබුණු පුහුණුව අනෙකුත් පුහුණුවීම්වලට වඩා ප්‍රයෝජනවත් වූ බව යි. දිස්ත්‍රික් නියැදිය පිළිබඳ සැලකීමේ දී අනුරාධපුරය හා හම්බන්තොට දිස්ත්‍රික්කයන්ට අයත් ගොවීන් වැඩි වශයෙන් පලතුරු වගාව පිළිබඳ පුහුණුවීම් පිළිබඳ නැඹුරුවක් දක්වා ඇති බව පෙනුණි. විශේෂයෙන් පැපොල් වගාව, කෙසෙල් සහ වැල්දොඩම් වගාවන් පිළිබඳ පුහුණුවීම් ලබා එම දැනුම ප්‍රයෝජනයට ගත් බව සඳහන් විය.

අධ්‍යයනය සිදු කෙරුණු කාලපරිච්ඡේදය තුළ ගෙවතු වගා වැඩසටහන් පිළිබඳ ගොවීන්ගේ වැඩි අවධානයක් යොමු වී පැවති බවත් ගොවීන්ගෙන් 16.6%ක් ගෙවතු වගා පුහුණුවීම් ලබා ගෙවත්ත ක්‍රමවත් ව වගා කිරීමට පෙළඹුණු බවට අදහස් දැක්වූහ.

එළවළු, වී වගාව පිළිබඳ ලැබූ පුහුණුවීම්, ව්‍යාපාරික මට්ටමින් එළවළු වගාවේ නිරත ගොවීන්ට වැඩි ප්‍රයෝජනයක් වූ බව ගොවීන්ගෙන් 15.6% සඳහන් කළහ. මිරිස් වගාවත් කරවිල, වැටකොලු, මෑ වැනි මැසි බෝග වගාවන් පිළිබඳ සී.ඩී. හරහා දැනුම ලබා ගත් බව ගොවීන්ගේ අදහස් අතර විය.

එසේ ම වී වගාව, කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය පිළිබඳවත් ගොවීන් ලබාගත් දැනුම ඔවුන්ට ප්‍රයෝජනවත් වී ඇත. විශේෂයෙන් කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳ නව ක්‍රමවේදයක් හා භාවිතය සම්බන්ධයෙන් ලැබූ දැනුම වර්තමාන ගෙවතු වගාවන්ට විශේෂ රුකුළක් වී ඇති බව පෙනුණි. මල් හා විසිතුරු පතු වගාව පිළිබඳ ගොවීන්ගේ නැඹුරුවක් පැවති අතර එම දැනුමෙන් ප්‍රයෝජනය ගත් කාන්තාවන් අනුරාධපුර නගරයේ සයිබර් ඒකකයේ දී හමුවිය.

පූජාපිටිය සයිබර් ඒකකයේ ඉඟුරු වගාව හා අලෙවිය පිළිබඳ ලබාදුන් දැනුම භාවිතා කරමින් වර්තමානයේ ගොවීන් කණ්ඩායමක් වාර්ෂික ව අලියා ඕම සමාගමට ඉඟුරු සැපයීමේ ව්‍යාපෘතියක් ආරම්භකර ඇති බව ද අධ්‍යයනයේ දී හෙළිවිය.

5.4.1 ඒකක හරහා ලබා ගත් සේවයෙ හි ප්‍රයෝජනවත්භාවය

සයිබර් ඒකකය මගින් ලබා ගත් විවිධ දැනුම් ක්ෂේත්‍රයන්ට අදාළ දැනුම හේතුවෙන් වාණිජ බෝග වගාව, කාබනික ගොවිතැන් ක්‍රම මෙන් ම නව තාක්ෂණික ක්‍රම ගැන උනන්දුවක් ඇති වූ බව සේවය ලබාගත් ගොවීහු සඳහන් කළහ.

මෙසේ විවිධ ක්ෂේත්‍රයන් යටතේ ලබා ගත් දැනුම ප්‍රයෝජනවත් වූ ගොවීන් ද අධ්‍යයනයේ දී හමු වූ අතර එසේ ලබාගත් දැනුම උපයෝගී කරගනිමින් තම වගාවන් ක්‍රමානුකූලව හා නිර්දේශිත ආකාරයට සකස් කර ගැනීමෙන් වැඩි අස්වැන්නක් ලබා ආදායම් උපයා ගැනීමට හැකි වූ බවත්, පරිසර හිතකාමී වගා ක්‍රමයන් හි නියැළීමට උනන්දුවක් ඇති වීමට එම ලබාගත් දැනුම ප්‍රයෝජනවත් වූ බවත් ගොවීහු සඳහන් කළහ. මීට අමතර ව තමන්ට ඇති වන කෘෂි ගැටලු විසඳා ගැනීමට කඩිනම් ක්‍රමයක් ලෙසින් මෙයින් ලැබූ දැනුම ප්‍රයෝජනවත් වූ බවත් සුළු පිරිසකට වෙළෙඳපොළ තොරතුරු ද සපයා ගැනීමට මෙය ප්‍රයෝජනවත් වී ඇති බව අධ්‍යයනයේ දී අනාවරණය විය.

5.5. සයිබර් ව්‍යාප්ති ඒකකවලින් සේවය ලබා ගැනීමේ දී ගොවීන් මුහුණදෙන ගැටලු

සයිබර් ඒකකවලින් දැනුම හා තොරතුරු ලබා ගැනීමේ දී පවතින ගැටලු සහගත තත්ත්වය පිළිබඳ ව සයිබර් ඒකකවලින් සේවය ලැබූ ගොවි නියැදියෙන් කරුණු විමසන ලදී. ඒ සඳහා ප්‍රතිචාර දැක්වූ ගොවීන් සංඛ්‍යාව අනුව ප්‍රතිශතය ගණනය කර ගොවීන්ට පවතින ගැටලුවල තත්ත්වය පැහැදිලි කර ඇත.

වගු අංක 5.5 : සයිබර් ව්‍යාප්ති ඒකකවලින් සේවය ලබා ගැනීමේ දී පවතින ගැටලු

ගැටලු	ප්‍රතිචාර සංඛ්‍යාව	ප්‍රතිශතය n=90
සයිබර් ඒකයට පැමිණෙන විට ඒකක භාර කෘෂිකර්ම උපදේශක මහතුන් ක්ෂේත්‍ර රාජකාරි කටයුතුවල නියුක්ත වී සිටීම නිසා උපදෙස් ලබා ගැනීමට නො හැකි වීම.	46	51
ඒකකයේ පවත්වන පුහුණු වැඩසටහන්වලට සහභාගී වීමේ දී ඒකකයේ පවතින ඉඩ පහසුකම් ප්‍රමාණවත් නො වීම.	20	22
සයිබර් ඒකක හරහා වැඩසටහන් පැවැත්වීමට පෙර දැනුම් දීමක් නො කිරීම.	13	14
සේවය ලබා ගැනීමට ඒකකයට යනවිට උපකරණ ක්‍රියාවිරහිත වී පැවතීම.	12	13
සයිබර් ඒකකය දුරින් පිහිටා ඇති නිසා එහි සේවය ලබා ගැනීමට යාමේ දුෂ්කරතා පැවතීම	07	08

* ප්‍රතිශත ගණනය කර ඇත්තේ ප්‍රතිචාර සංඛ්‍යාව මත නොව ප්‍රතිචාර දැක්වූ ගොවීන් සංඛ්‍යාව අනුව ය. එබැවින් ප්‍රතිශත එකතුව 100 ට සමාන නොවේ.

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2010).

ඉහත වගුව අනුව, සේවය ලබාගත් ගොවීන්ගෙන් 51% ක් සඳහන් කළේ, සයිබර් ඒකකයට පැමිණෙන විට ඒකක භාර කෘෂිකර්ම උපදේශක මහතුන් වෙනත් රාජකාරි කටයුතුවල නියුක්ත වීම නිසා උපදෙස් ලබා ගැනීමේ හැකියාවක් නොමැති වූ බව යි. මේ පිළිබඳව කෘෂිකර්ම උපදේශක සමග කළ සාකච්ඡාවල දී පැහැදිලි වූයේ, සයිබර් ඒකකයේ රාජකාරිවලට අමතරව තමන්ට අයත් බල ප්‍රදේශය තුළත් රාජකාරි කළ යුතු බවත්, ක්ෂේත්‍රයේ රාජකාරි නිසි පරිදි සිදු නො වීම තමන්ගේ කාර්යසාධනයට විශාල ගැටලුවක් වන බැවින් එයට ප්‍රමුඛස්ථානයක් ලබාදෙන බවත් ය.

තවද ඒකකයේ පුහුණු වැඩසටහන් පැවැත්වීමේ දී ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති බව 22% ක් ගොවීන්ගේ මතය විය. මේ බව නිරීක්ෂණ දත්ත මගින් ද පැහැදිලි විය. බහුතරයක් සයිබර් ඒකක ස්ථාපිත කොට පැවතියේ එයට අදාළ උපකරණ සහිතව වෙන් වූ කාමරයක නොව කෘෂිකර්ම උපදේශක කාර්යාලයට වෙන් වූ පොදු කොටසේ ය. සමහර ස්ථානවල පැවතියේ සයිබර් උපකරණවලට අමතරව මේසයක් හා පුටුවක් පමණි. ප්‍රමාණවත් ඉඩ පහසුකම් නො තිබීම හා ආකර්ශනීය තත්ත්වයක් නො වීම සයිබර් ඒකකය වෙත ගොවීන්ගේ පැමිණීම අඩු වීමට හේතුවක් වී ඇත. මෙම අධ්‍යයනයේ දී නිලධාරීන් සමග කෙරුණු සාකච්ඡා වල දී ද තහවුරු වූයේ, ප්‍රමාණවත් ඉඩපහසුකම් හා උපකරණ නොමැති වීම සේවය ලබා දීමේ දී ගැටලුවක් වන බව යි.

එමෙන් ම සයිබර් ඒකකය උපයෝගී කරගෙන ක්ෂේත්‍රය තුළ කෘෂිකර්ම උපදේශකවරුන් විසින් පවත්වනු ලබන දැනුම ලබාදීමේ වැඩසටහන් පිළිබඳ ගොවීන් වෙත පෙර දැනුම් දීමක් නො කිරීම ද ඔවුන්ට ගැටලුවක් බව 14%ක් වූ ගොවීන් පිරිසක් සඳහන් කළහ. සේවය ලබා නො ගත් ගොවීන්ගෙන් 72%ක් ප්‍රකාශ කළේ, මෙවැනි පුහුණු වැඩසටහන් ගැන තමන්ට කිසිදු දැනුම් දීමක් සිදු නො වන බව යි. මේ පිළිබඳ ව නිලධාරීන් සමග කෙරුණු සාකච්ඡාවල දී පැහැදිලි වුයේ, ගොවීන් දැනුවත් කළ ද ගොවීන් තුළ ඒ පිළිබඳ කිසිදු උනන්දුවක් නොමැති වීම මෙයට හේතු වන අතර වගාවට නිරතුරු උනන්දුවක් දක්වන්නන් එසේ ම ගොවිතැන් කටයුතුවලින් කිසියම් වූ ආදායමක් ලබා ගන්නා ගොවීන් මෙයට සහභාගි වන බව යි. කෙසේ නමුත් ප්‍රචාරක යාන්ත්‍රණය තවදුරටත් වැඩි කළ යුතු බව නිලධාරීන්ගේ මතය විය.

සයිබර් ඒකකයට අයත් පරිගණකය ක්‍රියාවිරහිත වී පැවතීම 13%ක් වූ ගොවීන්ට ගැටලුවක් වී තිබිණි. වාර කිහිපයක් සයිබර් ඒකකය වෙත ගිය ද උපකරණ අලුත්වැඩියා කර නො තිබුණු බව සඳහන් විය. නිලධාරීන් සැම විට ම පවසා ඇත්තේ, එම උපකරණ අලුත්වැඩියාව සඳහා අදාළ ආයතන වෙත යැවූ බව යි. උපකරණ ක්‍රියාවිරහිත වූ විට අලුත්වැඩියා කිරීමේ දී විශාල ගැටලුවකට නිලධාරීන් මුහුණ දෙන බව නිලධාරීන්ගේ අදහස විය. එනම්, තම ආයතනයේ අනුමැතිය ඇතිව ගන්නෝරුව ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථානයට යැවිය යුතු බවත් එම ක්‍රියාවලිය සඳහා කාලයක් ගත වන බවත් ය. මේ පිළිබඳ ව ලබාගත් අධ්‍යයන දත්තවලින් ද ඒ බව පැහැදිලි විය. එනම්, පේමඩුව, මහියංගනය වැනි සයිබර් ඒකකය ක්‍රියාවිරහිත වී කාලයක් ගත වුවත් තවදුරටත් ඒවා ප්‍රතිසංස්කරණය වී නොමැති බව පැහැදිලි වේ. නමුත් යන්ත්‍රය ක්‍රියා විරහිත වුව ද තමන්ගේ පෞද්ගලික උපකරණ මගින් ගොවීන් වෙත සේවයක් ලබාදුන් කෘෂිකර්ම උපදේශකවරුන් ද අධ්‍යයනයේ දී හමුවිය. උදාහරණයක් ලෙසින් පුජාපිටිය, කඹුරුපිටිය, මීගහජඳුර වැනි සයිබර් ඒකකය පෙන්වා දිය හැකි ය.

ගොවිජන සේවා මධ්‍යස්ථානයට අයත් බල ප්‍රදේශය ඉතා විශාල වන අතර කෙළවර පිහිටි ගම්මානයක ගොවියෙකු මෙම ස්ථානයට පැමිණීම අතිමහත් දුෂ්කර කාර්යයක් වේ. සමස්ත ගොවි නියැදියෙන් 8%ක් ගොවීන් ප්‍රකාශ කළේ තමන්ට මෙම ගැටලුව පවතින බව යි. මේ සඳහා ගම්මාන තුළ පුහුණු වැඩසටහන් පැවැත්වීම යම් තරමක හෝ මෙම ගොවීන් අස්වැසිල්ලක් වී ඇත. ගොවීන්ට පවතින දුර පිළිබඳ වගු අංක 5.9 තුළින් එය පැහැදිලි කෙරේ.

වගු අංක 5.6: ගොවීන්ට සයිබර් ඒකකයට ඇති දුර ප්‍රමාණය

සයිබර් ඒකකයට ඇති දුර	සේවය ලබාගත් ගොවීන්		සේවය නො ලබන ගොවීන්	
	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය
කි.මී. 1 ට අඩු	11	12.2	11	12.1
කි.මී. 1-3	28	31.1	39	42.9
කි.මී. 3-5	20	22.2	22	24.2
කි.මී. 5 <	31	34.5	19	20.8
එකතුව	90	100.0	91	100.0

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2010).

සේවය ලබාගත් ගොවීන්ගේ වැඩි ප්‍රතිශතයක් එනම්, 34.5%ක් කිලෝමීටර් 50 වඩා දුරින් සිට මෙම ඒකකයේ සේවය ලබා ගෙන ඇත. නමුත් කිලෝමීටර් 10 අඩු දුරකින් සිටින ගොවීන්ගෙන් දැනුම ලබා ගෙන ඇත්තේ 12.2%ක ගොවි ප්‍රතිශතයකි. මේ අනුව සයිබර් ඒකකයට පවතින දුර ගැටලුවක් සේ ගොවීන් පැවසුව ද දුරින් සිටින ගොවීන් බහුතරයක් සේවය ලබා ගෙන තිබීමෙන් පැහැදිලි වන්නේ අවශ්‍යතාව පවතී නම්, දුර පිළිබඳ නිර්ණායකය ගැටලුවක් නො වන බව යි.

සේවය නො ලබන ගොවීන්ගෙන් 79.2%ක් ම සිටින්නේ, කිලෝමීටර් 50 වඩා අඩු දුර ප්‍රමාණයකින් බව ද ඉහත වගුවෙන් පෙන්නුම් කෙරේ. මෙයින් පැහැදිලි වන්නේ, මෙම පිරිස සයිබර් ඒකකය පිළිබඳ දැනුවත් භාවය අඩු බවකි.

5.6 සයිබර් ව්‍යාප්ති ඒකක ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ගොවීන්ගේ යෝජනා

කෘෂිකාර්මික දැනුම හා තොරතුරු සන්නිවේදනය ඉහළ නැංවීමට ග්‍රාමීය ගොවි ප්‍රජාවන් වෙත ප්‍රවේශ කර වූ සයිබර් ව්‍යාප්ති ඒකකයන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ඒකකය වෙතින් සේවය ලැබූ සහ එයින් සේවය නො ලැබූ ගොවීන් දැක් වූ යෝජනා ප්‍රතිශත විශ්ලේෂණයක් ලෙස වගු අංක 5.10 තුළින් ඉදිරිපත් කෙරේ.

වගු අංක 5.7 : සයිබර් ඒකක ඵලදායී ලෙස ක්‍රියාත්මක වීමට ගොවීන්ගේ යෝජනා

යෝජනා	ප්‍රතිචාර සංඛ්‍යාව	ප්‍රතිශතය **n=181**
සයිබර් ඒකක පිහිටුවා ඇති බවට සහ ඉන් ලබාගත හැකි සේවාවන් පිළිබඳ ගොවීන් දැනුවත් කිරීම.	111	61.3
ඒකක භාර නිලධාරීන්ගේ මැදිහත් වීම වැඩි කිරීම.	64	35.4
නව උපකරණ ඒකකය වෙත ලබා දීම.	61	33.7
ගොවීන්ට පහසු වේලාවක, පහසු ස්ථානයක ඒකකය හරහා සංවිධානය කෙරෙන ක්ෂේත්‍ර වැඩසටහන් පැවැත්වීම.	58	32.0
ප්‍රදේශයට ගැළපෙන දැනුම හා තොරතුරු ලබා දීමට හැකි වන පරිදි ඒකකය සකස් කිරීම.	43	23.7
ඒකකයට අයත් සී. ඩී. තැටි බැහැර ගෙන යාමට පවතින පහසුකම් වැඩි කිරීම.	40	22.0

* ප්‍රතිශත ගණනය කර ඇත්තේ ප්‍රතිචාර සංඛ්‍යාව මත නොව ප්‍රතිචාර දැක්වූ ගොවීන් සංඛ්‍යාව අනුව ය. ඒ නිසා ප්‍රතිශත එකතුව 100 ට සමාන නොවේ.

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය දත්ත, (2010).

ඒකක හරහා සේවය ලැබූ ගොවීන් මෙන් ම එයින් සේවය නො ලැබූ ගොවීන්ගෙන් වැඩි පිරිසක් (61.3%) දැක් වූ ප්‍රතිචාරය වූයේ, සයිබර් ඒකක පිළිබඳ ව සහ එයින් ගොවීන්ට ලබා ගත හැකි සේවාවන් පිළිබඳ ව ඔවුන්ව වඩාත් දැනුවත් කිරීම හරහා ඒකකයන්ගේ ඵලදායීතාව ඉහළ නැංවීමේ හැකියාවක් පවතින බව යි.

එසේ ම බොහෝ අවස්ථාවල දී ඒකකයන් වෙත ගොවීන් පැමිණෙන විට ඒකක භාර නිලධාරීන් අනෙකුත් රාජකාරි සමඟින් වඩාත් කාර්යබහුලභාවයකින් සිටීම නිසා සේවය ලබා ගැනීමට බාධාවක් වන බැවින් ඔවුන්ගේ මැදිහත් වීම මීට වඩා වැඩි කිරීමට හැකි නම් ඒකකයේ අපේක්ෂිත කාර්යභාරය ඉටු වන බව ගොවීන්ගෙන් 35.4%ක් ප්‍රතිචාර දැක්වූහ.

බොහෝ ඒකකයන් හි උපකරණ (විශේෂයෙන් පරිගණකය) නිරන්තරයෙන් ක්‍රියා විරහිත වී පැවතීම ඒකකයන් හි ක්‍රියාකාරිත්වයට බාධාවක් වී ඇති බැවින්, නව උපකරණ ලබා දීමට ගොවීන්ගෙන් 33.7%ක් යෝජනා කරන ලදී.

සයිබර් ඒකකයේ උපකරණ භාවිතා කර ක්ෂේත්‍රය තුළ පවත්වන වැඩසටහන් ගොවීන්ට පහසු වේලාවන් හා පහසු ස්ථානයන් හි සංවිධානය කිරීමෙන් වැඩි ගොවි සහභාගීත්වයක් ඇති වීම හරහා ඒකකයන් හි ඵලදායීත්වය ඉහළ නැංවෙන බව ගොවීන් ගෙන් 32%ක් සඳහන් කළහ.

සයිබර් ඒකකය හරහා ලබා දෙන දැනුම හා තොරතුරු අදාළ ප්‍රදේශයට වඩාත් උචිත වන පරිදි සකස් විය යුතු බව ගොවීන්ගෙන් 23.7%ගේ අදහස විය. එසේ ම ගොවීන් ගෙන් 22%ක් සඳහන් කළේ, ඒකකයට අයත් සී. ඩී. තැටි බැහැර ගෙන යෑමට දැනට පවතින පහසුකම් තවදුරටත් වර්ධනය කිරීම තුළින් ඒකකයේ සේවාව වඩාත් ව්‍යාප්ත කළ හැකි බව යි.

හය වැනි පරිච්ඡේදය

සයිබර් ව්‍යාප්ති ඒකකයන් හි සාර්ථක / අසාර්ථකභාවය

6.1 හැඳින්වීම

සයිබර් ව්‍යාප්ති ඒකකයන් පිළිබඳ ගොවීන්ගේ දැනුවත්භාවය, ගොවීන් ඒ හරහා ලබාගත් සේවාවන් හා එහි ප්‍රයෝජනවත්භාවය, සේවය ලබා ගැනීමේ දී ගොවීන් මුහුණ දෙන ගැටලු සහ ඒකකයන් හි සාර්ථකත්වයට ගොවීන් දැක් වූ යෝජනා පිළිබඳ ව ඉහත පරිච්ඡේදයේ දී විමර්ශනයට ලක් කළ අතර, ස්ථාපිත සයිබර් ව්‍යාප්ති ඒකකයන් හි සාර්ථක / අසාර්ථකභාවය හා සාර්ථක / අසාර්ථකභාවයට හේතු වූ කරුණු, උපකරණවල ක්‍රියාකාරීත්වය හා නඩත්තු කටයුතු පිළිබඳ වර්තමාන තත්ත්වය, ඒකකයේ සාර්ථක / අසාර්ථකභාවයට ඒකක භාර නිලධාරීන්ගේ දායකත්වය පිළිබඳ ව මෙම පරිච්ඡේදයේ දී විමසුමට ලක් කෙරේ. ඊට අමතර වශයෙන් සයිබර් ඒකකයන් හි ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථාන නිලධාරීන් ගේ දායකත්වය පිළිබඳවත් සැකෙවින් විමර්ශනය කෙරෙන අතර, සමස්ත ව්‍යාප්ති කාර්යභාරයට යම් පිටුබලයක් සයිබර් ඒකක හරහා ලැබී ඇත් ද? යන්න පිළිබඳවත් මෙම පරිච්ඡේදයේ දී විස්තර කෙරේ. විශේෂයෙන් මෙම පරිච්ඡේදය ඒකක භාර නිලධාරීන්ගෙන් ලබා ගත් තොරතුරු මත පදනම් වේ.

ග්‍රාමීය ගොවි ප්‍රජාවට තොරතුරු හා දැනුම ලබා ගැනීමේ හැකියාව පහසු කරවීමේ අරමුණින් ස්ථාපිත මෙම සයිබර් ඒකකයන් හි ක්‍රියාකාරීත්වය සාර්ථකව සිදු වන්නේ ද සාර්ථකව සිදු වන්නේ නම් ඊට හේතු වූ කරුණු කවරේ ද? එසේ නොමැති නම් මෙම කාර්යය අසාර්ථක ද අසාර්ථක යැයි පැවසීමට හේතු කවරේ ද යන්න පිළිබඳ නියැදියට අයත් ඒකක බාර නිලධාරීන්ගෙන් සහ නියැදියට අයත් නොවූ අනෙකුත් ඒකක සියල්ලෙහි ම ඒකක භාර නිලධාරීන්ගෙන් අදහස් විමසීමක් සිදු කර තොරතුරු රැස් කරන ලදී, ඒ සඳහා ක්‍රම 3 ක් යටතේ දත්ත ලබා ගැනීම සිදු විය.

01. නියැදි සමීක්ෂණය මගින් නියැදියට අයත් ඒකක භාර නිලධාරීන් වෙත ඉදිරිපත් කරන ලද ප්‍රශ්නාවලියක් ආශ්‍රයෙන් දත්ත ලබා ගැනීම.
02. නියැදි සමීක්ෂණයට අයත් නොවූ අනෙකුත් සියලු ඒකක භාර නිලධාරීන් වෙත තැපැල් මාර්ගිකව ඉදිරිපත් කෙරුණු ප්‍රශ්නාවලියක් ආශ්‍රයෙන් දත්ත ලබා ගැනීම.
03. දුරකථන සාකච්ඡා මාර්ගයෙන් දත්ත ලබා ගැනීම.

6.2. සයිබර් ව්‍යාප්ති ඒකකයන් හි සාර්ථක/අසාර්ථක භාවය පිළිබඳ ඒකක භාර නිලධාරීන්ගේ සමස්ත අදහස

ස්ථාපිත සයිබර් ඒකක 55න් ඒකක 07ක දුරකථන ක්‍රියාවිරහිත වී පැවති බැවින් කිසිදු ප්‍රතිචාරයක් එම ඒකකවලින් ලබාගත නො හැකි විය. එබැවින් සමීක්ෂණය සඳහා ප්‍රතිචාර ලබාගත හැකි වුයේ ඒකක 48න් පමණි. එම ඒකක 48හි ඒකක භාර නිලධාරීන් සමග සාකච්ඡා කිරීමෙන් ලබාගත් දත්ත විශ්ලේෂණය කිරීමේ දී ඔවුන්ගෙන් 64.6% ක් සඳහන් කළේ, මෙය අසාර්ථක ව ක්‍රියාත්මක වන වැඩසටහනක් බව යි. පහත සඳහන් වගු අංක 6.1න් සහ ප්‍රස්තාර අංක 6.1න් සයිබර් ඒකකයන් හි සාර්ථක/අසාර්ථකභාවය පිළිබඳ සමස්ත නිලධාරීන්ගේ ප්‍රතිචාරය පැහැදිලි කෙරේ.

වගු අංක 6.1: සාර්ථක/අසාර්ථකභාවය පිළිබඳ ඒකක භාර නිලධාරීන්ගේ සමස්ත ප්‍රතිචාරය

	ප්‍රතිචාර ලබාගත් ආකාරය						සමස්ත එකතුව	
	නියැදි සමීක්ෂණය		තැපැල් මාර්ගික සමීක්ෂණය		දුරකථන සාකච්ඡා		සංඛ්‍යාව	ප්‍රතිශතය
	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය		
සාර්ථකව ක්‍රියාත්මක වේ	04	44.0	10	41.7	03	20.0	17	35.4
අසාර්ථකව ක්‍රියාත්මක වේ	05	56.0	14	58.3	12	80.0	31	64.6
එකතුව	09	100.0	24	100.0	15	100.0	48	100.0

* සයිබර් ඒකක 55 න් 07 ක දුරකථන ක්‍රියා විරහිත වී ඇති බැවින් කිසිදු ප්‍රතිචාරයක් ලබා ගත නො හැකි විය. එබැවින් ප්‍රතිචාර ලබාගත හැකි වුයේ සයිබර් ඒකක 48න් පමණි.

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත. (2010)..



ප්‍රස්තාර අංක 6.1: සයිබර් ඒකකවල සාර්ථක / අසාර්ථකභාවය පිළිබඳ ඒකක භාර නිලධාරීන්ගේ සමස්ත ප්‍රතිචාරය

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත. (2010).

6.2.1 ඒකකයන් හි සාර්ථක / අසාර්ථකභාවය පිළිබඳ එක් එක් ක්‍රමවේදයන් යටතේ ඒකක භාර නිලධාරීන් දැක් වු අදහස්

නියැදි සමීක්ෂණයට භාජනය වු නිලධාරීන්, තැපැල් මාර්ගික සමීක්ෂණයට ප්‍රතිචාර දැක් වු නිලධාරීන් සහ දුරකථන සාකච්ඡා මාර්ගයෙන් තොරතුරු දැක් වු නිලධාරීන්ගේ අදහස් වෙන් වෙන් වශයෙන් මෙහි දී විශ්ලේෂණය කෙරේ.

6.2.2 නියැදි සමීක්ෂණය මගින් දත්ත ලබා ගැනීම

නියැදි සමීක්ෂණයේ දී සයිබර් ඒකක 09ක ඒකක භාර නිලධාරීන් 09 දෙනෙකු සඳහා ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කරන ලදී. එම සමීක්ෂණ දත්තවලට අනුව නිලධාරීන්ගෙන් 56%ක් ප්‍රකාශ කළේ, සයිබර් ඒකක අසාර්ථක ලෙස ක්‍රියාත්මක වන වැඩසටහනක් බව යි. සාර්ථක ලෙස ක්‍රියාත්මක වන වැඩසටහනක් බව සඳහන් කළේ නිලධාරීන්ගෙන් 44%ක් පමණි.

වගු අංක 6.2 : සයිබර් ඒකකවල සාර්ථක/අසාර්ථකභාවය පිළිබඳ නියැදියට අයත් නිලධාරීන්ගේ මතය

	අනුරාධපුර		හම්බන්තොට		මහනුවර		සමස්ත එකතුව	
	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය
සාර්ථකයි	00	00	02	67.0	02	100.0	04	44.0
අසාර්ථකයි	04	100.0	01	33.0	00	00	05	56.0
එකතුව	04	100.0	03	100.0	02	100.0	09	100.0

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2010).



ප්‍රස්තාර අංක 6.2: සයිබර් ඒකකවල සාර්ථක / අසාර්ථකභාවය පිළිබඳ නියැදියට අයත් නිලධාරීන්ගේ මතය

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2010).

6.2.3 තැපැල් මාර්ගිකව දත්ත ලබා ගැනීම

මෙහි දී නියැදියට අයත් නොවූ සියලු ම ඒකකයන්ට අයත් ඒකකභාර නිලධාරීන්ගේ දත්ත, ප්‍රශ්නාවලියක් මාර්ගයෙන් ලබා ගැනීමට අපේක්ෂා කෙරිණි. එම ප්‍රශ්නාවලිය සඳහා තොරතුරු ලබා ගැනීමට හැකි වූයේ, ඒකක 24 කින් පමණි. එම ඒකක 24 කට අයත් නිලධාරීන්ගෙන් 58.3%ක් (14) මෙම ඒකක සාර්ථක ලෙස ක්‍රියාත්මක නො වන බව සඳහන් කර තිබුණි. 41.7%ක් (10 දෙනෙක්) සඳහන් කර තිබුණේ ඒකකය සාර්ථක ලෙස ක්‍රියාත්මක වන නමුත් සාර්ථකව ක්‍රියාත්මක වීමේ දී වුව ද පරිගණක ක්‍රියාවිරහිත වීම් වැනි ගැටලුවලට මුහුණු දෙන බව යි. ඒ බව ප්‍රස්තාර අංක 6.3න් පෙන්නුම් කෙරේ.



ප්‍රස්තාර අංක 6.3: සයිබර් ඒකකවල සාර්ථක / අසාර්ථක භාවය පිළිබඳ තැපැල් මාර්ගිකව ලැබුණු ප්‍රතිචාර

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2010).

6.2.4 දුරකථන සාකච්ඡා මාර්ගයෙන් දත්ත ලබා ගැනීම

තොරතුරු ලබා ගැනීම සඳහා තැපැල් මාර්ගිකව ප්‍රශ්නාවලි යොමු කළ ද විවිධ හේතු නිසා පිළිතුරු නො ලැබුණු ඒකක භාර නිලධාරීන් වෙත දුරකථන මාර්ගයෙන් සම්බන්ධ වී තොරතුරු ලබා ගැනීම සිදු කරන ලදී. දුරකථන මාර්ගයෙන් තොරතුරු ලබාගත් ඒකක භාර නිලධාරීන් සංඛ්‍යාව 15කි. සයිබර් ඒකක 7ක දුරකථන ක්‍රියාවිරහිත වී පැවති බැවින් එම ඒකකවලින් කිසිදු ප්‍රතිචාරයක් ලබා ගත නො හැකි විය. ප්‍රතිචාර දැක්වූ ඒකක භාර නිලධාරීන්ගෙන් 80%ක් ම සඳහන් කළේ සයිබර් ඒකක සාර්ථකව ක්‍රියාත්මක නො වන බව යි.



ප්‍රස්තාර අංක 6.4: සයිබර් ඒකකවල සාර්ථක / අසාර්ථකභාවය පිළිබඳ දුරකථන සාකච්ඡා මාර්ගයෙන් ලැබුණු ප්‍රතිචාර
මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත. (2010).

6.3 සයිබර් ඒකක සාර්ථක යැයි සඳහන් කිරීමට හේතු වූ කරුණු

සයිබර් ඒකක සාර්ථක යැයි සඳහන් කළ නිලධාරීන්ගෙන් එම ඒකක සාර්ථක යැයි සඳහන් කිරීමට හේතු පිළිබඳ විමසීමක් සිදු කෙරිණි. ඒ අනුව ලැබුණු ප්‍රතිචාර පහත වගු අංක 6.3න් ඉදිරිපත් කර ඇත.

වගු අංක 6.3 : සයිබර් ඒකක සාර්ථක යැයි සඳහන් කිරීමට හේතු

හේතු	නිලධාරීන්ගේ ප්‍රතිචාර සංඛ්‍යාව	*ප්‍රතිශතය* $n=17$
නව තාක්ෂණය උපයෝගී කරගෙන ගොවීන්ට දැනුම හා තොරතුරු ලබා දීමට හැකි වීම	15	88.2
කෘෂි උපදේශකවරුන්ගේ ව්‍යාප්ති කාර්යය පහසු කරගැනීමට මෙම උපකරණ ප්‍රයෝජනවත් වීම හා නිලධාරීන්ගේ දැනුම අලුත් කරගැනීමට හැකිවීම.	12	70.6
ගොවීන් හට ලබා දෙන දැනුම පහසුවෙන් අවබෝධ කරවීමට හැකිවීම සහ ගොවීන්ට ස්වයං අධ්‍යයනයන්ට ප්‍රවේශ වීමේ හැකියාව පැවතීම.	08	47.1
පාසල් ළමුන්, උපාධි අපේක්ෂකයින් වැනි අධ්‍යාපනය ලබන කණ්ඩායම් වෙත ද දැනුම ලබා ගැනීමට හැකි ස්ථානයක් වීම.	06	35.3

* ප්‍රතිශතය ගණනය කර ඇත්තේ ප්‍රතිචාර සංඛ්‍යාව මත නොව නිලධාරීන් සංඛ්‍යාව අනුව ය. ඒ නිසා ප්‍රතිශත එකතුව 100 ට සමාන නො වනු ඇත.

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත. (2010).

නිලධාරීන්ගෙන් 88.2%ක් සඳහන් කරන්නේ සයිබර් ඒකකයට අයත් පරිගණකය සහ සී.ඩී. තැටි උපයෝගී කර ගනිමින් ගොවීන්ට කෘෂිකර්මාන්තයට අදාළ නව තාක්ෂණික දැනුම හා තොරතුරු ලබා දීමේ හැකියාව ලැබුණු බවයි. එසේ ම ගොවීන්ට දැනුම ලබා දීමේ දී රූප මාධ්‍යය ද භාවිතා කිරීමේ හැකියාව පැවතීම එහි සාර්ථකත්වයට හේතු වන බව යි. බෝගයන්හි ලෙඩරෝගවල ස්වභාවය රූප මාධ්‍යයෙන් පෙන්වීමට හැකි වීමෙන් ගොවීන් හට යම් ගැටලුවක් පිළිබඳ වඩාත් හොඳින් අවබෝධ කරවීමේ හැකියාව පවතින බව ද ඔවුහු සඳහන් කළහ. එසේ ම පරිගණක සාක්ෂරතාව සහිත ගොවීන්ට ස්වයං අධ්‍යයනයන් හි නියැළීමේ හැකියාව පැවතීම ද එහි සාර්ථකත්වයට බලපාන බව නිලධාරීන්ගෙන් 47.1%ක් ප්‍රකාශ කළහ. ප්‍රදේශය තුළ පාසල් ළමුන්ට, ගුරුවරුන්ට සහ උපාධි අපේක්ෂකයින්ට කෘෂිකාර්මික ක්ෂේත්‍රය සම්බන්ධයෙන් සිදු කිරීමට යෙදෙන පැවරුම් සඳහා තොරතුරු ලබා ගැනීමට හැකියාව පැවතීම සයිබර් ඒකක සාර්ථක යැයි සඳහන් කිරීමට හේතු වූ කරුණක් බව නිලධාරීන්ගෙන් 35.3%ක් සඳහන් කළහ. ඒකක භාර කෘෂිකර්ම උපදේශකවරුන්ට කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ නවතාවයන් පිළිබඳ දැනුම ලබා ගත හැකි වීම, සයිබර් ඒකක හරහා ලැබෙන ප්‍රයෝජනයක් බව නිලධාරීන්ගෙන් 70.6%ක් සඳහන් කළහ. ඒ හරහා කෘෂිකර්ම උපදේශකවරුන්ගේ ක්ෂේත්‍රයේ ව්‍යාප්ති කාර්යය උසස් අන්දමින් ඉටු කිරීම පහසු කිරීමේ උපකරණයක් ලෙස සයිබර් ඒකකය භාවිතයට ගත හැකි බව ඔවුහු සඳහන් කළහ. ගොවි පුහුණු අත්පත්‍රිකා, පවර් පොයින්ට් වැඩසටහන් හා නොයෙකුත් වාර්තා සකස් කරගැනීමට මෙම ඒකකය පැවතීම පහසුවක් බව ඔවුහු තවදුරටත් සඳහන් කළහ.

6.4 සාර්ථක ව ක්‍රියාත්මක කෙරෙන සයිබර් ඒකක කිහිපයක නිරීක්ෂණය කළ විශේෂිත ක්‍රියාකාරකම්

සාර්ථකව ක්‍රියාත්මක කෙරෙන සයිබර් ඒකකයන් වෙත අධ්‍යයන කණ්ඩායමේ වැඩි අවධානයක් යොමු වූ අතර, එයිනුත් ඒකකයන් කිහිපයක පමණක් පහත සඳහන් විශේෂිත ක්‍රියාකාරකම් නිරීක්ෂණය කළ හැකි විය.

01. සයිබර් ඒකකය භාර කෘෂිකර්ම උපදේශක මහතා ඒකකය තුළ නොමැති අවස්ථාවක ගොවි මහතෙකු යම් අවශ්‍යතාවයක් සඳහා ඒකකයට පැමිණිය හොත්, ගොවි මහතාගේ නම, ලිපිනය, දුරකථන අංකය සහ පැමිණි කාරණය සඳහන් කර යෑමට ඒකකය තුළ ලොග් සටහන් පොතක් පවත්වාගෙන යාම.

02. කෘෂිකර්ම උපදේශකවරයා විසින් අදාළ ගොවියාගේ අවශ්‍යතාවය ඉටු කිරීම සඳහා ගත් ක්‍රියා මාර්ගය එම ලොග් සටහන් පොතේ ම සටහන් කිරීම.

03. සියලු ගොවීන්ට ඒකක භාර කෘෂිකර්ම උපදේශකවරයා සමග දුරකථනයෙන් සම්බන්ධ වීමේ හැකියාව ඇති කර තිබීම හා ඒ හරහා ගැටලුවලට විසඳුම් ලබාදීම.

04. ප්‍රදේශයට ආවේණික බෝග සහ එම බෝගවලට වැළඳෙන රෝගවල ඡායාරූප රැගෙන, ඒවා පරිගණකය තුළ ගබඩා කර තිබීම එනම්, බෝගයකට වැළඳෙන දිලීර හෝ වයිරසයෙ හි සියලු අවස්ථා පිළිබඳ ඡායාරූප පවත්වා ගැනීම.

05. සයිබර් ඒකකයක් නොමැති ප්‍රදේශවලට අයත් ගොවීන්ට ද මෙම ඒකක හරහා දැනුම ලබාදීමේ වැඩසටහන් පැවැත්වීම. උදා: මාරස්සන සයිබර් ඒකකය මගින් තලාතුවල, ගලහ, ලෙවුල වැනි ප්‍රදේශවල ගොවීන් ගෙන්වා පුහුණු වැඩසටහන් සිදුකර ඇති බව නිරීක්ෂණය කළ හැකි විය.

06. ප්‍රදේශය තුළ ඉහළ මට්ටමින් වගා කළ හැකි බෝග හඳුනා ගනිමින්, ඒ සඳහා ගොවීන්ට ඒකකය හරහා පුහුණුව ලබා දෙමින් එම බෝග නිෂ්පාදන සඳහා වෙළෙඳපළක් ද සපයාදීමට කටයුතු කිරීම. උදා: පූජාපිටිය සයිබර් ඒකකය හරහා ඉඟුරු වගාව පිළිබඳ ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඉඟුරු වගා නිෂ්පාදනයන් වාර්ෂිකව අලියා බීම සමාගමට ලබාදීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සහ මාරස්සන සයිබර් ඒකකය තුළ ගොවි කණ්ඩායමක් සංවිධානය කර තක්කාලි පිටරට යැවීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර තිබීම.

6.5 සයිබර් ඒකක අසාර්ථක ව ක්‍රියාත්මක වීමට හේතු වූ කරුණු

සයිබර් ඒකකයන් හි සාර්ථක/අසාර්ථකභාවය පිළිබඳ නිලධාරීන්ගෙන් කළ විමසුමේ දී එය අසාර්ථකව ක්‍රියාත්මක වන වැඩසටහනක් බව නිලධාරීන්ගෙන් 64.6 ක් සඳහන් කළ අතර, එසේ වීමට හේතු වූ කරුණු පිළිබඳ එම නිලධාරීන් දැක් වූ අදහස් ප්‍රතිශත ව්‍යාප්තියක් ලෙසින් පැහැදිලි කර ඇත.

වගු අංක 6.4 : සයිබර් ඒකක අසාර්ථක ව ක්‍රියාත්මක වීමට හේතු වූ කරුණු

	හේතු	අදහස් දැක්වූ නිලධාරීන් සංඛ්‍යාව	ප්‍රතිශතය n=31
01.	ඒකකය පිළිබඳ ගොවීන් තුළ පවතින අඩු දැනුවත්භාවය නිසා ගොවීන්ගේ සහභාගිත්වය අඩුවීම.	30	96.7
02.	ඒකකයට වෙන් වූ නිලධාරියෙකු නොමැති වීම.	28	90.3
03.	ලබා දී ඇති උපකරණ නඩත්තුව සඳහා පැහැදිලි ක්‍රමවේදයක් නොමැති වීම.	26	83.9
04.	ඒකකය ස්ථාපිත කර ඇති ස්ථානයේ ඉඩ පහසුකම් පිළිබඳ ගැටලු.	24	77.4
05.	ඉහළ නිලධාරීන්ගෙන් ලැබෙන අඩු සහයෝගීතාවය.	20	64.5
06.	සයිබර් ඒකක සඳහා පුහුණුව ලැබූ නිලධාරීන් වෙනත් ස්ථාන වෙත මාරුවීම් ලැබීම.	16	51.6
07.	ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථානයේ මුල්කාලීනව පැවති සහයෝගීතාවය අඩුවීම.	12	38.7
08.	ක්ෂේත්‍ර පුහුණු සඳහා සයිබර් ඒකකයේ උපකරණ ප්‍රවාහනය කිරීමේ අපහසුතාවය.	09	29.0
09.	ගොවීන්ට සයිබර් ඒකකය සඳහා පැමිණීමට ඇති දුර ප්‍රමාණය වැඩිවීම.	07	22.6

* ප්‍රතිශතය ගණනය කර ඇත්තේ, ප්‍රතිචාර සංඛ්‍යාව මත නොව ප්‍රතිචාර දැක්වූ නිලධාරීන් සංඛ්‍යාව අනුව ය. ඒ නිසා ප්‍රතිශත එකතුව 100 ට සමාන නොවේ.

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2010).

සයිබර් ඒකක අසාර්ථක වීමට ප්‍රධාන වශයෙන් බලපෑ හේතුව ලෙස නිලධාරීන් සඳහන් කරන්නේ ඒකක පිළිබඳ ගොවීන්ගේ ඇති අඩු දැනුවත්භාවය යි. අදහස් දැක් වූ නිලධාරීන්ගෙන් 96.7%ක ප්‍රමාණයක් මේ බව ප්‍රකාශ කළහ. බොහෝ අවස්ථාවල දී ගොවීන් සිතනුයේ, කෘෂිකර්ම උපදේශක කාර්යාලය තුළ පවතින පරිගණකය ඇත්තේ නිලධාරීන්ගේ භාවිතයට සඳහා පමණක් බව යි. එසේ ම පරිගණකය හා ඒ ආශ්‍රිත නව තාක්ෂණික මෙවලම් භාවිතය පිළිබඳ විශ්වාසයක් ගොවීන් තුළ නො තිබීම ද මෙම ඒකක වෙත පැමිණීමට බාධාවක් ලෙස පවතින බව නිලධාරීන් හා කෙරුණු සාකච්ඡාවල දී පැහැදිලි විය.

සයිබර් ඒකකයට ම වෙන් වූ නිලධාරියෙකු නො සිටීම එහි රාජකාරී සාර්ථක නො වීමට හේතුවක් බව නිලධාරීන්ගෙන් 90.3% සඳහන් කරන ලදී. සයිබර් ඒකකයේ ක්‍රියාකාරීත්වය පවත්වා ගැනීමට පැවරී ඇත්තේ එම කෘෂිකර්ම උපදේශක කාර්යාලයට අයත් මූලස්ථාන භාර කෘෂිකර්ම උපදේශකට හෝ එහි සිටින මේ සම්බන්ධව පුහුණුවක් ලබා දුන් කෘෂිකර්ම උපදේශකවරයෙකුට වේ. නමුත් මෙම නිලධාරීන්ට වෙන් වූ රාජකාරී බල ප්‍රදේශයක් ද පවතින බැවින් එහි රාජකාරී කටයුතුවල නියුක්ත වීමේ දී සයිබර් ඒකකයේ පරිපාලන කටයුතු අඩපණ වන බව ඔවුහු සඳහන් කළහ.

ඒකකය වෙත ලබාදී ඇති උපකරණ අතරින් පරිගණකය විටින් විට ක්‍රියා විරහිත වීමත් එසේ ක්‍රියා විරහිත වූ විට කඩිනමින් පිළිසකර කරගැනීමට පැහැදිලි ක්‍රමවේදයක් නොමැති වීම ද සයිබර් ඒකක සාර්ථකව පවත්වා ගැනීමට බාධාවක් බව නිලධාරීන්ගෙන් 83.9%කගේ අදහස විය. පරිගණක හරහා ගොවීන්ට පුහුණු වැඩසටහන් ආරම්භ කර පවත්වාගෙන යන අතරතුර පරිගණකය ක්‍රියා විරහිත වුව හොත් නැවතත් එය අලුත්වැඩියා කරගැනීමට හැකි වන්නේ, සයිබර් ඒකකය හා පුහුණු වැඩසටහන පිළිබඳ ගොවීන්ගේ සහ නිලධාරීන්ගේ ද මතකයෙන් ඉවත් වූ පසුව බව නිලධාරීන් හා කෙරුණු කණ්ඩායම් සාකච්ඡාවල දී පැහැදිලි විය. එවිට ගොවීන් තුළ සයිබර් ඒකක පිළිබඳවත් නිලධාරීන් පිළිබඳවත් පවතින විශ්වාසය ද පළුදු වන බව නිලධාරීන් විසින් සඳහන් කරන ලදී. උපකරණයක් ක්‍රියා විරහිත වූ විට එය නැවත යථා තත්ත්වයට පත් කර ගැනීමට පැහැදිලි ක්‍රමයක් නොමැති වීම මෙයට විශේෂයෙන් බලපාන බව ඔවුහු පැහැදිලි කරන ලදී. ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථානයේ මුල්කාලීනව පැවති සහයෝගය අඩුවීම යන කාරණයත් මෙම තත්ත්වයන්ට හේතුවක් ලෙසින් සඳහන් කරන නිලධාරීන්ගේ ප්‍රතිශතය 38.8%කි. සයිබර් ඒකක පිහිටුවීම, උපකරණ ලබාදීම, ඒකක භාර නිලධාරීන්ට පරිගණක පුහුණුවීම් ලබාදීම සී.ඩී. තැටි නිෂ්පාදනය කර ඒකක වෙත ලබාදීම හා උපකරණ ක්‍රියාවිරහිත වූ විට එය අලුත්වැඩියා කිරීමට සහාය වීම යනාදී අංශ යටතේ ඔවුන්ගේ සහයෝගය මුල්කාලීනව ලැබුණු නමුත් කාලයක් සමග එම තත්ත්වය වෙනස් වූ බවත් එය සයිබර් ඒකකයන් හි සාර්ථක ක්‍රියාකාරීත්වය අඩපණ වීමට බලපානු ලැබූ හේතුවක් බවත් නිලධාරීහු සඳහන් කළහ.

සයිබර් ඒකකය ස්ථාපිත කර ඇති ස්ථානයේ පවතින ඉඩ පහසුකම් ප්‍රමාණවත් නො වීම නිසා වැඩි ගොවීන් පිරිසක් ඒකකය වෙත ගෙන්වා ගැනීමට නො හැකි බව නිලධාරීන්ගෙන් 77.4%ක් සඳහන් කරන ලදී. සයිබර් ඒකකය ස්ථාපිත කර ඇත්තේ, ගොවිජන සේවා මධ්‍යස්ථානය තුළ පවතින කෘෂිකර්ම උපදේශක කාර්යාලයට ම අයත් කොටසක වේ. එහි පරිගණකය හා අනෙකුත් මෙවලම් ස්ථානගත කළ විට ගොවීන් කිහිපදෙනෙකුට හෝ එයට ප්‍රවේශ වීම ඉතා අපහසු බවත්, සයිබර් ඒකකය වෙතින් අපේක්ෂා කෙරෙන ගොවීන් දැනුවත් කිරීම් කාර්යය ඉටු කිරීමට එය විශාල බාධාවක් බවත් නිලධාරීන්ගේ අදහස විය.

ක්ෂේත්‍රයේ ඉහළ නිලධාරීන්ගේ පවතින ආකල්පයන් හා ඔවුන්ගෙන් ලැබෙන සහයෝගය අඩුවීම ද සයිබර් ඒකක සාර්ථක ලෙස පවත්වා ගෙන යාමට පවතින ගැටලුවක් බව නිලධාරීන්ගෙන් 64.5%ක ප්‍රමාණයක් සඳහන් කළහ. කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ පහළම මට්ටමේ ආයතනයන්ට පරිගණකය ආශ්‍රයෙන් කළ හැකි කාර්යයන් නොමැති බවත් එම තාක්ෂණයන් හි නඩත්තුව ලංකාව වැනි රටකට ඔරොත්තු නොදෙන බවත් වැනි කරුණු සමහර ඉහළ නිලධාරීන් තුළ පවතින ආකල්පය බව සයිබර් ඒකක භාර නිලධාරීන් විසින් සඳහන් කරන ලදී. මෙවැනි සෘණ ආකල්ප නිසා නව තාක්ෂණයන් ගොවීන් වෙත ප්‍රවේශ කරවීම ඉතා අපහසු කාර්යයක් බව ඔවුහු සඳහන් කළහ.

එසේ ම මුල්කාලීන ව ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථානය වෙතින් පරිගණක පුහුණුව ලැබූ ඒකක භාර නිලධාරීන් වෙනත් කෘෂිකර්ම උපදේශක කාර්යාලවල වෙනත් රාජකාරී සඳහා ස්ථාන මාරුවීම් ලැබීම හෝ සේවා අනුයුක්ත කිරීම් වැනි හේතු ද ඒකක තුළ පවත්වා ගෙන පැමිණි වැඩකටයුතු අඩපණ වී සයිබර් ඒකක අසාර්ථක වීමට හේතු වන බව නිලධාරීන්ගෙන් 51.6% ක් සඳහන් කළහ.

සයිබර් ඒකක හරහා ක්ෂේත්‍රය තුළ සංවිධානය කර පවත්වනු ලබන පුහුණු වැඩසටහන් සඳහා ඒකකයේ සිට අවශ්‍ය උපකරණ ප්‍රවාහනය කරගැනීමේ දී පවතින ගැටලු ද මෙහි කාර්යයන් සාර්ථක ලෙස පවත්වා ගැනීමට අපහසුවක් බව නිලධාරීන්ගෙන් 29% ක් සඳහන් කළහ. ඒකකයෙන් බැහැරට උපකරණ රැගෙන යාමට වාහනයක් නොමැති වීම එම ගැටලුව බව පැහැදිලි වූ අතර යතුරුපැදිවල උපකරණ ගෙන යාම සිදුකළත් එය දුෂ්කර කාර්යයක් බව නිලධාරීන්ගේ අදහස විය.

එසේ ම ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් දුර බැහැර වෙසෙන ගොවීන්ට ඒකකය වෙත පැමිණීම පිළිබඳ ගැටලුව බලපාන බැවින් එම තත්ත්වය ද සයිබර් ඒකක අසාර්ථක වීමට හේතුවක් බව නිලධාරීන්ගෙන් 22.6% ක් සඳහන් කරන ලදී. ඒකකයෙන් වඩාත් දුරින් සිටින ගොවීන්ට සයිබර් ඒකක පිළිබඳ දැනුවත් නො වීම පිළිබඳවත් ගැටලු පවතින බව නිලධාරීන් විසින් සඳහන් කරන ලදී.

6.6. ඒකකයන් හි සාර්ථක / අසාර්ථකභාවයට ඒකක භාර නිලධාරීන්ගේ දායකත්වය

ගොවිජන සේවා මධ්‍යස්ථානය ග්‍රාමීය ගොවීන්ගේ කෘෂිකාර්මික තොරතුරු දැනුම සපයන ප්‍රධාන ස්ථානය යි. එහි දී ගොවිජන ප්‍රාදේශීය නිලධාරීවරයා ඇතුළු අනෙකුත් නිලධාරීන් වෙතින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළ වූ තොරතුරු ලබා ගන්නා අතර තාක්ෂණික දැනුම හා තොරතුරු සැපයීමේ කාර්යභාරය කෘෂිකර්ම උපදේශකවරයා විසින් ඉටුකරනු ලබයි. ඊට අමතර ව කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරයා, සංවර්ධන නිලධාරීන් කෘෂිකර්ම උපදේශකවරයාට සහය දැක්වීම සාමාන්‍ය තත්ත්වය යි.

කෘෂිකර්ම උපදේශක කාර්යාල තුළ ස්ථාපිත කර ඇති සයිබර් ඒකකයේ භාරකාරත්වය පවරා ඇත්තේ එහි මුලස්ථාන භාර කෘෂිකර්ම උපදේශකවරයාට වන අතර, මධ්‍යම රජයට අයත් කෘෂිකර්ම උපදේශක කාර්යාලවල මුලස්ථාන භාර කෘෂිකර්ම උපදේශකවරයාට අමතර ව තවත් කෘෂිකර්ම උපදේශකවරුන් කිහිප දෙනෙකු සිටී. උදාහරණයක් ලෙස ශ්‍රාවස්තිපුර සයිබර් ඒකකය භාර කෘෂිකර්ම උපදේශකවරයාට සහය දැක්වීම සඳහා තවත් කෘෂිකර්ම උපදේශකවරුන් තිදෙනෙක් එහි ඒකරාශී වී සිටි බව දැකගත හැකි විය. නමුත්

පළාත් මට්ටමේ කෘෂිකර්ම උපදේශක කාර්යාලවල පවතින සයිබර් ඒකකයන් හි ඒකක භාරව කටයුතු කිරීමටත් සමස්ත ව්‍යාප්ති වැඩසටහන ක්‍රියාත්මක කිරීමටත් සිටියේ එක් කෘෂිකර්ම උපදේශකවරයෙක් බව නිරීක්ෂණය කළ හැකි විය. එයට හේතුව වන්නේ පළාත් සභා යටතේ ඇති කෘෂිකර්ම උපදේශක කාර්යාලවලට අනුයුක්තව සිටින කෘෂිකර්ම උපදේශකවරුන් ප්‍රමාණය සීමිත වීම යි.

මෙම තත්ත්වය සයිබර් ඒකකයන්ගේ සාර්ථක / අසාර්ථකභාවයට බලපානු ලබන්නේ කෙසේ ද යන්න පිළිබඳ විමසීමේ දී සයිබර් ඒකකයක සිටින කෘෂිකර්ම උපදේශකවරුන් සංඛ්‍යාව වැඩිවීම හෝ අඩුවීම සයිබර් ඒකකයේ ක්‍රියාකාරිත්වයේ වෙනස් වීමකට වැඩි බලපෑමක් නො වන බව පැහැදිලි විය. උදාහරණයක් ලෙස සාර්ථක ව ක්‍රියාත්මක වන සයිබර් ඒකක වන මාරස්සන, පූජාපිටිය, රාස්සගල වැනි සයිබර් ඒකක අයත් වන්නේ පළාත් සභා යටතට වේ. එසේ ම සයිබර් ඒකක භාර නිලධාරීන් සඳහන් කළ එක් අදහසක් වූයේ, සයිබර් ඒකකය භාරව කටයුතු කිරීමට එක් කෘෂිකර්ම උපදේශකවරයෙකුට අමතර ව තවත් කිහිප දෙනෙකු සිටීම සමහර අවස්ථාවල දී ගැටළුවක් වන බව යි. එනම් සයිබර් ඒකකයේ උපකරණ නඩත්තුව හා එම උපකරණ භාරව කිහිපදෙනෙකු සිටින විට එම උපකරණවලට යම් හානියක් සිදු වුව හොත් වගකීම භාරගැනීමට කිසිවෙකු සූදානම් නොමැති බවයි. ඒ අනුව, සයිබර් ඒකකයන් හි සාර්ථකභාවයට නිලධාරීන් සංඛ්‍යාව වැඩි වීම බලනොපාන බව පෙනී යයි.

සයිබර් ඒකකයන් හි සාර්ථක / අසාර්ථකභාවයට ඒකක භාර නිලධාරීන්ගේ සේවා කාලය හා පළපුරුද්ද යම් බලපෑමක් සිදුකරන්නේ ද යන්න අධ්‍යයනයේ දී විමසන ලදි. පහත 6.5 ප්‍රස්තාරයෙන් පෙන්නුම් කෙරෙන්නේ නියැදියට අයත් ඒකක භාර නිලධාරීන්ගේ සේවා කාලය කොතරම් ප්‍රමාණයක් ද යන්න පිළිබඳ ව වේ.

වගු අංක 6.5: සයිබර් ඒකක භාර නිලධාරීන්ගේ සේවා කාලය

සයිබර් ඒකකය	සේවා කාලය (වර්ෂ)
අනුරාධපුර නගරය	16
ශ්‍රාවස්තිපුර	31
රාජාංගනය ව/ඉවුර	04
පේ මඩුව	04
අම්බලන්තොට	11
යෝධකණ්ඩිය	30
මීගහ ජදුර	09
මාරස්සන	18
පූජාපිටිය	16

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2010).

පුස්තකාලය
LIBRARY



ප්‍රස්තාර අංක 6.5: සයිබර් ඒකක භාර නිලධාරීන්ගේ සේවා කාලය
මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2010).

ඉහත ප්‍රස්තාරයට අනුව නියැදියට අයත් වූ ඒකක භාර නිලධාරීන්ගෙන් බහුතරයක් වසර 10 ට වඩා සේවා පළපුරුද්දක් සහිත නිලධාරීන් බව පෙනුණි. වසර 05 කට අඩු සේවා කාලයක් ඇති නිලධාරීන් සිටියේ දෙදෙනෙක් පමණි. ශ්‍රාවස්තිපුර සහ යෝධකණ්ඩියට අයත් ඒකක භාර නිලධාරීන් වසර 30 ක පළපුරුද්දක් සහිත වුවන් විය. එසේ වුවත් සමීක්ෂණ දත්තවලට අනුව එම ඒකකයන් හි කැපී පෙනෙන සාර්ථකත්වයක් පෙන්නුම් නො කෙරේ. ඒ අනුව ඒකක භාර නිලධාරීන්ගේ සේවා පලපුරුද්ද සයිබර් ඒකකයන් හි සාර්ථකත්වයට බලපානු ලැබූ හේතුවක් නො වන බව පැහැදිලි වේ.

සයිබර් ඒකකයන් හි කටයුතු සාර්ථක ලෙස පවත්වාගෙන යනු ලබන ඒකකයන් හි නිලධාරීන් හා කෙරුණු සාකච්ඡාවල දී පැහැදිලි වුයේ පරිගණක සාක්ෂරතාව ඉහළ මට්ටමින් පැවතීම හා ඉහළ නිලධාරීන් සමග මෙන් ම අනෙකුත් නිලධාරීන් සමග දැඩි සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් කටයුතු කිරීමේ හැකියාවක් ඔවුන් සතුව පවතින බව යි. මේ අනුව සාර්ථකව පවත්වාගෙන යනු ලබන ඒකක සංඛ්‍යාව සමස්තය හා සසඳන විට ඉතා සුළු ප්‍රතිශතයක් වන අතර ඒ සඳහා ද බලපා ඇත්තේ ප්‍රධාන වශයෙන් ම ඒකක භාර නිලධාරියාගේ පවතින ඉහළ මට්ටමේ පරිගණක සාක්ෂරතාවය සහ උනන්දුව යි. වඩාත් කැපවීමක් සහිතව තම ව්‍යාප්ති කාර්යභාරය සඳහා සයිබර් ඒකකය සහය කරගන්නා අතර ම ඒ හරහා ග්‍රාමීය ගොවීන්ගේ තොරතුරු හා දැනුම පිළිබඳ අවශ්‍යතාවය සැපිරීමට කටයුතු කිරීමත් මෙම නිලධාරීන් තුළින් පෙනුණු කැපී පෙනුණු ලක්ෂණ විය.

6.7 ඒකකයන් හි සාර්ථක / අසාර්ථකභාවයට ශ්‍රව්‍ය-දෘශ්‍ය ඒකකයේ දායකත්වය

2004 වර්ෂයේ දී සයිබර් ඒකක ස්ථාපිත කිරීම ආරම්භයේ දි ශ්‍රව්‍ය දෘශ්‍ය මධ්‍යස්ථානය විසින් සෑම සයිබර් ඒකකයක ම ක්‍රියාකාරීත්වය සඳහා පුරෝගාමී ව කටයුතු සිදුකර ඇත. එහි උපකරණයන් හි නඩත්තු කටයුතු හා අලුත්වැඩියා කටයුතු සිදු කිරීමෙන් හා අධීක්ෂණය කිරීමෙන් ද ඒකක භාර නිලධාරීන්ට පරිගණක පුහුණුව

ලබා දීමෙන් ද ඔවුන් දැඩි සහයෝගයක් සයිබර් ඒකක වෙත ලබා දී ඇත. ඒකක භාර නිලධාරීන් සඳහන් කරන ආකාරයට එම තත්ත්වය වසරක් වැනි කාල සීමාවකින් අවසන් වී ඇත. සමීක්ෂණයේ දී මේ පිළිබඳ ව ඒකක භාර නිලධාරීන්ගෙන් 67%ක් සඳහන් කළේ, ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථානයේ මුල්කාලීනව පැවති සම්බන්ධතාවයත්, සහයෝගයත් වර්තමානයේ නො පවතින බව යි. එසේ වීමට හේතු විමසීමේ දී ඒකක භාර නිලධාරීන් සඳහන් කළේ, කෘෂිකර්ම උපදේශක කාර්යාලය අයත් වන මධ්‍යම රජයේ ප්‍රතිපාදනයන්ගෙන් හෝ පළාත් රාජ්‍ය ප්‍රතිපාදනයන්ගෙන් හෝ අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදනයන් සපයා ගනිමින් ඒකකය විසින් ම තම නඩත්තු හා අලුත්වැඩියා කටයුතු සිදුකර ගතයුතු බව ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථාන භාර නිලධාරීන්ගේ අදහස වන බව යි. මේ සම්බන්ධයෙන් ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථාන භාර නිලධාරීන්ගෙන් කළ විමසුමේ දී ඔවුන් සඳහන් කළේ, ඒකක පිහිටුවීමේ වැඩසටහන නියමු ව්‍යාපෘතියක් ලෙසින් ක්‍රියාත්මක වූ බවත් විවිධ ව්‍යාපෘති හා වැඩසටහන් හි මූල්‍ය ප්‍රතිපාදන මත ස්ථාපිත කිරීම් සිදු කළත් දීර්ඝකාලීන නඩත්තු ක්‍රමවේදයක් පැහැදිලිව මේ සඳහා නො තිබුණු බව යි.

නියැදියට අයත් වූ ඒකක භාර නිලධාරීන්ගෙන් 33% ක් සඳහන් කළේ ඒකකය සඳහා සී.ඩී. තැටි ලබා දීමෙන් සහ ඒකකය අධීක්ෂණය කිරීමෙන් තවදුරටත් ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථානය තම ඒකකය වෙත සහයෝගය දක්වන බව යි. එසේ වුවත් එම සහයෝගය උපකරණයන් හි නඩත්තුව හෝ අලුත්වැඩියාව හෝ සම්බන්ධයෙන් නො වන බව සඳහන් කළ අතර එය අධ්‍යයන දත්ත තුළින් ද පැහැදිලි විය. එනම්, අධ්‍යයනයට ලක් වූ සයිබර් ඒකකයන් හි උපකරණවල ක්‍රියාකාරීත්වය පිළිබඳ පැහැදිලි කෙරෙන වගු අංක 6.6 තුළින් පෙනී යන ආකාරයට සෑම ඒකකයක ම එක් උපකරණයක් හෝ අබලන් තත්ත්වයේ පවතින අතර එය අලුත්වැඩියා කිරීමේ පැහැදිලි ක්‍රමයක් නො පවතින බව යි. මේ සම්බන්ධයෙන් ශ්‍රව්‍ය-දෘශ්‍ය ඒකකයේ නිලධාරීන් තවදුරටත් සඳහන් කළේ, පරිගණක ආශ්‍රිත දැනුම හෝ වෙනයම් වූ ඊට අදාළ දැනුමක් ලබා ගැනීමට අවශ්‍ය නම් ඒකක භාර නිලධාරියෙක් ඇත්නම් ඔහුගේ අවශ්‍යතාව ඉටු කිරීමට නිලධාරීන් ඕනෑ ම අවස්ථාවක සූදානම් බව යි.

6.7.1 ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථානය මගින් ඒකක භාර නිලධාරීන්ට ලබාදුන් පුහුණු වීම් සහ වර්තමාන තත්ත්වය

සෑම ඒකක භාර නිලධාරියෙකුට ම පරිගණකය පිළිබඳ මූලික දැනුම ලබා දීම පළමු පුහුණු වීමේ දී සිදු කර ඇත. අනතුරු ව කාලීන ව පරිගණක ක්ෂේත්‍රයේ ඇති වන නව දැනුම ලබා දීම සඳහා පුහුණු වීම් සිදු කර ඇති අතර, සයිබර් ඒකකයට අදාළ ව ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථානයේ සිදු කෙරෙන වැඩසටහන් පිළිබඳව ද ඒකක භාර නිලධාරීන්ට පුහුණුවීම් සිදු කර ඇත. උදාහරණ, "විකි ගොවියා" වැඩසටහන හඳුන්වා දිය හැකි ය.

ඊට අමතර ව වර්ඩ්, පවර් පොයින්ට්, අන්තර්ජාලයට පිවිසීම, සී.ඩී. පට කොපි කිරීම, සකස් කිරීම, ලිපි සකස් කිරීම, ඊ-මේල් පණිවිඩ යැවීම වැනි පරිගණක ක්ෂේත්‍රයේ මූලික දැනුම ලබා දීම සඳහා පුහුණු වීම් සිදු කර ඇත. ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථානය මගින් ඒකක භාර නිලධාරීන්ට වසරකට ලබා දෙන පුහුණුවීම් නියමිත සංඛ්‍යාවක් ප්‍රමාණ කර නොමැත. අවශ්‍යතාවය මත නිලධාරීන්ට පුහුණුවීම් සංවිධානය කළ බව නිලධාරීන් සඳහන් කළහ.

අධ්‍යයනයට ලක් වූ ඒකක භාර නිලධාරීන් ඉතා සුළු ප්‍රමාණයක් හැර අනෙකුත් නිලධාරීන් ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථානය විසින් සංවිධානය කළ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වී ඇත. අධ්‍යයනයට භාජනය කළ නිලධාරීන් 04 දෙනෙකු කිසිදු පුහුණුවකට සහභාගී වී නොමැත. ඒ සඳහා හේතු වූ කරුණු විමසීමේ දී පැහැදිලි වූයේ, ඔවුන්ගේ පෞද්ගලික හේතු මත පුහුණුව සඳහා සහභාගී වී නොමැති බව යි.

ඒකක භාර නිලධාරීන් සඳහන් කළ ආකාරයට ලබා දුන් පුහුණුවීම්වල කිසිදු අඩුපාඩුවක් නොමැති අතර, ඔවුන්ට පැවති ගැටලුව වී ඇත්තේ, දින 03 ක් හෝ දින 02 ක් නේවාසිකව පුහුණුවීම් සඳහා වැය කිරීමේ දී කෘෂිකර්ම උපදේශක කාර්යාලය තුළ තමන්ට අදාළ අනෙකුත් රාජකාරිවල ප්‍රගතියක් පෙන්නුම් කිරීමේ අපහසුවක් පැවති බව යි. එසේ ම පුහුණුව ලැබීමෙන් අනතුරුව සයිබර් ඒකකය පවතින කෘෂිකර්ම උපදේශක කාර්යාලයෙන් වෙනත් ප්‍රදේශයකට හෝ රාජකාරියකට මාරු වීම් ලැබීම ද සයිබර් ඒකකයේ සාර්ථකත්වයට බාධාවක් වන බව ද ඔවුහු සඳහන් කළහ.

වර්තමානය වන විට ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථානය විසින් පුහුණුවීම් සංවිධානය කිරීමේ ප්‍රවණතාවය අඩු වී ඇති බව අධ්‍යයනයේ දී පැහැදිලි වූ නමුත් අවශ්‍ය අයෙකුට පුහුණුව ලබා දීමට ශ්‍රව්‍ය-දෘශ්‍ය නිලධාරීන් සූදානම් බව පැහැදිලි විය.

6.7.2. ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථාන මගින් ඒකක වෙත ලබාදුන් උපකරණවල ක්‍රියාකාරීත්වය හා වර්තමාන තත්ත්වය

අධ්‍යයනයේ දී සයිබර් ඒකක සඳහා ලබාදී ඇති පරිගණකය, ස්කෑනර් යන්ත්‍රය, මුද්‍රණ යන්ත්‍ර, ඩිජිටල් කැමරාව, යූ. පී. එස් යන්ත්‍රය, දුරකථනය යනාදී උපකරණයන් හි වර්තමාන තත්ත්වය විමසීමේ දී එයින් එක් උපකරණයක් හෝ දෙකක් හැරුණු විට සෑම ඒකකයකම උපකරණ කිහිපයක් අබලන් තත්ත්වයේ පැවතුණි. ඒකක වෙත ලබා දී පැවති අන්තර්ජාල පහසුකම ද වර්තමානය වන විට සෑම ඒකකයකම ක්‍රියාත්මක තත්ත්වයේ නො පැවතුණි. ඒකක භාර නිලධාරීන් සඳහන් කරන්නේ, පරිගණකය හා සී. ඩී. තැටි පමණක් භාවිතා කරමින් ගොවීන්ට දැනුම ලබාදීමට වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබුවත් පරිගණකය විටින් විට ක්‍රියා විරහිත වීම වැඩසටහන් හි අඛණ්ඩ ගලා යෑමට බාධාවක් වන බව යි. එසේ ම ගොවීන්ගේ උනන්දුව හීනවීමට ද බලපානු ලබන බවයි. උදා: ලෙස හම්බන්තොට දිස්ත්‍රික්කයේ මීගහජඳුර සයිබර් ඒකකය 2005 දී ආරම්භ කර ඇති අතර එහි පරිගණකය 2007 දී ක්‍රියා විරහිත වී ඇත. අනතුරුව නැවතත් 2009 දී ක්‍රියා විරහිත වී ඇත. එවැනි අවස්ථාවල දී පෞද්ගලිකව නිලධාරීන් විසින් අලුත්වැඩියා කරගනු ලබන බවත්, වර්තමානයේ දී පළාත් අධ්‍යක්ෂක කාර්යාලයෙන් දැනුම් දී ඇති පරිදි පරිගණකය නැවත අලුත්වැඩියා කළ නො හැකි බවත් සඳහන් විය. එසේ ම අනුරාධපුර නවනගරය සයිබර් ඒකකයේත් පරිගණකය ක්‍රියා විරහිත වී දැනට වසරක් පමණ ගත වී ඇති නමුත් අලුත්වැඩියාවක් සිදු වී නොමැත. එම පරිගණකය අලුත්වැඩියාව සඳහා දැනට පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂතුමාගේ කාර්යාලයට යවා ඇති බව ඒකක භාර නිලධාරීන් සඳහන් කළහ. එසේ ම කඹුරුපිටිය සයිබර් ඒකකය දැනට වසර එකහමාරක සිට අක්‍රීය තත්ත්වයෙන් පවතින බව ද අනාවරණය විය. මහියංගනය, හෙට්ටිපොල (විල්ගම) යන ඒකකයන් හි ද පරිගණකය ක්‍රියාවිරහිත වී පවතින බැවින් එම ඒකකයන් ද අක්‍රීය තත්ත්වයට පත් වී ඇත.

සයිබර් ඒකකයන්ට ලබා දී ඇති උපකරණවල නඩත්තු කටයුතු පිළිබඳ මුල්කාලීනව ශ්‍රව්‍ය-දෘෂ්‍ය මධ්‍යස්ථානයේ අවධානය යොමු ව පැවතියත් පසුකාලීනව ඒකකය විසින් ම නඩත්තු කටයුතු කරගැනීම සඳහා ඒකකයට බාර දී ඇත. ස්ථාපිත කර ඇති සයිබර් ඒකකයන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ අන්තර් පළාත් යන අංශ තුනට අයත් කෘෂිකර්ම උපදේශක කාර්යාලවල පිහිටුවා ඇති අතර, සයිබර් ඒකක 33ක් ම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම උපදේශක කාර්යාලවලට අයත්වන අතර අන්තර් පළාත් කෘෂිකර්ම උපදේශක කාර්යාලවල සයිබර් ඒකක 20 ක් පිහිටුවා ඇත. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ඒකක 2 ක් පිහිටුවා ඇත (ව්‍යාප්ති සහ පුහුණු අංශයේ සහ විශේෂ ආර්ථික මධ්‍යස්ථානය – දඹුල්ල). මේ අනුව සයිබර් ඒකකයේ පවතින උපකරණයක් ක්‍රියා විරහිතවූ විට නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, හෝ දිස්ත්‍රික් කාර්යාලයට දැන්විය යුතු බවත් අනතුරුව එහි දී උපකරණය අලුත්වැඩියාව සඳහා මුදල් ප්‍රතිපාදන සපයා ගැනීමේ ගැටලු ඇතිවන බවත් එම ක්‍රියාවලින් අවසන් වන විට ඉතා දීර්ඝ කාලයක් ගතවන බවත්, ඒකක භාර නිලධාරීන් විසින් තවදුරටත් සඳහන් කරන ලදී. සමහර අවස්ථාවල දී සයිබර් ඒකකය දිස්ත්‍රික්ක කාර්යාලවලට මාරු කර ඇති බව ද අනාවරණය විය. උදා: ලෙස පොළොන්නරුව දිස්ත්‍රික්කයේ බකමූණ සයිබර් ඒකකය දැනට දිස්ත්‍රික් කාර්යාලය වෙත රැගෙන ගොස් ඇති බව හෙළි විය.

පහත දැක්වෙන්නේ නියැදි සමීක්ෂණයට භාජනය වූ ඒකකයන් හි උපකරණවල වර්තමාන තත්ත්වය යි.

වගු අංක 6.6 : උපකරණවල ක්‍රියාකාරීත්වය

	අනුරාධපුර				හම්බන්තොට			මහනුවර	
උපකරණ	අනුරාධපුර නගරය	ශ්‍රාවස්තිපුර	ජේමඩුව	රාජාංගනය වම් ඉවුර	යෝධකණ්ඩිය	අම්බලන්තොට	මිගහජඳුර	මාරස්සන	පූජාපිටිය
පරිගණකය	අක්‍රිය	ක්‍රියාකාරී	අක්‍රිය	ක්‍රියාකාරී	අක්‍රිය	ක්‍රියාකාරී	අක්‍රිය	ක්‍රියාකාරී	අක්‍රිය
මුද්‍රණයන්ත්‍රය	අක්‍රිය	අක්‍රිය	අක්‍රිය	ක්‍රියාකාරී	අක්‍රිය	ක්‍රියාකාරී	ක්‍රියාකාරී	ක්‍රියාකාරී	ක්‍රියාකාරී
කැමරා	ක්‍රියාකාරී	ක්‍රියාකාරී	ක්‍රියාකාරී	ක්‍රියාකාරී	ක්‍රියාකාරී	අක්‍රිය	අක්‍රිය	ක්‍රියාකාරී	ක්‍රියාකාරී
ස්කෑනර්	අක්‍රිය	අක්‍රිය	ක්‍රියාකාරී	අක්‍රිය	ක්‍රියාකාරී	ක්‍රියාකාරී	අක්‍රිය	ක්‍රියාකාරී	ක්‍රියාකාරී
දුරකථනය	අක්‍රිය	අක්‍රිය	අක්‍රිය	අක්‍රිය	අක්‍රිය	ක්‍රියාකාරී	අක්‍රිය	අක්‍රිය	අක්‍රිය
අන්තර් ජාලය	අක්‍රිය	අක්‍රිය	අක්‍රිය	අක්‍රිය	අක්‍රිය	ක්‍රියාකාරී	අක්‍රිය	අක්‍රිය	අක්‍රිය
යූ පී එස්	අක්‍රිය	ක්‍රියාකාරී	ක්‍රියාකාරී	ක්‍රියාකාරී	අක්‍රිය	ක්‍රියාකාරී	අක්‍රිය	ක්‍රියාකාරී	අක්‍රිය

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, (2010).

ඉහත වගුව තුළින් පැහැදිලි වන ආකාරයට නියැදි සමීක්ෂණයට භාජනය වූ අම්බලන්තොට, මාරස්සන පූජාපිටිය වැනි ඒකකයන් හි උපකරණවල ක්‍රියාකාරී තත්ත්වය සාපේක්ෂ ව අනෙකුත් ඒකකයන් ට වඩා ඉහළ

මට්ටමකින් පවතින බව පෙනී යයි. එයට හේතු වී ඇති කරුණු පිළිබඳ විමසීමේ දී ඒකක භාර නිලධාරීන් සඳහන් කළේ, යම් යම් රාජ්‍ය නො වන සංවිධාන හරහා නව උපකරණ හෝ වෙනත් සහයෝගයන් ඔවුන් ලබා ගන්නා බව යි. උදාහරණයක් ලෙස අම්බලන්තොට සයිබර් ඒකකයේ ඩිජිටල් කැමරාව යම් කිසි හේතුවක් මත අස්ථානගත වී ඇති නමුත් "කෙයා" නැමති රාජ්‍ය නො වන සංවිධානය විසින් නැවත ඩිජිටල් කැමරාවක් සයිබර් ඒකකය වෙත ලබා දීමට කටයුතු කර ඇත. සයිබර් ඒකකයන් හි ක්‍රියාකාරීත්වය රඳා පැවතීමට බොහෝ විට ඒකක භාර නිලධාරීන්ගේ මහජන සම්බන්ධතාවය ගොඩනගා ගැනීමේ හැකියාවත්, සහයෝගය ලබා ගැනීමේ හැකියාවත් ඉවහල්වන බව පෙනී යයි. සමීක්ෂණ අවධියේ දී ක්‍රියාත්මකව පැවතියත් නැවතත් එම උපකරණ ක්‍රියාවිරහිත වුව හොත් අලුත්වැඩියාව සඳහා පැහැදිලි ක්‍රමවේදයක් නොමැති බව ඒකක භාර නිලධාරීන් වැඩිදුරටත් සඳහන් කළහ. ඒ අනුව සයිබර් ඒකකවලට අයත් උපකරණ දිගින් දිගට ම සක්‍රිය මට්ටමින් පවත්වා ගැනීමට ක්‍රමවේදයක් නොමැති වීම සයිබර් ඒකකයන් හි සාර්ථකත්වයට සෘජුව ම බලපාන බව පැහැදිලි විය.

6.8 ග්‍රාමීය කෘෂි ව්‍යාප්තිය සඳහා සයිබර් ව්‍යාප්ති ඒකකයන් හි දායකත්වය

සයිබර් ව්‍යාප්ති ඒකක ක්‍රියාත්මක කිරීම ග්‍රාමීය කෘෂිකාර්මික ව්‍යාප්ති සේවයට යම් කිසි පිටුවහලක් වේද? යන්න පිළිබඳව ඒකක භාර නිලධාරීන්ගෙන් විමසන ලදු ව, ඔවුන්ගේ ප්‍රතිචාර අනුව පෙනී ගියේ, ව්‍යාප්ති සේවයේ දැනට පවතින අකාර්යක්ෂමභාවය අවම කිරීමට මෙවැනි ඒකකයක් ග්‍රාමීය මට්ටමේ පිහිටුවීම පිළිබඳ සංකල්පය ඉතාමත් උචිත හා කාලීනභාවයෙන් යුක්ත බව යි. නියැදියට අයත් වූ ඒකක භාර නිලධාරීන්, තැපැල් මාර්ගික සමීක්ෂණයට තොරතුරු සැපයූ ඒකක භාර නිලධාරීන් සහ දුරකථන මාර්ගයෙන් සාකච්ඡා කළ නිලධාරීන්, ඇතුළුව සියලු ම ඒකක භාර නිලධාරීන් මෙම අදහස සනාථ කිරීම සඳහා පහත සඳහන් ප්‍රධාන කරුණු ඉදිරිපත් කළ හ.

01. පැරණි ගොවීන් හට යම් පෙළඹවීමක් ඇති කළ හැක්කේ ඇසට පෙන්වීම හරහා බැවින් සයිබර් ඒකකය ඒ සඳහා උචිත මෙවලමක් වීම.

02. තරුණ පරපුරට අයත් ගොවීන්ට කෘෂි ක්ෂේත්‍රය පිළිබඳ ව යම් පෙළඹවීමක් ඇති කළ හැක්කේ සාම්ප්‍රදායික ක්‍රමවේදයන්වලින් බැහැර වූ නවීන ක්‍රමෝපායයන් භාවිතා කිරීම හරහා බැවින් ඒ සඳහා ද සයිබර් ඒකකය උචිත මෙවලමක් වීම.

03. ඉහත කරුණු දෙක ම හේතුවෙන් නිලධාරීන්ට ඉතාමත් පහසුවෙන්, කාර්යක්ෂම ව හා ඵලදායක අයුරින් ව්‍යාප්ති කාර්යභාරය ඉටු කිරීමේ හැකියාව ලැබීම.

එසේ වුවත් නවීන ආකාරයෙන් කෘෂිකාර්මික තොරතුරු හා දැනුම ලබා දීමට ග්‍රාමීය මට්ටම කරා ප්‍රවේශ කර වූ සයිබර් ඒකක පිහිටුවීමේ මෙම සංකල්පය ප්‍රායෝගික ව ක්‍රියාත්මක කිරීමේ දී පැන නැගෙන පොදු දුර්වලතා හා දුෂ්කරතාවන් හේතුවෙන් වර්තමානය වන විට සයිබර් ඒකකයන් හරහා සමස්ත ව්‍යාප්ති සේවය සැපයීමේ කාර්යභාරයට සැලකිය යුතු මට්ටමේ දායකත්වයක් නො ලැබෙන බව නිලධාරීන්ගේ අදහස විය. එසේ ම නිලධාරීන් විසින් පෙන්වා දුන් පරිදි සයිබර් ඒකකයන් හි ක්‍රියාකාරීත්වය අඩපණ වීම කෙරෙහි සෘජුව

ම බලපානු ලැබූ දුර්වලතාවයන් පහත පරිදි පෙළගැස්විය හැකි අතර එම දුර්වලතාවයන් මගහරවාගනිමින් පැහැදිලි ක්‍රමවේදයක් අනුගමනය කළ හොත් මෙම සංකල්පය ග්‍රාමීය මට්ටමේ ව්‍යාප්ති සේවයෙ හි කාර්යක්ෂම භාවය ඉහළ මට්ටමකට ගෙන ඒමට සුදුසු ප්‍රායෝගික වටිනාකමකින් යුක්ත සංකල්පයක් වන බව අධ්‍යයනයේ දී පැහැදිලි විය.

පහත දැක්වෙන්නේ ඒකක භාර නිලධාරීන් විසින් සඳහන් කළ සයිබර් ඒකකවල ක්‍රියාකාරීත්වය අඩපණ වීමට බලපෑ ප්‍රධාන හේතු වේ.

01. විවිධ ව්‍යාපෘතීන් හා ආයතනයන්ගේ මූල්‍ය ප්‍රතිපාදන මත සයිබර් ඒකක ආරම්භ කළ ද එහි ක්‍රියාකාරීත්වයේ දී පහළ මට්ටමේ සිට ඉහළට ගමන් ගන්නා වූ සම්බන්ධතාවයක් (ක්‍රියාත්මක කිරීම, මූල්‍ය ප්‍රතිපාදනයන් අඛණ්ඩව සැපයීම, නඩත්තුව හා අලුත්වැඩියාව පිළිබඳ වූ ක්‍රමවේදයන්) හා සන්නිවේදනයක් නොමැති වීම.

02. සයිබර් ඒකකයේ ක්‍රියාකාරීත්වය හා ප්‍රගතිය අධීක්ෂණය කිරීමට භාර වූ ඉහළ නිලධාරියෙකු නොමැති වීම.

03. සයිබර් ඒකක භාර නිලධාරීන් බහුතරයකට පරිගණකය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොමැති වීම සහ පරිගණක ක්ෂේත්‍රය පිළිබඳ ධනාත්මක ආකල්පයක් නොමැති වීම.

04. සයිබර් ඒකකය ස්ථාපිත කර ඇත්තේ සයිබර් උපකරණ තබා ගැනීමට හා එයින් සේවය සැපයීමට සුදුසු පරිසරයක් සහිත ස්ථානයක නො වීම.

හත් වැනි පරිච්ඡේදය
නිගමන හා යෝජනා

ග්‍රාමීය ගොවි ප්‍රජාවගේ කෘෂිකාර්මික තොරතුරු හා දැනුම පිළිබඳ වූ අවශ්‍යතාව සපුරාලීම සඳහා තොරතුරු හා සන්නිවේදන ක්‍රමෝපායයන් භාවිතා කරමින් 2004 වර්ෂයේ දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රව්‍ය-දෘශ්‍ය මධ්‍යස්ථානය විසින් සයිබර් ව්‍යාප්ති ඒකක ස්ථාපිත කරන ලදී. කලාප හා ගොවිජන සේවා මට්ටමින් දිස්ත්‍රික්ක 21 ක් තුළ සයිබර් ව්‍යාප්ති ඒකක 55 ක් ස්ථාපිත කර ඇත. ගොවිජන සේවා මධ්‍යස්ථානයේ, කෘෂිකර්ම උපදේශක කාර්යාලය තුළ මෙම ඒකකයන් ස්ථාපිත කර ඇති අතර, ඒකකය පවත්වාගෙන යනු ලබන්නේ කෘෂිකර්ම උපදේශකවරයා විසිනි. ඒකකය භාර කෘෂිකර්ම උපදේශකවරයාට සහ ඒකකයට අදාළ ව තවත් කෘෂිකර්ම උපදේශකවරයෙකුට පරිගණක සාක්ෂරතාවය පිළිබඳ ශ්‍රව්‍ය–දෘශ්‍ය මධ්‍යස්ථානය මඟින් පුහුණුවීම් ලබා දී ඇති නමුත් වර්තමානයේ දී පුහුණුවීම් ලබා දීමේ ප්‍රවණතාවය ක්‍රමයෙන් අඩු වී ගෙන ගොස් ඇත. ඒකකයෙ හි ප්‍රගතිය ඇගයීමේ මාසික වැඩපිළිවෙළක් මුල්කාලීන ව ක්‍රියාත්මක වී ඇත. වර්තමානයේ එය ඵලදායක ලෙස ක්‍රියාත්මක නො වන බව පෙනුණි.

ධාන්‍යාගාර වැඩසටහන, කාප් ආයතනය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය, ජාත්‍යන්තර සහල් පර්යේෂණ ආයතනය, ජයිකා ආයතනය, වර්ල්ඩ් විෂන් යන ආයතනයන්ගේ මූල්‍ය දායකත්වය මත සයිබර් ව්‍යාප්ති ඒකක ස්ථාපිත කර ඇත. 2004 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා ම වරින් වර සයිබර් ව්‍යාප්ති ඒකක ස්ථාපිත කෙරී ඇති බවත්, උතුරු නැගෙනහිර පළාත් හි නව සයිබර් ඒකක ස්ථාපිත කිරීමේ වැඩ පිළිවෙළක් සැලසුම් කොට තිබෙන පවතින බවත් සාහිත්‍ය විමර්ශනයේ දී හෙළි විය.

සයිබර් ඒකක හරහා ගොවීන්ට ක්ෂේත්‍ර මට්ටමේ පුහුණු වැඩසටහන් පැවැත්වීමත්, ඒකකය තුළ දී පුහුණුව ලබා දීමත් ප්‍රධාන වශයෙන් සිදු කර ඇති අතර ඊට අමතර ව ඒකක භාර කෘෂිකර්ම උපදේශකවරයාගේ ව්‍යාප්ති කාර්යය පහසු කරගැනීමට අවශ්‍ය පවර් පොයින්ට් ඉදිරිපත් කිරීම්, දැනුවත් කිරීමේ අත්පත්‍රිකා සහ රාජකාරී මට්ටමේ ලිපි ලේඛන සකස් කිරීම් සිදු කෙරී ඇත.

සයිබර් ඒකක ස්ථාපිත කිරීම පිළිබඳවත් එයින් අවශ්‍ය දැනුම හා තොරතුරු ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳවත් ගොවීන්ගේ දැනුවත්භාවය ඉතා පහළ මට්ටමක පැවති නමුත් ඒ පිළිබඳව දැනුවත් වී සේවය ලබා ගත් ගොවීන් තම වගාවන් හි අස්වැන්න ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව වර්ධනය කරගැනීමට ඒකක හරහා ලැබුණු දැනුම භාවිතා කර ඇත.

එසේ වුවත්, ගොවීන්ට සයිබර් ඒකක හරහා සේවය ලබා ගැනීමේ දී බොහෝ ගැටලු හා දුෂ්කරතාවන් පවතින බව අධ්‍යයනයේ දී අනාවරණය විය. එසේ ම සේවය සැපයීමේ කාර්යයේ දී ඒකකභාර නිලධාරීන් ද විවිධ දුෂ්කරතාවලට මුහුණ දෙමින් එම කාර්යය සිදු කර ඇති බව පැහැදිලි විය.

ග්‍රාමීය ගොවීන් හට දැනුම හා තොරතුරු කඩිනමින් ලබා ගැනීමේ පහසුව ඇති කිරීම සඳහා සයිබර් ඒකක පිහිටුවීමේ සංකල්පය ඉතා සාර්ථක ප්‍රයත්නයක් බව අධ්‍යයන දත්ත පැහැදිලි කරයි. නමුත් සයිබර් ඒකක ක්‍රියාත්මක කිරීමේ දී ඒ පිළිබඳ ගොවීන් දැනුවත් කිරීම සම්බන්ධයෙන් හා පරිපාලනමය වශයෙන් පවතින

ගැටලු සහගත තත්ත්වයන් හේතුකොට ගෙන එය සාර්ථක ව ක්‍රියාත්මක කරගෙන යෑමට අපහසුකාරී තත්ත්වයක් උදාකර ඇත. පර්යේෂණ කණ්ඩායමේ නිරීක්ෂණ හා සාකච්ඡාමය දත්තවලින් ද පැහැදිලි වූයේ, ප්‍රතිපාදනයන් වෙන් කරගැනීමේ අපහසුතා වැනි පරිපාලනමය දුෂ්කරතා නිසා මෙය අසාර්ථක අන්දමින් ක්‍රියාත්මකව පවතින වැඩසටහනක් බව ය.

ඒකකභාර නිලධාරීන්ගේ පවතින උනන්දුව, කැපවීම, පරිගණක සාක්ෂරතාව හා ක්ෂේත්‍රයට අදාළ නිලධාරීන් හා සම්බන්ධ වී සහයෝගය ලබා ගැනීමේ හැකියාව යන කරුණු හේතුකොට ගෙන සයිබර් ඒකක සුළු ප්‍රමාණයක් යම් තරමක හෝ සාර්ථකත්වයකට ඒමට උත්සාහ දරා ඇති නමුත් සමස්තය විමසීමේ දී සයිබර් ව්‍යාප්ති ඒකකයන් හි ක්‍රියාකාරිත්වය අසාර්ථක ය. කෙසේ වුව ද වර්තමානයේ සියලු ක්‍රියාකාරකම් තොරතුරු හා දැනුම මත පදනම් ව සිදු කෙරෙන බැවින් ග්‍රාමීය කෘෂිකාර්මික ක්ෂේත්‍රයට ද කඩිනම් තොරතුරු සැපයීමක් හරහා වෙළෙඳපළ වෙත යොමු වූ කෘෂිකර්මාන්තයක් වෙත ගොවීන් ළඟා කරවීමේ කාර්යයට මෙම සයිබර් ඒකක වඩාත් උපකාරී වනු ඇතැයි අධ්‍යයනය තුළින් නිගමනය කළ හැකි ය. පහත සඳහන් අධ්‍යයනයේ ප්‍රධාන සොයා ගැනීම් විමර්ශනය කිරීමේ දී එය තවදුරටත් තහවුරු වේ.

- සයිබර් ඒකක හරහා සේවය ලබා ගැනීමට යොමු වූ කණ්ඩායමෙන් බහුතරය (82.3%) අයත් වූයේ, වයස අවු. 30-60 අතර වයස් කාණ්ඩයට වේ. එයිනුත් වයස අවු. 45-60 අතර වයස් කාණ්ඩයට අයත් ගොවීන් වැඩි නැඹුරුවක් දක්වා ඇත. එය 43%කි. වයස අවුරුදු 30ට අඩු තරුණ කණ්ඩායම මේ සඳහා යොමු වීම පහළ මට්ටමක පවතී. එය නියැදියෙන් 4.4% කි.

- අධ්‍යයනයට තෝරා ගනු ලැබූ සමස්ත ගොවි නියැදියෙන් 59%ක් පුරුෂයින් වූ අතර 41%ක් ස්ත්‍රීන් විය. ඉන් සයිබර් ඒකක හරහා සේවය ලබාගත් ගොවි නියැදිය, පුරුෂයින් 49%ක් ලෙසත් ස්ත්‍රීන් 51%ක් ලෙසත් ව්‍යාප්තව සිටින ලදී, සේවය ලබා නො ගත් ගොවි නියැදියේ, 68%ක් පුරුෂයින් වූ අතර 32%ක් ස්ත්‍රීන් විය.

- නියැදි සාමාජිකත්වය අ.පො.ස. (සා/පෙළ) සිට උපාධිය දක්වා වූ විශාල පරාසයක් තුළ අධ්‍යාපනික සුදුසුකම්ලාභීන්ගෙන් සමන්විත විය. සමස්ත නියැදියෙන් අ.පො.ස. (සා/පෙළ) දක්වා උගත් පිරිස 64.6%කි. සේවය ලැබූ ගොවීන්ගෙන් 53.3%ක් ද සේවය නො ලැබූ ගොවීන්ගෙන් 76.0%ක් ද ඊට අයත් ය. සේවය ලැබූ ගොවි නියැදියේ 21.1%ක් අ.පො.ස. (උ/පෙළ) සමතුන් වන අතර, ඩිප්ලෝමාලාභීන් දෙදෙනෙක් සහ එක් උපාධිධාරියෙක් එම කණ්ඩායමට අයත් විය.

- සමස්ත ගොවි නියැදියෙන් 70%ක් වසර 10ට වැඩි කාලයක් තිස්සේ ගොවිතැනෙ හි නියැළී ඇත. වසර 40ට වඩා වැඩි කාලයක් තිස්සේ ගොවිතැනෙ හි නියැලුණු ගොවි ප්‍රතිශතය සමස්ත නියැදියෙන් 2%කි.

- සමස්ත නියැදියෙන් 70.2%ක ගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය ගොවිතැන වී ඇත. සයිබර් ඒකක හරහා සේවය ලබාගත් ගොවි නියැදිය පිළිබඳ පමණක් සැලකිල්මත් වීමේ දී ඉන් 15.6%ක් රජයේ රැකියාවන් හි නියුක්ත වී ඇත.

- සයිබර් ඒකක හරහා සේවය ලබා ගත් ගොවීන්ට මෙන් ම සේවය ලබා නො ගත් ගොවීන්ට ද කෘෂිකර්මාන්තයේ යෙදීමේ දී පවතින ගැටලු අතර ප්‍රධාන වී ඇත්තේ සත්ව හානි (අලි, වඳුරු වැනි) පිළිබඳ ගැටලුව යි. එය සමස්ත නියැදියෙන් 77.3% කි. ඊට අමතර ව, ජල කළමනාකරණය (70.7%), නිෂ්පාදන සාධාරණ මිලකට අලෙවි කිරීමට අලෙවි මාර්ග සොයා ගැනීමේ ගැටලුව (66.2%), වගාවන් සඳහා නිසි ප්‍රමිතියක් සහිතව යෙදවුම් භාවිතා කිරීමට ඇති නොදැනුවත්භාවය (64%), යෙදවුම් නියමිත කාලය සපයා ගැනීමට නො හැකි වීම (60.7%), වගා භූමිවල සාරවත්භාවය අඩුවීම (62.0%) සහ කාලීන ව කෘෂිකර්මාන්තය තුළ සිදුවන නවතාවයන් පිළිබඳ දැනුම ලබා ගැනීමේ මාර්ග නොමැති වීම (59.6%) වැනි ගැටලු ද පවතී.

- කෘෂිකර්මාන්තයේ යෙදීමේ දී ගොවීන්ට පවතින පොදු ගැටලු සඳහා විසඳුම් ලබා ගැනීමේ දී සමස්ත නියැදියෙන් 57.4%ක් ම ගොවිජන සේවා මධ්‍යස්ථානයේ නිලධාරීන්ගෙන් එම සේවාව ලබා ගෙන ඇත.

- සේවය ලබා නො ගත් ගොවීන්ගෙන් 58%ක්, ගොවිජන සේවා මධ්‍යස්ථානයේ කෘෂිකර්ම උපදේශක කාර්යාලය තුළ සයිබර් ව්‍යාප්ති ඒකකයක් පිහිටුවා ඇති බව නො දනිති. සයිබර් ඒකකයක් පිහිටුවා ඇති බවට දැනුවත්ව සිටින පිරිස පමණක් සැලකීමේ දී (42%) ඔවුන්ගෙන් 68.4%ක් එයින් තම ගොවිතැන් කටයුතු සඳහා සේවාවක් ලබා ගත හැකි බව නො දනිති.

- ඒකකය භාර කෘෂිකර්ම උපදේශකවරයා විසින් සයිබර් ඒකකය තුළත්, ක්ෂේත්‍රය තුළත් ඒකකයට අයත් උපකරණ භාවිතා කරමින්, ගොවීන් සඳහා පුහුණු වැඩසටහන් සිදු කර ඇති අතර ඒකක හරහා සේවය ලබා ගත් ගොවීන්ගෙන් 69%ක් ඒකකය තුළ පැවැත් වූ පුහුණුවීම් සඳහා සහභාගී වී ඇත.

- සයිබර් ඒකක හරහා ලබා ගත් දැනුම හේතු කොට ගෙන එහි සේවය ලබා ගත් ගොවීන්ගෙන් 68% ට ගොවිතැන් කටයුතුවල ක්‍රමානුකූලව නියැළීම හේතුවෙන් අස්වැන්න ගුණාත්මයෙන් හා ප්‍රමාණයෙන් වැඩිකර ගැනීමේ හැකියාව ලැබී ඇත.

- දැනුම හා තොරතුරු ලබා ගත් ක්ෂේත්‍රයන්ගෙන් ගොවීන්ට වඩාත් ප්‍රයෝජනවත් වී ඇත්තේ, පලතුරු වගාව (33.3%), ගෙවතු වගාව (16.6%), එළවළු වගාව (15.6%), වී වගාව (14.4%) සහ කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය (10%) පිළිබඳ දැනුම් ක්ෂේත්‍රයන් වේ.

- සයිබර් ඒකකයට පැමිණෙන විට ඒකක භාර කෘෂිකර්ම උපදේශක මහතුන් ක්ෂේත්‍ර රාජකාරි කටයුතුවල නියුක්ත වී සිටීම ගොවීන්ගෙන් 51%කට ගැටලුවක් වී ඇත.

- සේවය ලබා දීමේ දී නිලධාරීන්ගෙන් 85.7%කට ඒකකය සඳහා පූර්ණකාලීන ව වෙන් වූ නිලධාරියෙකු නොමැති වීම ගැටලුවක් වී ඇති අතර සයිබර් ඒකක අසාර්ථක ව ක්‍රියාත්මක වීමට මෙම ගැටලුව සෘජුව ම බලපා ඇත.

- ඒකකයක් වෙත ලබා දී ඇති උපකරණ වරින්වර ක්‍රියාවිරහිත වන අතර, අලුත්වැඩියාව හා නඩත්තුව පිළිබඳ පැහැදිලි ක්‍රමවේදයක් නො පවතී. එය ඒකකයන් හි අසාර්ථකත්වයට බලපෑ තවත් හේතුවකි.

- සයිබර් ඒකක භාර සමස්ත නිලධාරීන්ගේ මතය වූයේ සයිබර් ඒකකයන් හි වර්තමාන ක්‍රියාකාරීත්වය අසාර්ථක බව යි. නිලධාරීන්ගෙන් 64.6%ක් එම මතය තහවුරු කළහ.

- ඒකකය පිළිබඳ ගොවීන් තුළ පවතින අඩු දැනුවත්භාවය නිසා ගොවීන්ගේ සහභාගිත්වය අඩුවීම අසාර්ථකත්වයට බලපෑ ප්‍රධාන හේතුව බව අසාර්ථක යැයි සඳහන් කළ ඒකක භාර නිලධාරීන්ගෙන් 96.7%ක් සඳහන් කළහ.

- සයිබර් ඒකකයන් හි සාර්ථක/අසාර්ථකභාවය නීර්ණය වීමට ඒකක භාර නිලධාරීන්ගේ සේවා කාලය හා පළපුරුද්ද බලපාන සාධකයක් නොවී ඇත.

- ග්‍රාමීය මට්ටමේ ව්‍යාප්ති සේවය සැපයීමේ කාර්යයට පිටුවහලක් සපයාගැනීමේ අරමුණු සාක්ෂාත් නො වීමට ඒකක ක්‍රියාකාරීත්වයේ දී පැවති ගැටලු හා දුර්වලතාවයන් හේතුපාදක වී ඇත.

- ගොවීන්ගේ සහ නිලධාරීන්ගේ අදහස් පිළිබඳ සැලකිලිමත් වීමේ දී පෙනී යන්නේ සයිබර් ඒකකයන් පිළිබඳ ගොවීන්ගේ දැනුවත්භාවය වැඩිකර පරිපාලනමය ගැටලු අවමකර ඒකක සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම හරහා සයිබර් ඒකක සාර්ථක ව ක්‍රියාත්මක කළ හැකි බව යි.

යෝජනා

සයිබර් ඒකකයන් හි වර්තමාන ක්‍රියාකාරීත්වය හා ප්‍රගතිය සම්බන්ධයෙන් සිදු කෙරුණු අධ්‍යයනයෙන් ලද මූලික සොයාගැනීම් හරහා ලද නිගමනයන්ට අනුව මෙම ඒකකයන් හි ක්‍රියාකාරීත්වය සාර්ථක කරගැනීම සඳහා පහත සඳහන් මූලික නිර්දේශයන් ඉවහල් වනු ඇත.

01. කෘෂි ව්‍යාප්ති සේවයේ පවතින දුර්වලතා මගහැර ගොවියාට මහත් වූ සේවාවක් සිදුකිරීමට හැකි ස්ථානයක් ලෙසින් සයිබර් ඒකක හඳුන්වාදිය හැකි ය. එම නිසා ක්‍රියාකාරීත්වයේ පවතින ප්‍රායෝගික ගැටළු මගහරවා සාර්ථක ක්‍රමවේදයක් තුළින් නව ආකාරයකින් එය හඳුන්වා දී ගොවීන් අතර ජනප්‍රිය කළ යුතු ය. මේ සඳහා,

    - ප්‍රචාරණය සඳහා විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය උපයෝගී කරගැනීම. මෙහි දී වර්තමානයේ වඩාත් ජනප්‍රිය වූ එෆ්.එම් ගුවන්විදුලි නාලිකා ඔස්සේ නිරන්තරයෙන් විකාශනය වන පරිදි දැන්වීම් පළ කිරීම හා පුවත්පත්හි කෘෂිකාර්මික අතිරේකයන් හි සයිබර් ඒකකයන් ක්‍රියාත්මක කිරීමේ අරමුණ හා එයින් සිදු වන සේවය පිළිබඳ ලිපි පළ කිරීම.

- පාසල් ළමුන් දැනුවත් කිරීම මඟින් එකී පණිවුඩය ගොවි පවුල්වලට ගෙන යාම.

- සයිබර් ඒකකයන් හි ප්‍රයෝජනවත්භාවය පිළිබඳ ව්‍යාප්ති නිලධාරීන් හරහා ගොවීන් දැනුවත් කිරීම. මෙහි දී ගොවි ප්‍රජාව සමග වැඩි සම්බන්ධතා ගොඩනගාගෙන ඇති ගොවීන් තෝරාගෙන එම ගොවීන් හරහා මේ පිළිබඳ ප්‍රචාරණය කළ හැකි ය.

- ග්‍රාමීය මට්ටමේ පොදු ස්ථානයන් හි (ආගමික සිද්ධස්ථාන, ප්‍රජාශාලා, ග්‍රාමීය රෝහල්, ග්‍රාමීය සායන මධ්‍යස්ථාන) දැන්වීම් පත්‍රිකා සහ පෝස්ටර් මඟින් ප්‍රචාරණය කිරීම.

- බීජ හා රෝපණ ද්‍රව්‍ය, පොහොර ලබා දීමේ අවස්ථාවන් උපයෝගී කරගෙන ගොවීන් දැනුවත් කිරීම.

- ග්‍රාමීය මට්ටමේ ස්වේච්ඡා සංවිධාන හරහා සයිබර් ඒකක පිළිබඳ ගොවීන් දැනුවත් කිරීම. උදා : කාන්තා සමිති, තරුණ සමිති, මරණාධාර සමිති උපයෝගි කරගැනීම.

02. ගොවීන්ට මෙන් ම නිලධාරීන්ට ද පහසුවන සේ සයිබර් ඒකකය සඳහා ම වෙන් වූ කෘෂිකාර්මික හා පරිගණක දැනුම සහිත පුද්ගලයෙකු පත් කිරීම. පත් කරන නිලධාරියාට පරිගණක ක්ෂේත්‍රය පිළිබඳ පරිපූර්ණ (දෘඩකාංග හා මෘදුකාංග පුහුණුව සහිත) පුහුණුවක් ලබා දිය යුතු ය.

03. සයිබර් ඒකකවල උපකරණ අලුත්වැඩියාව සහ වෙනත් නඩත්තු කටයුතු ක්‍රමානුකූලව සිදුකෙරෙන ආකාරයේ විධිමත් යාන්ත්‍රණයක් සකස් කිරීම. මේ සඳහා ඉහළ නිලධාරියෙකුගේ අධීක්ෂණය සහිත කඩිනම් ප්‍රතිපාදන වෙන් කරගත හැකි පැහැදිලි ක්‍රමයක් සකස් කිරීම.

04. සයිබර් ඒකකය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම හරහා ගොවියාට ඉතාමත් පහසුවෙන් පරිහරණය කළ හැකි මෙන් ම ඒකකය හා සමග සමීප සබඳතාවයක් ගොඩනගා ගත හැකි මට්ටමේ ස්ථානයක් (farmer friendly) බවට සයිබර් ඒකකය සකස් කිරීම.

- මේ තුළින් තරඟකාරී හා සංකීර්ණ සමාජයක වෙසෙන ගොවියාට අවශ්‍ය නව තාක්ෂණය, දැනුම හා තොරතුරු ලබා දීම හරහා ග්‍රාමීය ගොවියා බලගැන්වීමේ කාර්යයට ප්‍රවේශයක් ලෙස සයිබර් ඒකකය භාවිතා කිරීමේ හැකියාව ලැබේ.

05. සයිබර් ඒකකය හරහා දෛනික වෙළෙඳපොළ මිල ගණන් හා මිල තත්ත්වයන් හඳුනා ගැනීමට ගොවීන්ට පහසුකම් සැලසීමේ ඒකකයක් බවට පත් කිරීම. මෙතුළින් දේශියව පවතින වෙළෙඳපොළ ඉල්ලුමත් අපනයන සඳහා සුදුසු වෙළෙඳපොළ හඳුනාගැනීමේ පහසුවත් ඇති වේ.

- බහුතරයක් ගොවීන්ට ජංගම දුරකථන හිමිකම ඇති බැවින් ඒ හරහා මධ්‍යස්ථානයට ඔවුන්ගේ කෙටි/ක්ෂණික ගැටලු ඉදිරිපත් කර පිළිතුරු ලබා ගැනීමේ හැකියාව ඇති කිරීම.

ආශ්‍රිත ග්‍රන්ථ

01. Abdon, B.R. and Robert, T.R. (2004), *Knowledge Sharing and Distance Learning for Sustainable Agriculture in the Asia pacific Region :The Role of the Internet (Online),* Available: http://www.cropscience.org.au (06 Oct. 2009).

02. *Agriculture Extension (Online*), Available: http://en.wikipedia.org.

03. Ahammed, M.A. (2006), *ICT in Indian Agriculture ICTS Catalyse the Rural and Farm Economy (Online), Available:* http://tech.groups.yahoo.com (29 oct.2009).

04. Anon, (2006), *Information Technology an its Impact on Agriculture in India* (*Online)*, Available: http://www.asianlaws.org (7 sep. 2010).

05. Bogahawatta, M. (1994), *Agricultural Extension Systems in Asia and the Pacific, Sri Lanka*, Asia Productivity Organization,Tokyo.

06. Central Bank of Sri Lanka (2008), *Annual Report*, Central Bank of Sri lanka, Colombo.

07. "Creating Sustainable Livelihood for the Rural Poor: What we doing Sri Lanka (Online)", Available:http://ruralnic.in (07 Oct 2009).

08. Dissanayake, D.M.L.B. (2007), *Awareness and Effectives of 1920 Service of Department of Agriculture in Anuradhapura District*, Faculty of Agriculture, University of Rajarata.

09. "e-Sri Lanka: What is in it for Agriculture (Online)", Available: http://www. telecentrecommunity.ning.com (19 oct 2009).

10. Hemarathna, N.A.R.V.M., *et al* (2008), *ICT and the firm: Assessing the trends and perspectives in the cooperate tea sector in Sri lanka*, Faculty of Agricultural and Plantation Management, University of Wayaba, Makandura.

11. "Information and Communication Technology for Food Security and Sustainable Agriculture in the Knowledge Economy", Economic and Social Commision for Asia and Pacific (Online), Available: http://www.comminit.com (06 oct 2009).

12. "Information and Communication Technologies for Sharing of Agriculture Information in Rural India. (Online), Available : http://www.comminit.com (29 oct. 2009).

13. Jayathilaka, H.A.C.K.,*et al* (2006), *ICT Adoption and its' Implications for Agriculture in Sri Lanka* (Online), Available: http://www.apdip.net .com. (07 sep. 2010).

14. *Joint National Conference on Information Technology in Agriculture* (*Online*), Avallabe: http://www.itfac.mrt.ac.lk , (13 oct. 2009).

15. LEISA (2002), *Connecting Rural Communities in India* , Vol. 18, No. 02.

16. Mahaliyanaarachchi, R.P. (2003), *Basics of Agricultural Extension*, Chathura Printers, Wellampitiya.

17. Mahinda Chinthanaya (2010), *Vision for the Future, A Brighter Future*, Presidential Election.

18. Rupasena, L.P.,*et al* (2007), *Agricultural Marketing Information Systems-Case Study in Matale District*, HARTI, Colombo 07.

19. Rusten, Eric, *et al* (2003), "Future Direction in Agriculture and Information and Communication Technologies (ICTS)" USAID Background Paper, USAID,WINROCK International.

20. Taragola, N. and Gelb, E. (2005), *Information and Communication Technology Adaption in Horticulture:A Comparison to the EFITA Baseline (Online)*, Available: http://departments.agri.huji.ac.il/economics/gelb-hort (7 sep. 2010).

21. Weerathunga, D.B. (2001), "Agricultural Extension Service in Sri Lanka, Agricultural Research and Extension System in SAARC Countries", SAARC, Agricultural Information Centre.

22. Wijekoon, R, *et al* (2009), "ICT Intiative for Agriculture Extension of the Department of Agricultural Extension: Meeting Farmer Needs", Proceedings of the Agricultural Extension Conference 27-28 August 2009", Plant Genetic Resource Centre, Peradeniya.

23. Withanage, Dilanthe (2003), "e-Sri Lanka: The use of ICTS for Poverty reduction" ICT Agency of Sri Lanka" (Online), Available: http.//www.unescup.com (06 oct 2009).

24. "Role of Information Technology in Agriculture" (Online), Available: http://www.sundaytimes.lk (13 oct. 2009).